

2023

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

ANNUAL REPORT

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය කොළඹ විශ්වවිද්‍යාලය

உயிர் இரசாயனவியல், மூலக்கூற்று உயிரியல் மற்றும் உயிர் தொழில்நுட்பவியல் நிறுவகம், கொழும்பு பல்கலைக்கழகம்

Institute of Biochemistry, Molecular Biology & Biotechnology (IBMBB)

University of Colombo


ආවර්ජනා

2023

ජෛවරසායන, අණුක ජෛවවේද හා
ජෛවතාක්ෂණ ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය













දැක්ම

“අණුක ජීව විද්‍යා
ක්ෂේත්‍රයෙහි අන්තර්ජාතික විශිෂ්ඨ
කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම”

මෙහෙවර

ඇරඹුම

ප්‍රවර්ධනය

ජාතික සහ අන්තර්ජාතික
සංවර්ධනය
ළඟා කර ගැනීම උදෙසා
අණුක ජෛව විද්‍යාවන්හි
උසස් පර්යේෂණ සහ
මානව සම්පත්
සංවර්ධනය

සුසාධ්‍යකරණය

අරමුණු සහ ඉලක්ක

I අරමුණ අණුක ජෛවවේදය සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍ර තුළ උසස් තත්ත්වයේ ජාත්‍යන්තර පිළිගැනීමක් සහිත අභ්‍යාසලාභීන්, උපාධිධාරීන් සහ පශ්චාත් උපාධිධාරීන් බිහි කිරීම

ඉලක්ක

- 1.1 නව වැඩසටහන් හඳුන්වා දීම සහ පශ්චාත් උපාධි මට්ටමේ පවතින වැඩසටහන්වල පූර්ණ ධාරිතාවය පවත්වා ගැනීම
- 1.2 වර්තමාන දේශීය හා ගෝලීය අවශ්‍යතා සපුරාලන නව ප්‍රථම උපාධි පාඨමාලා ස්ථාපිත කිරීම
- 1.3 සීමාවාසික පුහුණුව සවිමත් කිරීම සහ කෙටි පුහුණු සහ සහතික පාඨමාලා ආරම්භ කිරීම
- 1.4 යෝග්‍ය උපාය මාර්ග භාවිතයෙන් ඉගැන්වීම් සහ ඉගෙනුම් පරිසරය වැඩිදියුණු කිරීම

II අරමුණ ජාතික සංවර්ධනයට දායක වෙමින් ජෛව රසායනවේදය, අණුක ජෛවවේදය, ජෛව තාක්ෂණය, ජෛව තොරතුරුවේදය, ප්‍රවේණි විද්‍යාව, සෛල ජීව විද්‍යාව සහ ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ විශිෂ්ටතා මධ්‍යස්ථානය බවට පත් වීම

ඉලක්ක

- 2.1 ආචාර්යවරුන් කෙරෙහි පවතින ජාත්‍යන්තර පිළිගැනීම ඉහළ නැංවීම / පවත්වාගෙන යාම
- 2.2. ජාතික වැදගත්කමකින් යුත් නව පර්යේෂණ වැඩසටහන් ස්ථාපිත කිරීම සහ දැනට පවත්නා වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම
- 2.3. ශක්‍ය තෙවන පාර්ශවයන් සමග පර්යේෂණ සහ සංවර්ධන, සේවා සහ උපදේශන ඒකාබද්ධ කිරීම
- 2.4. ජාතික ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී ජීව විද්‍යා, ප්‍රතිශක්ති විද්‍යාව, ජෛවතොරතුරුවේදය සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල දැනුම, පහසුකම්, විශේෂඥතාව සහ උපදේශන සැපයීමේ කේන්ද්‍රීය මධ්‍යස්ථානයක් බවට පත් වීම.
- 2.5. අණුක ජෛවවේදය සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල සුවිශේෂ වර්ධනයන් පිළිබඳ ලේඛනාගාරයක් පිහිටුවීම

III අරමුණ යටිතල පහසුකම් සහ මානව සම්පත් අංශයන්හි විශිෂ්ටත්වය ළඟා කර

ඉලක්ක

- 3.1. අවකාශය පුළුල් කිරීම සහ උපකරණ, රසායනාගාර සහ පුස්තකාල පහසුකම් වැඩි දියුණු කිරීම
- 3.2 උපකරණ බෙදාහදා ගැනීම
- 3.3 මානව සම්පත් සවිබල ගැන්වීම සහ නව සේවක සංඛ්‍යා නිර්මාණය කිරීම

IV අරමුණ ආයතනික මූල්‍ය ස්ථාවරත්වය ළඟා කර ගැනීම

ඉලක්ක

- 4.1. ආදායම වැඩි දියුණු කර ගැනීම
- 4.2 නව නිපැයුම්, ආරම්භක මට්ටමේ ව්‍යාපාර සහ ව්‍යවසායකත්වය සඳහා පහසුකම් සැලසීම
- 4.3 වියදම් සීමා කිරීම

V අරමුණ යහපාලනය ප්‍රවර්ධනය

ඉලක්ක

- 5.1. සෑම මට්ටමකදීම යහපාලනය ප්‍රගුණ කිරීම
- 5.2 IQAC ක්‍රියාකරකම් දිරි ගැන්වීම
- 5.3 පාරදෘශ්‍යභාවය සහ වගවීම ඉහළ නැංවීම

ආයතනික සාරධර්ම

ශාස්ත්‍රීය නිදහස

ආයතනයේ සම්මතයන් හා ප්‍රතිපත්තීන්ට යටත්ව, සත්‍යය සහ අවබෝධය අනුගමනය කරමින් බාධාවකින් හෝ දණ්ඩනයකින් තොරව පර්යේෂණ පැවැත්මට, ඉගැන්වීමට, භාෂණයට සහ ප්‍රකාශයට පත් කිරීමට නිදහස තිබේ.

යාවජීව ඉගෙනීම සහ විචාරාත්මක චින්තනය

ආයතනය කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ යාවජීව ඉගෙනීම සහ විචාරාත්මක චින්තනය පුබුදු කරයි

නවෝත්පාදනය සහ ගවේෂණය

සංවර්ධනය සඳහා නවාංග සොයා ගැනීමට ආයතනය සැමවිටම සූදානම්ින් පසු වෙයි.

වගකීම සහ වගවීම

ආයතනය වගකීම සහ වගවීම පිළිබඳ හැඟීමකින් යුතුව ක්‍රියාත්මක වේ.

විවිධත්වය සහ අන්තර්ග්‍රහණය

ආයතනය පුළුල් පරාසයක් හරහා අඛණ්ඩව ක්‍රියාත්මක වන අතර අන්තර්ග්‍රහණය වර්ධනය කරයි

අඛණ්ඩතාවය

ආයතනයේ සාධනයන් එහි ක්‍රියාවන්හි විනිවිදභාවය සහ ක්‍රියාකාරිත්වයේ අඛණ්ඩ අවංකභාවය මත පදනම් වේ.

වෘත්තීයමයභාවය

ආයතනය සියලු සිසුන් සහ කාර්ය මණ්ඩලය වෙතින් අවංකභාවය, සදාචාරය, තීක්ෂණ අවධානය සහ අනුකූලතාව අපේක්ෂා කරයි.

කැපවීම සහ නිපුණතාවය

ආයතනයේ කාර්ය මණ්ඩලය දැනුම වර්ධනය කිරීමට, දැනුම ලබා දීමට සහ අතිශය උනන්දුවෙන් වැඩ කිරීමට කැපවී සිටියි.

කණ්ඩායම් හැඟීම

කණ්ඩායමක් ලෙස වැඩ කිරීමේ කීර්ති නාමයක් සහිත මෙම ආයතනය එහි සියලු කටයුතුවලදී කණ්ඩායම් හැඟීම වර්ධනය කරයි.

සම අවස්ථා

තම ශක්තිය සහ එකමුතුකමෙහි මූලය සමාජ සාධාරණත්වය සහ සමානාත්මතාවයේ පදනම මත සෑම කෙනෙකුටම සමාන අවස්ථා ලබා දීම බව ආයතනය පිළිගනී.

අරමුණු

අරමුණු අංක 1

අණුක ජෛව විද්‍යාව සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල ඉහළ මට්ටමේ ජාත්‍යන්තරව පිළිගත් අභ්‍යාසලාභීන්, උපාධිධාරීන් සහ පශ්චාත් උපාධිධාරීන් බිහි කිරීම

අරමුණු අංක 2

ජාතික සංවර්ධනයට දායක වන ජෛව රසායන විද්‍යාව, අණුක ජීව විද්‍යාව, ජෛව තාක්ෂණය, ජෛව තොරතුරු, ජාන, සෛල ජීව විද්‍යාව සහ ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ විශිෂ්ට මධ්‍යස්ථානයක් වීම

අරමුණු අංක 3

යටිතල පහසුකම් සහ මානව සම්පත්වල විශිෂ්ටත්වය ළඟා කර ගැනීම

අරමුණු අංක 4

ආයතනික මූල්‍ය ස්ථාවරත්වය ළඟා කර ගැනීම

අරමුණු අංක 5

යහපාලනය ප්‍රවර්ධනය කිරීම

පටුන

අධ්‍යක්ෂකතුමාගේ සමාලෝචනය	1
IBMBB ආයතනයේ අධ්‍යක්ෂවරු	2
IBMBB පිළිබඳ හැඳින්වීම	3
ආයතනික ව්‍යුහය	4
පාලනාධිකාරිය	6
ඉගෙනුම් හා ඉගැන්වීම් කටයුතු	7
- පශ්චාත් උපාධි පාඨමාලා	7
- පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය **2021**	9
- කෙටි පාඨමාලා සහ පුහුණු වැඩසටහන්	10
පර්යේෂණ ක්‍රියාකාරකම්	15
පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණ	29
පර්යේෂණ ප්‍රකාශන	29
පර්යේෂණ සංනිවේදන	31
ජාත්‍යන්තර පර්යේෂණ අරමුදල්	34
ක්වීන් එළිසබෙත් පොදුරාජ්‍ය මණ්ඩලීය අධ්‍යයන වැඩ සටහන	34
සේවා **– IBMBB**	35
සහයෝගිතා	37
සිසුන් සඳහා වන පහසුකම්	39
2023 දී ලද සම්මාන	40
CSR ක්‍රියාකාරකම්	41
තත්ත්ව සහතිකකරණය	42
2023 දෙසැම්බර් **31** වන දිනට ආයතනයෙහි සේවක වර්ගීකරණය	43
කාර්ය මණ්ඩල සංවර්ධනය, පුහුණුව සහ සුබසාධනය **-2023**	44
විශේෂ ක්‍රියාකාරකම්	45
2024 වසර සඳහා වන වැඩ සැලැස්ම	47
තිරසාර සංවර්ධනය මත පදනම්ව පරිසරය සුරැකීමට සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමට ක්‍රියාකාරකම් පිළිබඳ අනාගත ප්‍රක්ෂේපන	49
වාර්තාව විගණකාධිපති වාර්තාව	50
විගණකාධිපති වාර්තාව සඳහා පිළිතුරු	58
අභ්‍යන්තර විගණන කාර්යන් පිළිබඳ සමාලෝචනය	68
වාර්ෂික මුල්‍ය වාර්තාව	69

අධ්‍යක්ෂකතුමාගේ සමාලෝචනය



කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයට 2023 වසර අභියෝගාත්මක වසරක් විය. රජයේ අරමුදල් සීමා කිරීමට ගත් තීරණය හේතුවෙන් 2003 වර්ෂයේ ආරම්භ වූ දා සිට මෙතෙක් සිය ඉතිහාසයේ ප්‍රථම වරට මුහුණ පෑ විශාලතම මූල්‍ය බාධාවකට මුහුණ දීමට IBMBB හට සිදුවිය. එම දුෂ්කර මූල්‍ය වටපිටාව විස්තීරණ වියදම් කළමනාකරණය සමඟම ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් වල (SFA) නිරත වීමට අපට බල කළේය. මූල්‍ය ක්ෂේත්‍රයේ එවැනි ඍණාත්මක වර්ධනයන් අඛණ්ඩව සිදුවන බව දැකගත හැකි අතර ආයතනයේ පැවැත්ම සඳහා හදිසි ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග අවශ්‍ය වේ. කෙසේ වෙතත්, IBMBB මෙම අභියෝග ධනාත්මකව භාරගත් අතර මෙහෙයුමේ තිරසාරභාවය සහ විභව සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය කටයුතු කිහිපයක් ආරම්භ කළේය.

සමස්ත අධ්‍යාපන කටයුතු පිළිබඳ දළ විශ්ලේෂණය

2023 වර්ෂයේදී අපි සංශෝධිත පංති ශාස්ත්‍රවකට යටත්ව අධ්‍යයන මණ්ඩල තුනක් යටතේ සිසුන් බඳවා ගත්තෙමු: එනම් අණුක ජෛවවේදය, සෛලීය සහ අණුක ප්‍රතිශක්ති විද්‍යාව සහ ජෛව තොරතුරු විද්‍යාව යන විෂයයන්ය. වැඩසටහන් තුන සඳහාම මුළු බඳවා ගැනීම් සංඛ්‍යාව 69 ක් වූ අතර එය පෙර අධ්‍යයන වර්ෂවලට සාපේක්ෂව සැලකිය යුතු වර්ධනයක් විය. අනෙක් අතට, QECS වැඩසටහන මගින් පශ්චාත් උපාධි අපේක්ෂකයෙකුට 2023 දී ශාස්ත්‍රපති උපාධියක් හැදෑරීමට ශිෂ්‍යත්වයක් ද ලබා දෙන ලදී. කෙසේ වෙතත්, දර්ශනපති / දර්ශනසූරී උපාධි සඳහා බැඳීම අඩුවීමක් දක්නට ලැබෙන බව සනිටුහන් විය. ඊට හේතුව අ) අරමුදල් සපයන ආයතන මගින් කළ මූල්‍යමය සීමා කිරීම, ආ) රටේ සමස්තයක් ලෙස රට මුහුණ පා සිටින ආර්ථික අභියෝගය සහ (ඇ). පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු පිළිබඳ උනන්දුව දුර්වල වීම විය හැකිය. IBMBB විසින් මෙහෙයවන ලද ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් (SFA) වත්මන් මූල්‍ය වර්ෂය තුළ ආයතනයේ ආදායමට ඉමහත් දායකත්වයක් ලබා දුන්නේය. මෙම SFA බොහෝමයක් ඉතා සාර්ථක වූ අතර සහභාගිවන්නන්ගෙන් හොඳ ප්‍රතිචාර ලැබිණි. ව්‍යුහාත්මක ජෛව තොරතුරු හා පරිගණකමය ඖෂධ සොයාගැනීම් පිළිබඳ පුහුණු පාඨමාලාව වැනි අලුතින් නිර්මාණය කරන ලද ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් මිශ්‍ර ඉගෙනුම් වේදිකාවට ජාත්‍යන්තර ප්‍රතිග්‍රාහකයන් ගණනාවක් ආකර්ෂණය කර ගත් දැවැන්ත ජයග්‍රහණයක් විය. අලුතින් දියත් කරන ලද සීමාවාසික වැඩසටහන් සැලකිය යුතු ඉල්ලුමක් ලැබූ අතර සැලකිය යුතු ආදායම් උත්පාදනයක් කරමින්ම අපගේ ඉගැන්වීම් වැඩසටහන් සඳහා වක්‍ර අලෙවිකරණය ප්‍රවර්ධනය කරන ලදී. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ විවිධ කාණ්ඩවල කාර්ය මණ්ඩලයේ හැකියාවන් ශක්තිමත් කිරීමේ කොළඹ විශ්වවිද්‍යාලයීය දැක්මට අනුකූලව, IBMBB 2023 වසරේ පළමු අදියර සඳහා තාක්ෂණික නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් ඉදිරිපත් කළේය. මෙම වැඩසටහනට දිවයිනේ අනෙකුත් විශ්වවිද්‍යාලවල කාර්ය මණ්ඩලයෙන් ඉහළ ප්‍රතිචාරයක් ලැබිණි. ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් මගින් උපයා ඇති මුළු ආදායම රු. මිලියන 8 ක් වූ අතර අනෙකුත් මූල්‍ය වර්ෂවලට සාපේක්ෂව එය සර්වකාලීන ඉහළ අගයක් විය.

පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්

2023 වර්ෂයේදී, දේශීය හා ජාත්‍යන්තර අරමුදල් සපයන ආයතන විසින් අරමුදල් සැපයීමේ අවස්ථා සැලකිය යුතු ලෙස සීමා කරන ලදී. මෙය අපගේ පර්යේෂණ හා සංවර්ධනය කෙරෙහි විශාල බලපෑමක් ඇති කළේය. IBMBB විසින් විභව ජාත්‍යන්තර අරමුදල් සහ කාර්මික සහයෝගීතාවයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් මෙම ගැටළුව සමනය කර ගැනීමට සියලු ප්‍රයත්නයන් දරන ලදී. UNDP මූලපිරීම් වලින් එකක් වන හරිත දේශගුණික අරමුදල් ව්‍යාපෘතිය (GCF) සමඟ වූ අපගේ සාකච්ඡාව පල දැරිය. එබැවින් IBMBBට සහයෝගිතාකරුවෙකු ලෙස අවස්ථාව හිමිවිය. IBMBB හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා අරමුදල් ප්‍රාග්ධනීකරණ අපේක්ෂාවෙන් ධනපති නියෝජිතායතනයට ඉදිරිපත් කළ ආරම්භක වාර්තාවේ මේ බව පැහැදිලිව සඳහන් කර ඇත.

IBMBB අවබෝධතා ගිවිසුම් (MoU), ද්‍රව්‍ය හුවමාරු ගිවිසුම් (MTA), හෙළිදරව් නොකිරීමේ ගිවිසුම් (NDA) කිහිපයකට අත්සන් කිරීමෙන අතිශයින් සාර්ථකව කාර්මික සහයෝගිතාව ශක්තිමත් කිරීමට සමත් විය. නිෂ්පාදන වාණිජකරණය IBMBB හි තවත් මූලපිරීමක් වූයේ දිගු කාලීන පුරස්කාර ගෙවීම් සුරක්ෂිත කරන ලද වාණිජ හවුල්කරුවන් සමඟ එකඟ වූ නියමයන් සහ කොන්දේසි සමඟිනි. ශක්‍ය කර්මාන්ත ජාලකරණයක් සහිත IBMBB හි පැවැත්මට මෙම මූල පිරීම් දිගුකාලීන ධනාත්මක බලපෑමක් ඇති කළ හැකි බව අපි අපේක්ෂා කරමු.

ගැටළු නිවාරණ ක්‍රමෝපායයන්

අඛණ්ඩ මූල්‍ය තර්ජනය හමුවේ, හැකි ඉක්මනින් විභව ප්‍රතිකර්ම උපාය මාර්ග ක්‍රියාවට නැංවීම නුවණට හුරුය. මේ සම්බන්ධයෙන් වන විභව උපාය මාර්ගයක් වූයේ ජීව විද්‍යා ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධි වැඩසටහනක් ආරම්භ කිරීමයි. 2023 වර්ෂයේදී මෙම කාර්යයට ප්‍රමුඛත්වය දෙනු ලැබූ අතර කොළඹ විශ්වවිද්‍යාලයෙන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් සුදුසු අනුමැතිය ලබාගෙන අණුක ජීව විද්‍යාව සහ ජෛව ව්‍යවසායකත්වය පිළිබඳ උපාධිය පිරිනැමීමට සියලු කටයුතු සූදානම් කරන ලදී. යෝජිත වැඩසටහන සඳහා ඉන්දියානු තාක්ෂණ ආයතනය (IIT) සහ මදුරාසි සහ කොරියානු සමුද්‍රීය සහ සාගර විශ්ව විද්‍යාලය (KMOU) විසින් සහාය දක්වන අතර ඔවුන් ජෛව තාක්ෂණය කෙරෙහි අවධානය යොමු කරන නව ව්‍යාපාරවල හෝ ආරම්භක ව්‍යාපාරවල සංවර්ධනයට සහාය වීම සඳහා ක්‍රියාකාරී භූමිකාවක් ඉටු කරනු ඇත. යෝජිත වැඩසටහන මඟින් තවත් ව්‍යාපාර ආරම්භ කිරීමට ඉඩ ලබාදීම හරහා සිසුන්ගේ මෙන්ම රටේ ද අවශ්‍යතා සපුරාලනු ඇතැයි අපි විශ්වාස කරමු. එක්සත් රාජධානියේ නොදම්බ්‍රියා විශ්වවිද්‍යාලය සමඟ සහයෝගයෙන් IBMBB විසින් ක්‍රියාත්මක කරන අනෙක් කාර්යය නම් වෛද්‍ය ජෛව තාක්ෂණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධියයි. මෙම වැඩසටහන එක්සත් රාජධානියේ නොදම්බ්‍රියා විශ්වවිද්‍යාලය විසින් පිරිනමනු ලබන පර්යේෂණ පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා ප්‍රගති මාවතක් නිර්මාණය කිරීමේ නව සංකල්පයකින් සමන්විතය.

මෙම වැඩසටහන ද අප ආයතනයට ද විශාල දායකත්වයක් සපයන බව විශ්වාසයෙන් පැවසිය හැකිය. තවද, වතුපිටිවල මූලික රෝහලේදී කොවිඩ් පරීක්ෂාව සඳහා ස්ථාපිත කරන ලද qPCR ක්‍රියාකාරී සැකසුම සුරක්ෂිත කිරීම සම්බන්ධයෙන් අපි සෞඛ්‍ය අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් ආරම්භ කළෙමු. මෙම සාකච්ඡාව අතිශයින් සාර්ථක වූ අතර, එම ස්ථානයේ දී සම්පූර්ණ PCR සැකසුම් ලබා ගැනීමට අනුමැතිය ලබා දෙන ලදී. අපගේ රෝග විනිශ්චය සේවා ශක්තිමත් කිරීම සඳහා IBMBB හි නවීන qPCR රසායනාගාර පහසුකම් ස්ථාපිත කිරීමට අපි බලාපොරොත්තු වෙමු.තවද, අපි අපේ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ ඔවුන්ගේ නිෂ්පාදනවලට අගය එකතු කිරීම සහ වලංගුතාව තහවුරු කිරීම සඳහා සහාය වීම ගැන සාකච්ඡාවලියක යෙදී සිටිමු

සටහන

මෙම සියලු අභියෝග මධ්‍යයේ වුවද යෝග්‍ය තීරණ ගැනීම සහ කාලෝචිත ලෙස ක්‍රියාත්මක වීම තුළින් 2023 වසර තුළ ඵලදායී ලෙස කටයුතු කරගෙන යාමට පවත්වා ගැනීමට IBMBB සමත් විය. IBMBB කළමනාකරණ මණ්ඩලයේ දායකත්වය මීට අතිශයින් ඉවහල් වූ අතර, ඔවුන් ලබා දුන් මග පෙන්වීම අගය කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. තවද, කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා බාධක කිහිපයක් මධ්‍යයේ වුවද යෝජිත උපාධි පාඨමාලා සඳහා අපගේ කටයුතු සඳහා නොමසුරුව සහය විය. එතුමා IBMBB වෙත ලබා දුන් අතිවිශාල මග පෙන්වීම සහ සහයෝගය මගේ ඉමහත් ප්‍රීතියට හේතුවකි. සතුටු වෙමි. IBMBB හි මගේ කණ්ඩායම මෙම තීරණාත්මක කාලය තුළ වඩාත් ඵලදායී තිරසාර සැලසුම් සඳහා මා දිරිමත් කරමින් සෑම විටම මා සමඟ රැඳී සිටියහ. IBMBB හි සියලුම කාර්ය මණ්ඩලයේ සහයෝගය නොමැතිව මෙම කාර්යයන් සාධනය කරගත හැකි නොවනු ඇතැයි මම විශ්වාස කරමි.IBMBB පවුල ලැබිය යුතු නිසි පිළිගැනීම ලබා දීම මා ලබන ගෞරවයකැයි මම විශ්වාස කරමි

මහාචාර්ය ප්‍රසන්න ගල්හේන
අධ්‍යක්ෂ /IBMBB

IBMBB ආයතනයේ අධ්‍යක්ෂවරු

වර්තමාන අධ්‍යක්ෂ

මහාචාර්ය ප්‍රසන්න ගල්හේන

පුරෝගාමී අධ්‍යක්ෂ

මහාචාර්ය එරික් එච්. කරුණාරත්න	2004 – 2007

පූර්ව අධ්‍යක්ෂවරුන්

මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්	2007 – 2012
මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්	2013 ජන- මාර්තු (වැඩබලන අධ්‍යක්ෂ)
මහාචාර්යඑම්. එච්. රිස්වි ෂෙරීෆ්	2013 අප්‍රේල් - 2014 සැප්තැම්බර් (වැඩබලන අධ්‍යක්ෂ)
මහාචාර්ය ශිරෝමා එම්. හඳුන්නෙත්ති	2014 ඔක්තෝබර් - 2015 ජනවාරි (වැඩබලන අධ්‍යක්ෂ)
මහාචාර්යශිරෝමා එම්. හඳුන්නෙත්ති	2015 පෙබරවාරි – 2018 පෙබරවාරි
මහාචාර්ය ටාරා ඩී. සිල්වා	2018 පෙබරවාරි –2018 අගෝස්තු (වැඩබලන අධ්‍යක්ෂ)
මහාචාර්ය ශිරෝමා එම්. හඳුන්නෙත්ති	2018 අගෝස්තු –2021 අගෝස්තු
මහාචාර්ය ශිරෝමා එම්. හඳුන්නෙත්ති	2021 සැප්තැම්බර් 1- 14 (වැඩබලන අධ්‍යක්ෂ)



IBMBB පිළිබඳ හැඳින්වීම

විෂයයන් දෙකක් 21 වැනි සියවසෙහි ආධිපත්‍යය දරනු ඇත.එනම් තොරතුරු හා පරිගණක තාක්ෂණය සහඅණුක ජීව විද්‍යාවයි. අන් ජාතීන්ට සාපේක්ෂව විද්‍යාව හා දැනුම මත පදනම් වූ සංවර්ධනය උදෙසා ආයෝජනය කළ ජාතීන් සැලකියයුතු ප්‍රගතියක් ලබා ඇත. සිය අසල්වැසි රටවල් ඒ අංශයෙන් බොහෝ ඉදිරියෙන් සිටියද ශ්‍රී ලංකාව ජෛවතාක්ෂණවේදය හා සම ක්ෂේත්‍රයන්හි විශාල ප්‍රගතියක් ලැබීමට තවමත් සමත්ව නැත. ජෛවතාක්ෂණවේදය හා සම ක්ෂේත්‍රයන් මත පදනම් වූ කර්මාන්තයන්හි නිහකමට ප්‍රධාන හේතුව වන්නේ එම ක්ෂේත්‍රයෙහි පුහුණු ශ්‍රමිකයන්ගේ හිහය සහ නව ආයෝජන සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොමැතිකමයි.

කොළඹ විශ්වවිද්‍යාලයෙහි ස්වාධීන ආයතනයක් ලෙස ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය (IBMBB) ස්ථාපිත කරන ලද්දේ ආයතනය සහ විශ්වවිද්‍යාලය විසින් අනුමත කරනු ලබන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන් තුළ උපදෙස්, පුහුණුව, පර්යේෂණ හා සංවර්ධනය සහ උපදේශනය සැපයීම අරමුණු කරගනිමිනි. මෙය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ ආයතනයක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පිළිගෙන තිබේ. IBMBB ස්ථාපනය කරන ලද්දේ ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන ඒජන්සිය/ සංවර්ධනය වෙමින් පවතින රටවල් සමග පර්යේෂණ සහයෝගිතාව සඳහා වූ ස්වීඩන ඒජන්සියෙහි (Sida/ SAREC) ආධාරයෙන් අණුක ජෛවවිද්‍යාව පිළිබඳව මහාචාර්ය එරික් එච්. කරුණානායකගේ නායකත්වයෙන් යුතුව දියත් කරන ලද ඉතාම සාර්ථක පර්යේෂණ වැඩසටහනක කුක්ෂ්‍රාප්තිය වශයෙනි. සංවර්ධනය වෙමින් පවතින රටවල් සමඟ පර්යේෂණ සහයෝගිතාව සඳහා ස්වීඩන ජාත්‍යන්තර සංවර්ධන නියෝජිතායතනය/ ස්වීඩන නියෝජිතායතනය (Sida/ SAREC) මඟින් සහාය ලබා දේ.

2004 අප්‍රේල් 28 වන දින IBMBB ආයතනය උත්සවාකාරයෙන් විවෘත කරන ලද්දේ කොළඹ ස්වීඩන තානාපති කාර්යාලයේ දූතමණ්ඩල ප්‍රධානී ගරු ඇන් මේරි ෆැලනියස් මැතිනිය සහ ස්වීඩනයේ උප්සලා විශ්වවිද්‍යාලයෙහි උප මණ්ඩපාධිපති මහාචාර්ය උල්ෆ් පීටර්සන් විසිනි. 2003 අප්‍රේල් 03 වන දින සහ අංක 1282/25 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අදාළ ආඥා පණත නිකුත් කරන ලදී. IBMBB ගොඩනැගිල්ල කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන පරිශ්‍රයේ පිහිටා ඇත. IBMBB ගොඩනැගිල්ල අණුක ජෛවවේද ක්ෂේත්‍රයෙහි භාවිතවන නවීනතම උපකරණ වන පූර්ණ ස්වයංක්‍රීය ඩී. එන්. ඒ. අනුක්‍රමයන්, මයික්‍රෝ ඇරේස්කැනර්, FPLC, HPLC, ප්‍රතිදීප්ත සහ කලා අසමතා අන්වීක්ෂ (Fluorescence and Phase Contrast microscopes, laminar floor hoods) සත්ත්ව හා ශාක පටක විද්‍යාගාරය තුළ වර්ධනය කිරීමේ පහසුකම්, පර්යේෂණ සත්වාගාර, ශීතාගාර, ස්ථානීය ජාලකරණය (LAN), විශේෂ ප්‍රකාශ තන්තු කේබල් මඟින් අන්තර්ජාල ප්‍රවේශය ආදියෙන් සමන්විත වන අතර සම්පූර්ණයෙන් වායුසමීකරණය කර ඇත. IBMBB ආයතනය සිය පර්යේෂණ කටයුතු අරඹන ලද්දේ 2004 ජූනි මාසයේය. 2004 දී මහාචාර්ය එරික් කරුණානායකගේ සුපරීක්ෂණයෙන් දර්ශනපති හා දර්ශනසූරී උපාධි සඳහා හැදෑරුම් කරමින් සිටි සිසුන් සිය අධ්‍යයන කටයුතු IBMBB ආයතනයෙන් සිදුකළ අතර පර්යේෂණ උපාධි සඳහා නව සිසුන් බඳවා ගැනීම් ද 2004 දී සිදුවිය.

2005 පෙබරවාරි මස "අණුක ජෛවවිද්‍යාව" "සෛල සහ අණුක ප්‍රතිශක්තිවේදය" පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලා දෙකක් ආරම්භ විය. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගනක පාසල සමග ඒකාබද්ධ වැඩ සටහනක් ලෙස ජෛව තොරතුරුවේදය පිළිබඳ තෙවන විද්‍යාපති උපාධි වැඩසටහන 2012 මැයි මස ආරම්භ විය.


වාර්ෂිකව, උසස් තත්ත්වයේ පශ්චාත් උපාධි සුදුසුකමක් ලබා ගැනීමේ අරමුණින් මෙම පශ්චාත් උපාධි වැඩසටහන් තුන සඳහා කැපී පෙනෙන සිසුහු සංඛ්‍යාවක් ලියාපදිංචි වෙති. එක් එක් වැඩසටහන සඳහා ලියාපදිංචි වූ සිසුන් අතරින් අවශ්‍ය සුදුසුකම් ලබාගත් සිසුන්ට අදාළ ක්ෂේත්‍රය පිළිබඳ විද්‍යාපති උපාධිය පිරිනැමේ.

සිය පළමු අධ්‍යයන වර්ෂය තුළ අවශ්‍ය සුදුසුකම් සපුරාලීමට නොහැකි වූ සිසුන්ට අණුක ජීව විද්‍යා විද්‍යාපති උපාධියක්, සෛලීය හා අණුක ප්‍රතිශක්ති විද්‍යා විද්‍යාපති උපාධියක් සහ ජෛව තොරතුරු විද්‍යාපති උපාධි ලබා ගත හැකිය. ශාස්ත්‍රපති උපාධිය දක්වා ඉදිරියට යාමට අවශ්‍ය නොවන හෝ එසේ කිරීමට සුදුසුකම් නොසපුරන සිසුන්ට ලබා දී ඇති නිර්ණායක සපුරාලීමෙන් පසු අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා අධ්‍යයන කටයුතු නැවැත්විය හැකිය. සෑම විද්‍යාපති ශිෂ්‍යයෙක්ම සිය දෙවන අධ්‍යයන වර්ෂය තුළ පර්යේෂණ ව්‍යාපෘතියක නිරත වන අතර එමඟින් අවසානයේ දී අදාළ ක්ෂේත්‍රවලට ප්‍රගමනය උදෙසා නව්‍ය ප්‍රතිඵල ලැබේ.

ඊට අමතරව දේශීය හා විදේශීය අධ්‍යයන සහ කාර්මික සහයෝගීතාවයන් සමඟින් දර්ශනපති /දර්ශනසූරී වැඩසටහන් හරහා වාර්ෂිකව දර්ශනපති /දර්ශනසූරී අභ්‍යාසලාභීන් ගණනාවක් බිහි කරනු ලැබෙනි.

මීට අමතරව, ආයතනය විසින් කෙටි කාලීන පුහුණු පාඨමාලා මාලාවක් පිරිනමනු ලබන අතර, එමඟින් පර්යේෂකයන් නිශ්චිත න්‍යායික හා ප්‍රායෝගික දැනුමෙන් සන්නද්ධ කරයි. පිරිනමනු ලබන කෙටි කාලීන පාඨමාලාවලට අණුක ජීව විද්‍යාත්මක ශිල්පීය ක්‍රම, සෛල රෝපණ ශිල්පීය ක්‍රම, ප්‍රතිශක්තිකරණ ශිල්පීය ක්‍රම, ජාන ක්ලෝනීකරණය සහ ප්‍රතිසංයෝජක ප්‍රෝටීන ප්‍රකාශනය සහ වර්ණදේහ ශිල්පීය ක්‍රම ඇතුළත් වේ. දින පහක කාලයක් පුරා පවත්වනු ලබන මෙම පාඨමාලා ආචාර්යවරුන්ගේ, පර්යේෂකයන්ගේ සහ පර්යේෂණ වෘත්තිකයන්ගේ කුසලතා වර්ධනය සඳහා පහසුකම් සපයයි. IBMBB හි ඇති සම්පත් බාහිර පර්යේෂකයන් සඳහා සේවා සැපයීම සඳහා භාවිතා කරනු ලැබේ, මෙයට අනුක්‍රමික සේවා, සෛල රෝපණය, පවිත්‍රණය, ප්‍රතිශක්තිකරණ විද්‍යාව යනාදිය ඇතුළත් වේ. IBMBB සීමාවාසික පුහුණුව සඳහා පහසුකම් සපයන අතර පර්යේෂණ සිසුන්ට සහ අපේක්ෂිත පර්යේෂකයන්ට පර්යේෂකයෙකු සමඟ දීර්ඝ කාලයක් සමීපව කටයුතු කිරීමට සහ නව ශිල්පීය ක්‍රම සහ පර්යේෂණ සැලසුම් කිරීම, සූදානම් කිරීම් ආදිය පිළිබඳ නවතම තොරතුරු ඉගෙන ගැනීමට අවස්ථාව ලබා දේ.

ආයතනික ව්‍යුහය


රේඛීය අමාත්‍යාංශය
(උසස් අධ්‍යාපන අමාත්‍යාංශය)
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
(UGC)
කොළඹ විශ්වවිද්‍යාලය
උපකුලපති
පේවරසායන, අණුක පේවවේද හා පේව තාක්ෂණවේද ආයතනය
අධ්‍යක්ෂ සහ කළමනාකරණ මණ්ඩලය
විගණන
කමිටුව
ජේ.ස.ලේ/SAR
නි.මූ./DB
මූල්‍ය හා
කළ. කමිටුව
පර්.හා උසස්
උපාධි කමිටුව
අධ්‍යයන
කමිටුව
සහ.ලේ
තත්ව සහතිකකරණ
කුටිය
ව්‍යාපාර සංවර්ධන
ඒකකය
අධ්‍යයන මණ්ඩලය -
අණුක පේවවේදය
අධ්‍යයන මණ්ඩලය -
සෛලීය සහ අණුක
ප්‍රතිශක්තිවේදය
අධ්‍යයන මණ්ඩලය -
පේවතොරතුරුවේදය

පාලනාධිකාරිය

කළමනාකරණ මණ්ඩලයෙහි සාමාජිකයන්

මහාචාර්ය ප්‍රසන්න ගල්හේන	අධ්‍යක්ෂ-IBMBB
ජේ.ඒ.සී.එච් ජයසිංහ මෙනවිය	අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත
සම්මානිත මහාචාර්ය කමනි තෙන්නකෝන්	විවිධ්‍රකො නම්කළ
සම්මානිත මහාචාර්ය එස්.පී දැරණියගල	විවිධ්‍රකො නම්කළ
මහාචාර්ය සාගරිකා ඒකනායක	විවිධ්‍රකො නම්කළ
මහාචාර්ය රමණී විජේසේකර	විවිධ්‍රකො නම්කළ
චන්න ද සිල්වා මහතා	පාලක සභාව නම්කළ
අශාන් ජෝශප් වාස් ජයසේකර මහතා	පාලක සභාව නම්කළ
මහාචාර්ය සම්පත් පුංචිහේවා	සනාතන සභාව නම්කළ
මහාචාර්ය සේනක රාජපක්ෂ	සනාතන සභාව නම්කළ
මහාචාර්ය වජිර දිසානායක	පීයාධිපති/ වෛද්‍ය පීඨය, කොළඹ වි.වි, නිල බලයෙන් පත්වූ
මහාචාර්ය උපුල් සොන්නාදර	පීයාධිපති/ විද්‍යා පීඨය, කොළඹ වි.වි, නිල බලයෙන් පත්වූ
ආචාර්ය අජන්ත අතුකෝරල	අධ්‍යක්ෂ, පරිගණක පාසල (UCSC) කොළඹ වි.වි, නිල බලයෙන් පත්වූ
මහාචාර්ය ශර්මිලා ජයසේන	අංශ ප්‍රධානී / ජෛව රසායනය සහ අණුක ජීව විද්‍යාව අ.අංශය, වෛද්‍ය පීඨය, නිල බලයෙන් පත්වූ


පශ්චාත් උපාධි පාඨමාලා


අධ්‍යයන මණ්ඩල – සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය (CMI), අණුක ජෛවවේදය (MLS), ජෛවතොරතුරුවේදය (BI)

IBMBB හි ප්‍රධාන අධ්‍යයන ධාරා තුන අධ්‍යයන මණ්ඩල තුනකින් පාලනය වේ. සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය, අණුක ජෛවවේදය සහ ජෛව තොරතුරුවේදය පිළිබඳ අධ්‍යයන මණ්ඩල විසින් එක් එක් විෂය ක්ෂේත්‍රය තුළ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව, මාස්ටර්ස් වැඩසටහන් මෙන්ම විද්‍යාපති උපාධිවල අධ්‍යයන කටයුතු පාලනය කරයි. සෑම මණ්ඩලයක්ම එහි විෂය ක්ෂේත්‍රයේ විෂය පථයට අයත් කෙටි පාඨමාලා පිරිනැමීම ද පාලනය කරයි. අධ්‍යයන මණ්ඩලය විෂය අන්තර්ගත සංවර්ධන සහ අධ්‍යාපනයෙහි යෙදී සිටින අභ්‍යන්තර හා බාහිර විශේෂඥයන් ඇතුළු අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් සමන්විත වේ. ඔවුහු පිළිවෙලින් මාස්ටර්ස් සහ විද්‍යාපති උපාධි සම්පූර්ණ කරන සිසුන්ගේ සියලුම පාඨමාලා වැඩ ක්‍රියාකාරකම් මෙන්ම මාර්ගෝපදේශිත ස්වාධීන අධ්‍යයන සහ පර්යේෂණ ව්‍යාපෘති අධීක්ෂණය සහ ඇගයීමට ලක් කරති.


2022 පෙබරවාරි මාසයේදී, අණුක ජෛවවේදය, සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ උපාධි වැඩසටහන් සඳහා නව සිසුන් බඳවා ගැනීම සිදු විය. සංශෝධිත විෂයමාලාවට අනුව, ශාස්ත්‍රපති (SLQF 9) උපාධි සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ 6 වන කණ්ඩායම වන මෙයට පිළිවෙලින් අණුක ජීව විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MLS) සිසුහු දහනව දෙනෙක් සහ සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ විද්‍යාපති (CMI) සිසුන් විසි දෙනෙක් ද, ජෛව තොරතුරුවේදය පිළිබඳ විද්‍යාපති (BI) සිසුන් තිස් දෙනෙක් ද අයත් වෙති.


2023 දී අණුක ජෛවවේදය පිළිබඳ විද්‍යාපති උපාධිය සඳහා සිසුන් අට දෙනෙකු සහ සෛලීය හා අණුක ප්‍රතිශක්තිවේදය විද්‍යාපති උපාධිය සඳහා සිසුන් පහළොස් දෙනෙකු ලියාපදිංචි වී සිය විද්‍යාපති පර්යේෂණ ව්‍යාපෘති කටයුතු කරගෙන ගොස් ඇත. අණුක ජෛවවේදය සිසුන් පහළොස් දෙනෙක් සහ සෛලීය සහ අණුක ප්‍රතිශක්තිවේදය පිළිබඳ විද්‍යාපති සිසුන් හත් දෙනෙක් 2023 දී විභාගය සඳහා සිය නිබන්ධනය ඉදිරිපත් කළහ






MLS හි ශිෂ්‍යයන් 19 ක්, CMI හි ශිෂ්‍යයන් 4 ක් 2023 දී ඔවුන්ගේ MSc අධ්‍යාපන අවසන් කළහ. තවද, MLS ශිෂ්‍යයන් දෙදෙනෙක් හා BI ශිෂ්‍යයෙක් පශ්චාත් උපාධියක් ලබා වැඩසටහනෙන් ඉවත් වීමට තීරණය කළහ. MLS ශිෂ්‍යයන් දෙදෙනෙකු වැඩසටහන ඉවත් වී පශ්චාත් උපාධියක් ලබා ගැනීමට තීරණය කළහ.








දර්ශනපති / දර්ශනාසූරී උපාධි වැඩ සටහන්

දර්ශනපති /දර්ශනාසූරී සිසුන් දෙදෙනෙක් 2023 තුළ ලියාපදිංචි වූ අතර IBMBB හි ලියාපදිංචි දර්ශනපති /දර්ශනාසූරී සිසුහු දහනව දෙනෙක් සිටියහ. දර්ශනපති /දර්ශනාසූරී උපාධි මත පදනම් වූ පර්යේෂණ වැඩසටහන් පර්යේෂණ ක්‍රියාකාරකම් යටතේ විස්තර කෙරේ. දර්ශනපති සිසුවෙකු විභාග සහ වාචික පරීක්ෂණය සඳහා සිය නිබන්ධන ඉදිරිපත් කළ අතර තවත් දර්ශනපති සිසුවෙක් 2023 දී සිය වාචික පරීක්ෂණය සම්පූර්ණ කළේය.

2019	2020	2021	2022	2023
නව ලියාපදිංචිවීම් 02	නව ලියාපදිංචිවීම් 03	නව ලියාපදිංචිවීම් -	නව ලියාපදිංචිවීම් 01	නව ලියාපදිංචිවීම් 02
සම්පූර්ණ කිරීම් 09	සම්පූර්ණ කිරීම් 02	සම්පූර්ණ කිරීම් 01	සම්පූර්ණ කිරීම් 05	සම්පූර්ණ කිරීම් 01

පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය - 2021

2021 සම්ප්‍රදායානුකූල පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවය 2023 මාර්තු 01 සහ 02 යන දිනවල පවත්වන ලදී. IBMBB හි උපාධිධාරීන් විසිහත් දෙනෙකුට 2022 පශ්චාත් උපාධි ප්‍රදානෝත්සවයේදී උපාධි ප්‍රදානය කරන ලදී.



කෙටි පාඨමාලා සහ පුහුණු වැඩ සටහන්

කාර්මික නිලධාරීන් සහ රසායනාගාර කාර්මික ශිල්පීන් සඳහා වැඩමුළුව

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායනවේදය, අණුක ජෛවවේදය සහ ජෛව තාක්ෂණ ආයතනය විසින් කාර්මික නිලධාරීන් සහ රසායනාගාර කාර්මික ශිල්පීන් සඳහා සංවිධානය කරන ලද වැඩමුළු දෙකක් 2023 මාර්තු 27 සිට 29 දක්වා සහ 2023 අගෝස්තු 23 සිට 25 දක්වා සාර්ථකව පවත්වන ලදී. මෙම වැඩමුළු සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ විවිධ ආයතන සහ සංවිධාන නියෝජනය කරමින් 60 දෙනෙක් සහභාගී වූහ.

මෙම වැඩමුළුව රසායනාගාර ප්‍රවේසම පිළිබඳ පළපුරුද්ද, pH මීටර හැසිරවීම සහ නඩත්තු කිරීම, විශ්ලේෂණාත්මක ශේෂයන්, වර්ණාවලීක්ෂ ඡායාරූපමාන, කේන්ද්‍රාපසාරක, PCR සහ තත්‍ය කාලීන PCR යන්ත්‍ර, මයික්‍රොපිපෙට්ටු ආස්තර ප්‍රවාහ භාවිතය / ජෛව ආරක්ෂක කැබිනට්ටු, ක්ෂුද්‍රතැටි/ ELISA තැටි කියවන, අන්වීක්ෂ, ජීවානුහරණ උපකරණ සහ HPLC පිළිබඳ ප්‍රායෝගික අංගයන් ආවරණය කරන ලදී.

මෙම වැඩමුළුව මූලික වශයෙන් අවධානය යොමු කළේ ප්‍රතිපත්ති, මෙහෙයුම් ප්‍රොටෝකෝල පිළිබඳ අවබෝධය ශක්තිමත් කිරීම සහ සම්මත රසායනාගාර පසුබිමක නිතර භාවිතා කරන උපකරණ දෝෂ නිරාකරණය කිරීම කෙරෙහි ය. විෂය හා කර්මාන්ත විශේෂඥයින් විසින් පවත්වනු ලබන න්‍යායාත්මක දේශන ද මෙම වැඩමුළුවලට ඇතුළත් විය. මෙම වැඩමුළුව සහභාගිවන්නන්ට රසායනාගාර ප්‍රවේසම සහ නඩත්තුව පිළිබඳ තම දැනුම පුළුල් කර ගැනීමට මහඟු අවස්ථාවක් විය.





ජාන ක්ලෝනීකරණය සහ ප්‍රතිසංයෝජිත ප්‍රෝටීන ප්‍රකාශනය පිළිබඳ පුහුණු වැඩ සටහන

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායනවේදය, අණුක ජෛවවේදය සහ ජෛව තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද "ජාන ක්ලෝනීකරණය සහ ප්‍රතිසංයෝජක ප්‍රෝටීන ප්‍රකාශනය" පිළිබඳ පුහුණු පාඨමාලාව 2023 නොවැම්බර් 20 සිට 24 දක්වා ප්‍රතිග්‍රාහකයන් නව දෙනෙකුගේ සහභාගිත්වයෙන් IBMBB පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වන ලදී.

තරුණ විද්‍යාඥයින්, ආචාර්යවරුන්, උපාධි/පශ්චාත් උපාධි සිසුන් සහ ජීව විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය අපේක්ෂාවෙන් සිටින සිසුන් සඳහා මෙම පුහුණු පාඨමාලාව පවත්වන ලදී. නවීන ජෛව තාක්ෂණයේ PCR ප්‍රගුණය සහ ක්ලෝනකරණය, ප්‍රතිසංයෝජක ඉදිකිරීම් සකස් කිරීම, ඩීඑන්ඒ පරිවර්තනය, ප්‍රෝටීන් ප්‍රකාශනය සහ පවිත්‍රණය, ප්‍රෝටීන් ස්ඵටිකීකරණය, ජෛව තොරතුරු/පරිගණක ග්‍රැෆික් මත පදනම් වූ අභ්‍යාස ආදිය මගින් භාවිත කරන ප්‍රෝටීනවල ව්‍යුහාත්මක ප්‍රතිවේදයන් හඳුනා ගැනීම වැනි නවීනතම මෙන්ම බහුලව භාවිතා වන ක්‍රම පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට පුහුණු පාඨමාලාව මඟින් අවස්ථාව සලසා ඇත. ජාන ක්ලෝනකරණය සහ ප්‍රතිසංයෝජක ඉදිකිරීම් සකස් කිරීම යන ක්ෂේත්‍ර පිළිබඳව තම දැනුම පුළුල් කර ගැනීමට මෙම පුහුණු පාඨමාලාව සහභාගිවන්නන්ට කදිම අවස්ථාවක් විය. පුහුණු පාඨමාලාව විවෘත සාකච්ඡාවකින් අවසන් වූ අතර එහිදී සහභාගිවූවෝ පුහුණු පාඨමාලාව පිළිබඳ ඔවුන්ගේ අදහස් බෙදාගත්හ. එහි අන්තර්ගතය සහ සංවිධානය යන දෙකම බෙහෙවින් අගය කරන ලදී. ඉදිරියේදී මෙවැනි පාඨමාලා රැසක් පැවැත්වීමට ඔවුහු යෝජනා කළහ.

පටක රෝපණ ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව

2023 වර්ෂයේදී දෙවතාවක්, කොළඹ විශ්ව විද්‍යාලයීය ජෛව රසායනවේදය, අණුක ජෛවවේදය සහ ජෛව තාක්ෂණ ආයතනය (IBMBB), මහාචාර්ය සමීර ආර් සමරකෝන් සහ මහාචාර්ය කමනි එව් තෙන්නකෝන්ගේ මගපෙන්වීම ඇතිව පටක රෝපණ ශිල්පීය ක්‍රම පිළිබඳ දින පහක පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී. පළමු කණ්ඩායම 2023 ජනවාරි 09 සිට 13 දක්වා කාලය තුළ බාහිර සහභාගිවන්නන් 18 ක් සහ අභ්‍යන්තර සහභාගිවන්නන් 04 කින් යුතුව පුහුණු කරන ලද අතර සහභාගිවන්නන් 09 දෙනෙකුගෙන් යුත් 2 වන කණ්ඩායම 2023 අගෝස්තු 07 සිට 11 දක්වා කාලය තුළ IBMBB පරිශ්‍රයේදී පුහුණු කරන ලදී.

පාඨමාලාව සාර්ථකව නිම කළ පසු සහභාගිවූවන්ට සහතික පත් ප්‍රදානය කරන ලදී. තරුණ විද්‍යාඥයින්, වෛද්‍යවරුන්, ආචාර්යවරුන්, තාක්ෂණික නිලධාරීන්, ජීව විද්‍යාව පිළිබඳ උසස් අධ්‍යාපනය ලැබීමට බලාපොරොත්තුවෙන් සිටින සිසුන් සහ තම විද්‍යාත්මක ක්ෂේත්‍ර තුළ සත්ව පටක රෝපණය හැදෑරීමට උනන්දුවක් දක්වන විභව පුද්ගලයින් පුහුණු කිරීම වැඩසටහනේ අරමුණයි.

මෙම පාඨමාලාව පැය 45ක ඒකාබද්ධ න්‍යායික හා ප්‍රායෝගික පුහුණුවකින් සමන්විත වන අතර පූර්වාරක්ෂාවන්, මාධ්‍ය සකස් කිරීම, සෛල ගණන් කිරීම සහ ශක්‍යතාව තීරණය කිරීම, අනුගත සහ අවලම්බන සෛල වර්ධනය, සෛල නඩත්තුව, මානව පිළිකා සෛල රේඛා කැටි කිරීම සහ හිමායනය, ප්‍රතිදීප්ත අන්වීක්ෂ සහ DNA ඛණ්ඩනය කිරීමේ ක්‍රම භාවිතයෙන් ඇපොප්ටෝසිස් හඳුනා ගැනීම, පිළිකා නාශක ඖෂධ පරීක්ෂා කිරීම සඳහා සෛල පදනම් කරගත් විශ්ලේෂණයන් භාවිතා කරමින් සෛලවල විෂ සහිත ස්වරූපය සහ සෛල ප්‍රගුණනය නිර්ණය කිරීම, ප්‍රාථමික සෛල වෙන් කිරීම සහ නඩත්තු කිරීම, රෝපිත සෛල වලින් න්‍යෂ්ටික අම්ල නිස්සාරණය සහ සහ ප්‍රාථමික සෛල පිළිබඳ දළ විශ්ලේෂණයක්ඇතුළු මූලික සෛල රෝපණ ශිල්පීය ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම සඳහා අන්තර්ගතය සැලසුම් කර ඇත. පාඨමාලාව සහභාගිවන්නන් අතර ඉමහත් පැසසුමට ලක් වූ බවට ඔවුන්ගේ ප්‍රතිපෝෂණ සාක්ෂි දරයි.

.








උසස්පෙළ සිසුන් සඳහා අණුක ජීව විද්‍යාව සහ DNA ප්‍රතිසංයෝජක තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාව

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායනවේදය, අණුක ජෛවවේදය සහ ජෛව තාක්ෂණ ආයතනය විසින් උසස් පෙළ සිසුන් සඳහා 2023 වසරේ සංවිධානය කරන ලද අණුක ජීව විද්‍යාව සහ DNA ප්‍රතිසංයෝජන තාක්ෂණය පිළිබඳ පුහුණු පාඨමාලාවක් 2023 මැයි 29 සිට ජූනි 02 දක්වා 10 දෙනෙකුගේ සහභාගිත්වයෙන් IBMBB පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වන ලදී.

මෙම පුහුණු පාඨමාලාව උසස් පෙළ විෂය නිර්දේශයට අදාළ න්‍යාය සහ ප්‍රායෝගික කොටස් දෙකම ආවරණය කරන ලද අතර, ජානමය ද්‍රව්‍යවල අණුක පදනම, ජාන ප්‍රකාශනයේ පදනම, විකෘතිය සහ විකෘති ජනනය, DNA වෙන් කිරීම, RNA වෙන් කිරීම, DNA සමඟ එන්සයිම ප්‍රතික්‍රියා කිරීම සහ PCR ප්‍රතිසංයෝජන DNA තාක්ෂණය, DNA අනුක්‍රමණය, DNA ඇතිලි සලකුණු, සහ ප්‍රතිසංයෝජන DNA තාක්ෂණය යෙදීම වැනි ආශ්‍රිත ශිල්පීය ක්‍රම ඇතුළත් වේ.

පුහුණු පාඨමාලාව සහභාගිවන්නන්ට අණුක ජීව විද්‍යාව සහ DNA ප්‍රතිසංයෝජක තාක්ෂණය යන ක්ෂේත්‍රවල ඔවුන්ගේ දැනුම පුළුල් කර ගැනීමට කදිම අවස්ථාවක් විය.





උසස් වර්ණදේහ ශිල්පීය ක්‍රම පිළිබඳ වැඩමුළුව

කොළඹ විශ්ව විද්‍යාලයේ ජෛව රසායනවේදය, අණුක ජෛවවේදය සහ ජෛව තාක්ෂණ ආයතනය සහ කාර්මික තාක්ෂණ ආයතනය (ITI) එක්ව සංවිධානය කරන ලද උසස් වර්ණලේඛන ශිල්පීය ක්‍රම පිළිබඳ වැඩමුළුවක් 2023 ජූනි 08 සහ 09 යන දිනවල IBMBB සහ ITI පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්විණි.

මෙම වැඩමුළුව උසස් වර්ණලේඛන ශිල්පීය ක්‍රම පිළිබඳ ප්‍රායෝගික අත්දැකීමක් සමඟින් උසස් වර්ණලේඛන ශිල්පීය ක්‍රම පිළිබඳ න්‍යාය සහ ප්‍රායෝගික අංශ ආවරණය කරන ලදී. මෙම වැඩමුළුවට උසස් වර්ණදේහ විද්‍යාවේ අංග සහ IC, HPLC-DAD-FLD, LC-MS-MS සහ GC-MS හි ප්‍රායෝගික නිරූපණයන් ඇතුළත් විය. උසස් වර්ණදේහ පිළිබඳ අනාගත වැඩසටහන් ඉල්ලුම මත සිදු කෙරේ.

සහභාගිවන්නන්ට උසස් වර්ණදේහ විශ්ලේෂණයේ දී ඔවුන්ගේ අවබෝධය සහ ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කෙරෙන අන්දමින් HPLC-DAD-FLD, LC-MS-MS, සහ GC-MS ශිල්පීය ක්‍රම සමඟින් න්‍යායික දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් ලබා දෙන ලදී.





අණුක ජෛවවේද ශිල්පක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායනවේදය, අණුක ජෛවවේදය සහ ජෛව තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද "අණුක ජෛවවේද ශිල්පක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාව" 2023 ජුනි 19 සිට 23 දක්වා ප්‍රතිග්‍රාහකයන් 15 දෙනෙකුගේ සහභාගිත්වයෙන් IBMBB පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වන ලදී.

පුහුණු පාඨමාලාව DNA නිස්සාරණය සහ ප්‍රමාණකරණය, PCR, RT-PCR, DNA අනුක්‍රම නිර්ණය සහ ජෙල් විද්‍යුතාගමනය පිළිබඳ ගැඹුරු අත්දැකීම් ලබා ගැනීමට ඉඩ සලසා දුන්නේය. මීට අමතරව, ව්‍යාධිජනක රෝග නිර්ණය කිරීමේදී සහ විකෘති හඳුනාගැනීමේදී තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම පිළිබඳව සාකච්ඡා කර ඇත. කීර්තිමත් ආචාර්යවරුන් විසින් මෙහෙයවන ලද මෙම පාඨමාලාව මගින් මෙම අත්‍යවශ්‍ය අණුක ජීව විද්‍යා ශිල්පීය ක්‍රම පිළිබඳ වටිනා දැනුම සහ ප්‍රායෝගික කුසලතා ලබා දෙන ලදී.

පුහුණු පාඨමාලාව DNA නිස්සාරණය සහ ප්‍රමාණකරණය, PCR, RT-PCR, ජෙල් විද්‍යුතාගමනය, සීමා කිරීම් බණ්ඩක දිග බහුරූපතාව, DNA අනුක්‍රම නිර්ණය සහ වෙනත් ආශ්‍රිත ජෛව තොරතුරු මෙවලම් භාවිතය පිළිබඳ අත්දැකීම් ලබා ගැනීමට ඉඩ සලසා දුන්නේය. මීට අමතරව, ව්‍යාධිජනක රෝග නිර්ණය කිරීමේදී සහ විකෘති හඳුනාගැනීමේදී තාක්ෂණික ක්‍රම භාවිතා කිරීම පිළිබඳව සාකච්ඡා කර ඇත. අණුක ජෛවවේද ශිල්පක්‍රම පිළිබඳව තම දැනුම පුළුල් කර ගැනීමට මෙම පුහුණු පාඨමාලාව සහභාගිවන්නන්ට කදිම අවස්ථාවක් විය.






ව්‍යුහාත්මක ජෛව තොරතුරු සහ ආගණනීය ඖෂධ සොයාගැනීම් පිළිබඳ පුහුණු පාඨමාලාව

IBMBB විසින් සංවිධානය කරන ලද ව්‍යුහාත්මක ජෛව තොරතුරු සහ ආගණනීය ඖෂධ සොයාගැනීම පිළිබඳ පුහුණු පාඨමාලාව 2023 ජුනි 26 සිට 30 දක්වා IBMBB පරිශ්‍රයේදී සාර්ථකව පැවැත්විණි. මෙම වැඩමුළුව සඳහා සම්පත්දායකත්වය සපයන ලද්දේ මහාචාර්ය සමීර සමරකෝන් (IBMBB), ආචාර්ය කනිෂ්ක සේනාතිලක (IBMBB), ආචාර්ය නිරූපා නාගරත්නම් (ව්‍යවහාරික ව්‍යුහාත්මක සොයාගැනීම් සඳහා ජෛව නිර්මාණ මධ්‍යස්ථානය, ඇරිසෝනා ප්‍රාන්ත විශ්ව විද්‍යාලය, AZ (ASU) ඇ.එ.ජ. (IBMBB හි ආදි විද්‍යාර්ථී) සහ ආචාර්ය ඔලුලෝ පීටර් (වෛද්‍ය විද්‍යාලය, කෙන්ටකි විශ්ව විද්‍යාලය, ඇ.එ.ජ. (IBMBB ආදි විද්‍යාර්ථී), ආචාර්ය අරබින්ද ගෝෂ් (පරිගණක ජීව විද්‍යා හා ජෛව තාක්ෂණ දෙපාර්තමේන්තුව මහාපුරුෂ ශ්‍රීමන්ත සංකරදේව විශ්වවිද්‍යාලය, ඉන්දියාව), නිර්මාල් පෙරේරා මහතා (IBMBB), මිෂාල් ෆයිසාන් මහතා (IBMBB) සහ කාංචන සේනානායක මහතා IBMBB) විසිනි.

විදේශීය සිසුන් ඇතුළු 24 දෙනෙකු මීට සහභාගී වූ අතර පුහුණු පාඨමාලාවට සහභාගිවූවන්ට ඖෂධ සොයාගැනීම් සහ ව්‍යුහාත්මක ජෛව තොරතුරු පිළිබඳ දැනුම පුළුල් කර ගැනීමට හැකි විය.

පුහුණු පාඨමාලාව ඖෂධ සොයා ගැනීම, ප්‍රෝටීන් ව්‍යුහ ආකෘති නිර්මාණය, අණුක නිවේශනය, අණුක ගතික අනුහුරුකරණ, ADMET, QSAR යනාදී අංශවල ප්‍රායෝගික අත්දැකීම් සමඟින් න්‍යාය සහ ප්‍රායෝගික කරුණු ආවරණය කරන ලදී.

පුහුණු පාඨමාලාවට සහභාගීවූවන්ට ආගණනීය ඖෂධ සොයාගැනීම් පිළිබඳ ඔවුන්ගේ දැනුම පුළුල් කිරීමට ඉඩ සැලසිනි. ව්‍යාපාර සංවර්ධන ඒකකය සම්බන්ධීකරණ සහය ලබා දෙමින් පාඨමාලා සංවර්ධනයට සහ ස්ථාපිත කිරීමට විශාල දායකත්වයක් ලබා දී ඇත.





ප්‍රතිශක්තිවේදය පිළිබඳ පුහුණු පාඨමාලාව

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායනවේදය, අණුක ජෛවවේදය සහ ජෛව තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද ප්‍රතිශක්තිකරණ ශිල්පීය ක්‍රම පිළිබඳ පුහුණු පාඨමාලාවක් 2023 ජූලි 10 සිට 14 දක්වා IBMBB පරිශ්‍රයේදී සාර්ථකව පවත්වන ලදී.

වෛද්‍ය නිලධාරීන්, ආචාර්යවරුන්, විද්‍යා උපාධිධාරීන්, විද්‍යා උපාධි අපේක්ෂකයින් සහ විද්‍යාර්ථීන් මෙන්ම අසුදුසුකම් (පෙළ/උ) .ස.පො. .සහිත පුද්ගලයෙක්ද සහභාගිවූවන් අතර විය

පුහුණු පාඨමාලාව මගින් සෛල වෙන් කිරීමේ ක්‍රම සුදු ,රුධිරාණු රෝපණය , සෛල ගණන ක්‍රම, ප්‍රතිශක්තිකරණ සෛලවල ක්‍රියාත්මකභාවය සඳහා පරීක්ෂණ සහ ප්‍රතිශක්තිකරණ පරීක්ෂණ) ELISA, IFA, Immunochromatography ,(SDS-PAGE සහ Western Blotting යන ප්‍රායෝගික සංරචක ආවරණය කරන ලදී.
මෙම පුහුණු පාඨමාලාව සහභාගිවන්නන්ට ප්‍රතිශක්තිකරණ ශිල්පීය ක්ෂේත්‍රයේ තම දැනුම සහ ප්‍රායෝගික විශේෂඥතාව පුළුල් කර ගැනීමට මහඟු අවස්ථාවක් විය.





පර්යේෂණ ක්‍රියාකාරකම්

නිවර්තන - පරපෝෂිත හා බෝවන රෝග, අණුක වෛද්‍ය විද්‍යාව, පුරාණ DNA අධ්‍යයනය, ශාක අණුක ජීව විද්‍යාව, පරිවෘත්තීයවේදය, අණුක ප්‍රතිශක්ති විද්‍යාව සහ ප්‍රතිශක්තිකරණ රෝග විනිශ්චය, ඖෂධීය ශාක, සත්ව විශේෂ අණුක හඳුනාගැනීම, භාවනාව සහ සෞඛ්‍යය, කාර්මික වශයෙන් වැදගත් ක්ෂුද්‍ර ජීවීන්ගේ අණු හඳුනා ගැනීම යන ක්ෂේත්‍රවල පර්යේෂණ වැඩසටහන් ගණනාවක් IBMBB හි ක්‍රියාත්මක වෙමින් පවතී.

2022 වර්ෂය තුළ කාර්මික යෙදුම් සහිත පර්යේෂණ ව්‍යාපෘති කිහිපයක් ද ක්‍රියාත්මක කරන ලදී. සෑම පර්යේෂණ වැඩසටහනකටම ආයතනයේ අධ්‍යයන සහ අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලයේ සහ සහයෝගී විද්‍යාඥයින්ගේ අධීක්ෂණය යටතේ දර්ශනපති / දර්ශනසූරී සහ විද්‍යාපති සිසුන් සඳහා පර්යේෂණ පුහුණුව ලබා දෙන ව්‍යාපෘති කිහිපයක් සිදුකෙරිණි. සිසුන්, පර්යේෂණ ව්‍යාපෘති සහ අධීක්ෂකවරුන් පහත වගුවේ ලැයිස්තුගත කර ඇත.

සම-සමාලෝචිත, සුවිගත, ජාත්‍යන්තර සඟරාවල පළ වූ මුලු පර්යේෂණ පත්‍රිකා සංඛ්‍යාව 22 කි. ජාත්‍යන්තර සාරාංශ ඇතුළු විද්‍යාත්මක රැස්වීම්වලදී පර්යේෂණ සන්නිවේදනයන් 32 ක් ඉදිරිපත් කරන ලදී.

පර්යේෂණයේ මාතෘකාව	පර්යේෂණ කණ්ඩායම	ප්‍රදානය
ආසාදක රෝග		
බරවා		
විභව්‍ය ඖෂධ ඉලක්ක හඳුනා ගැනීම සඳහා නව පරම්පරාවේ අනුක්‍රමික (NGS) තාක්ෂණයන් භාවිතා කරමින් *Setaria digitata* ජෙනෝමය පිළිබඳ අධ්‍යයනයන් 2023 දී ආචාර්ය උපාධි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතිනි.	මහාචාර්ය එරික් බොංගකැමී - රුඩ්ලොෆ් (උප්සලා විශ්ව විද්‍යාලය, ස්වීඩනය), මහාචාර්ය එරික් කරුණානායක (IBMBB) හා මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් (IBMBB) **දර්ශනසූරී ශිෂ්‍ය : කාංචන එස්. සේනානායක මහතා**	ස්වීඩන සබැඳි ප්‍රදාන.
ලෙප්ටොස්පයිරෝසිස් (මී උණ)		
බරපතලකමේ විවිධත්වයන් සහිත ලෙප්ටොස්පයිරෝසිස් රෝගීන්ගෙන් ඉවත් කරගනු ලැබූ **Leptospira** ප්‍රවේණිදර්ශ සහ මස්තු දර්ශ හඳුනා ගැනීම මෙම **NRC** ප්‍රදානයේ අවසන් වාර්තාව ප්‍රකාශනය **2023** ඔක්තෝම්බර් මාසයේදී ඉදිරිපත් කරන ලදී.	මහාචාර්ය හඳුන්නෙත්ති ශිරෝමා (IBMBB), ජාතික පර්යේෂණ සභාව (NRC -17-098 මහාචාර්ය වීරසේන, ජගත්ප්‍රිය මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC) මහාචාර්ය සේනක රාජපක්ෂ **ස්වේච්ඡා පර්යේෂණ සහකාර - යොමේන්ද්‍රා ද සිල්වා මිය**	

ගවයින් තුළ ලෙප්ටොස්පයිරෝසිස් රෝග විනිශ්චය: පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව සංසන්දනය කිරීම සහ අභ්‍යන්තර ලෙප්ටොස්පිරා ප්‍රතිදේහජනක හඳුනාගැනීමේ පරීක්ෂණය

පර්යේෂණ අධ්‍යයනය 2023 දී සිදු වෙමින් පැවතිනි.

මහාචාර්ය සිසිර පතිරණ, මහාචාර්ය සුනිල් ප්‍රේමවංශ, මහාචාර්ය ජයන්ත රාජපක්ෂ, ආචාර්ය අමා ජයවර්ධන
විද්‍යාපති ශිෂ්‍ය: චතුර රණතුංග මහතා

MSc-CMI
වැඩසටහන් ප්‍රතිපාදන

ඩෙංගු			
ස්ථාවර උෂ්ණත්ව යටතේ ලූප භාවිතයෙන් RNA ගුණනය කිරීමෙන් (RT –LAMP) සිදුවන වර්ණ විපර්යාස හරහා ඩෙංගු ආසාදිත මදුරුවන් (Aedes mosquitoes) තුළ පවතින ඩෙංගු වෛරස කාණ්ඩ හඳුනා ගැනීම සඳහා අඩු පිරිවැය හා නවීන වාහක මදුරු සමීක්ෂණ මෙවලමක් ස්ථාපිත කිරීම. 2023 දී ආචාර්ය උපාධි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතිනි.	PI: විශේෂඥ වෛද්‍ය හසිත තිසේරා, අධ්‍යක්ෂ - ජාතික ඩෙංගු පාලන ඒකකය (NDCU) (දැනට සෞඛ්‍ය අමාත්‍යාංශයේ වසංගත රෝග විද්‍යා ඒකකයේ) මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ වීරසේන (IBMBB) මහාචාර්ය සිසිර පතිරණ (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), ආචාර්ය සුබාෂිනි ආර්යප්‍රේම (ජීව විද්‍යාඥ, ඇනස්ටේසියා මදුරු පාලන දිස්ත්‍රික්කය, ෆ්ලොරිඩා, USA) ආචාර්ය රුෂිකා පෙරේරා, සහාය මහාචාර්ය (කොලරාඩෝ රාජ්‍ය වි. වි, USA) **දර්ශනපති /දර්ශනසූරී ශිෂ්‍ය : සකුන්තලා ජානකි (කීට විද්‍යාඥ, NDCU)**	ජාතික පර්යේෂණ සභාව ආචාර්ය එච් . තිසේරාට (NRC-19-065)	
ඩෙංගු වෛරසය ආසාදනය වූ අවුරුදු 5-15 අතර ළමුන්ගේ රුධිර ප්‍රතිඔක්සිකාරක ධාරිතා මට්ටම් කෙරෙහි විටමින් E අතිරේකයේ බලපෑම පර්යේෂණ අධ්‍යයනය 2023 දී සිදු වෙමින් පැවතිනි.	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති, මහාචාර්ය පූජිත වික්‍රමසිංහ මහාචාර්ය සිසිර පතිරණ, ආචාර්ය දුලානි සමරනායක, කෞෂල්‍ය අනුරාධ මයා, ආචාර්ය දිලානි රුක්ෂලා **විද්‍යාපති ශිෂ්‍ය : ස්ටෙෆනි දුරෙයිසාමි මිය**	CMI ප්‍රතිපාදන	වැඩ සටහන්
ඩෙංගු වෛරසය ආසාදනය වූ අවුරුදු 5-14 අතර ළමුන්ගේ රුධිර ප්‍රතික්‍රියාශීලී නයිට්‍රජන් අතරමැදි මට්ටම්වලට විටමින් E අතිරේකයේ බලපෑම පර්යේෂණ අධ්‍යයනය 2023 දී සිදු වෙමින් පැවතිනි.	මහාචාර්ය සිසිර පතිරණ, මහාචාර්ය පූජිත වික්‍රමසිංහ මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති, ආචාර්ය දිලානි රුක්ෂලා ආචාර්ය දුලානි සමරනායක, කෞෂල්‍ය අනුරාධ මයා **විද්‍යාපති ශිෂ්‍ය : මීනු රොඩ්‍රිගෝ මිය**	CMI ප්‍රතිපාදන	වැඩ සටහන්
ඩෙංගු වෛරසය ආසාදනය වූ අන්තරාසර්ග සෛල කෙරෙහි සත්දරණී (SD) හි සනාල ප්‍රතිශක්ති උත්තේජක බලපෑම පර්යේෂණ අධ්‍යයනය 2023 දී සිදු වෙමින් පැවතිනි.	ආචාර්ය භාග්‍යා දීපවන්දි, මහාචාර්ය සිසිර පතිරණ, සඳුනි ද කොස්තා මිය, මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති **විද්‍යාපති ශිෂ්‍ය : චින්තනී ද සිල්වා මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන	

ක්ෂය රෝගය		
ප්‍රති මයිකොබැක්ටීරියා කාරක ලෙස අයන පොම්ප, අයන නාලිකා අනුකූලක හා විටමින් ඩී පිළිබඳ නාලස්ථ ඇගයුම 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය සිසිර පතිරණ (IBMBB), ආචාර්ය නිලන්ති සේනානායක (UoC), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB) **විද්‍යාපති ශිෂ්‍ය : වෛද්‍ය තිළිණි අබේකෝන්**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
Mycobacterium tuberculosis මගින් උත්තේජනය කරන ලද THP-1 ව්‍යුත්පන්න මානව මහාභක්ෂාණු මත අයන පරිවහන අනුකූලක සහ විටමින් D වල ප්‍රතිශක්තිකරණ අනුකූලතාවය විද්‍යාපති ව්‍යාපෘතිය නිම කරන ලද අතර 2023 දී නිබන්ධනය ඉදිරිපත් කරන ලදී.	මහාචාර්ය සිසිර පතිරණ (IBMBB), ආචාර්ය නිලන්ති සේනානායක (UoC), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB) **විද්‍යාපති ශිෂ්‍ය : අමිලා නන්දසේන මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
SARS-CoV-2		
ශ්‍රී ලංකාවෙහි රෝගීන්ගේ අභ්‍යන්තරික IgG සහ IgM ELISA භාවිතයෙන් තක්සේරු කරන ලද ප්‍රතිදේහ ප්‍රතිචාරය සමග රෝග උග්‍රත්වය සහ වෛරසයේ ප්‍රවේණික සම්බන්ධතාව හදුනාගැනීම 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය පී. පී. එස්. එල්. පතිරණ (IBMBB), මහාචාර්ය ඉනෝකා පෙරේරා (UOC), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), ජේමිස් තම්බිරාජා මහතා (IBMBB), දක්ෂිකා ගංගානි මිය(IBMBB), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UOC), මහාචාර්ය සේනක රාජපක්ෂ (UOC), තේජානී පෙරේරා මිය (UOC), සහන් සිරිවර්ධන මහතා (UOC), ආචාර්ය රජීව ද සිල්වා (MRI), ආචාර්ය ධනුෂ්ක දසනායක (MRI), ආචාර්ය සුරංග මානිල්ගම (MoH), ආචාර්ය රෝහිත මුතුගල (MoH), ආචාර්ය ධනංජා නාමලි (MoH), ආචාර්ය ගයානි ප්‍රේමවංස (MoH), ආචාර්ය සාරංග සුමතිපාල (MoH), මහාචාර්ය ඇන්ඩ්‍රියාස් නීෂේ (රොබට් කොක් ආයතනය, ජර්මනිය) **පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක: ආචාර්ය පේශල ගුණසේකර (IBMBB) (2021 ඔක්තෝබර් දක්වා),** **ආචාර්ය භාග්‍යා දීපචන්දි(IBMBB)**	ජර්මනියේ රොබට් කොක් ආයතනය විසින් මූල්‍ය අනුග්‍රහය දක්වන IDEA ව්‍යාපෘතිය
ස්පයික් ප්‍රෝටීන් සමඟ අන්තර්ක්‍රියා කරන ලද මානව නියුට්‍රොෆිල්ස් මත සත් දරනී (*SD*) හි *in vitro immunomodulatory* බලපෑම් *SARS-CoV-2* හි ප්‍රෝටීන් *1* පර්යේෂණ අධ්‍යයනය 2023 දී සිදු වෙමින් පැවතිනි.	මහාචාර්ය සිසිර පතිරණ , මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති, කෞශල්‍ය අනුරාධ මහතා, ආචාර්ය භාග්‍යා දීපචන්දි **විද්‍යාපති ශිෂ්‍ය : ගෞරි කෞෂල්‍යා මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන

වෛරස එන්සෙෆලයිටිස්		
ශ්‍රී ලංකාවේ වෛද්‍ය විද්‍යාත්මක වශයෙන් වැදගත් වවුලන්ගේ ව්‍යාධිජනක රෝගකාරක සහ වෛරස් එන්සෙෆලයිටිස් රෝගී අවස්ථා පිළිබඳ ප්‍රතිශක්තිකාරක හා අණුක හඳුනා ගැනීම 2023 දී දර්ශනසූරී වැඩ සටහන 2022 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය විපුල යාපා, සම්මානිත මහාචාර්ය සුනිල් ප්‍රේමවංස, මහාචාර්ය ඇන්ඩ්‍රියාස් නීෂේ, ආචාර්ය ක්ලෝඩියා කෝල්, මහාචාර්ය ඉනෝකා පෙරේරා, ආචාර්ය ගයානි ප්‍රේමවන්ස, මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන, මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති **දර්ශනපති/ දර්ශනසූරී ශිෂ්‍ය: තේජානි පෙරේරා මිය**	ජර්මනියේ රොබට් කොක් ආයතනය විසින් මූල්‍ය අනුග්‍රහය දක්වන IDEA ව්‍යාපෘතිය
අණුක වෛද්‍ය විද්‍යාව		
පිළිකා සහ පිළිකා කළ සෛල		
විරල පියයුරු පිළිකා ආශ්‍රිතව සී ලූපයෙහි ඇති වන මයිටොකෝන්ඩ්‍රියානු DNA විකෘතතාවල සහ මයිටොකෝන්ඩ්‍රියානු DNA ඒකකාණ්ඩවල ස්වභාවය හඳුනා ගැනීම 2023 දී ආචාර්ය උපාධි ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පැවතිනි.	මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන් (ප්‍රධාන අධීක්ෂක), ආචාර්ය රුවන්දි රණසිංහ (සම අධීක්ෂක), වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (සම අධීක්ෂක,ජාතික පිළිකා ආයතනය) **දර්ශනසූරී ශිෂ්‍ය : ජේ.ටී. කොතලාවල මෙය**	කොතලාවල මහත්මිය ලබාගත් ආචාර්ය උපාධි ශිෂ්‍යත්වය (NSF/SCH/2016/004)
ශ්‍රී ලංකාවේ සිංහල ජනවාර්ගික රෝගීන්ගේ විරල පියයුරු පිළිකා සඳහා අවදානම් සාධක වශයෙන් මයිටොකෝන්ඩ්‍රියල් ප්‍රවේණි අණුවල විකෘතකා සහ බහුරූපිතා දර්ශනපති/ දර්ශනසූරී වැඩ සටහන 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්යකමනි එච්. තෙන්නකෝන්(ප්‍රධාන අධීක්ෂක), ආචාර්ය රුවන්දි රණසිංහ (සම අධීක්ෂක), වෛද්‍ය කනිෂ්ක ද සිල්වා (සම අධීක්ෂක, ජාතික පිළිකා ආයතනය) **දර්ශනපති/දර්ශනසූරී ශිෂ්‍ය: එල්. ජයසේකර මිය**	NRC ප්‍රදානය මහාචාර්ය කමනි තෙන්නකෝන්ට (NRC-17- 020)
මධ්‍යසාර නොවන ටෝහෙපටයිටිස් (steatohepatitis (NASH)) ආශ්‍රිත සිරෝසිස් වල යාකෘත් සෛලීය පිළිකා (HCC) සඳහා පුරෝකථනසලකුණු සඳහා ජාන විශ්ලේෂණය දර්ශනපති/ දර්ශනසූරී වැඩ සටහන 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුදේශිනී හේවගේ (ප්‍රධාන අධීක්ෂක), මහා. රොහාන් සිරිවර්ධන (සම අධීක්ෂක - කැළණිය විශ්වවිද්‍යාලය), මහාචාර්යකමනි තෙන්නකෝන් (සම අධීක්ෂක - IBMBB), මහාචාර්ය මදුනිල් නිරිඇල්ල (සම අධීක්ෂක - කැළණිය විශ්වවිද්‍යාලය), **දර්ශනපති/ දර්ශනසූරී ශිෂ්‍ය : සෞම්‍යා සමරසිංහ මිය**	NRC ප්‍රදානය ආචාර්ය සුදේශිනී හේවගේට (NRC-19-030)

POLG1 ජානයේ exon 3 හි ජන්මානුපථ ප්‍රභේද: පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව ප්‍රශස්ත කිරීම සහ තෝරාගත් සිංහල පුද්ගලයන් කිහිප දෙනෙකු තුළ මූලික විශ්ලේෂණය MSc ව්‍යාපෘතිය අවසන් කරන ලද අතර උපාධි නිබන්ධනය 2023 මැයි මාසයේදී ඉදිරිපත් කරන ලදී	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක),ජොආන් කොතලාවල මෙය (සම-අධීක්ෂක), මහාචාර්ය කමනි එව් තෙන්නකෝන් (සම-අධීක්ෂක) **විද්‍යාපති ශිෂ්‍ය : චමල්කා මනෝහාරි කාරියවසම් මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
විරල ගණයෙහි පියයුරු පිළිකා රෝගීන් සඳහා මයිටොකොන්ඩ්‍රියල් ප්‍රතිලේඛන සාධක A (TFAM) හි තෝරාගත් එක්සෝන පොලිමරේස් දාම ප්‍රතික්‍රියා (PCR) ප්‍රශස්තකරණය සහ විස්තාරණය කිරීම BSc ව්‍යාපෘතිය අවසන් කරන ලද අතර 2023 මැයි මාසයේදී BSc නිබන්ධනය ඉදිරිපත් කරන ලදී	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක), ජොආන් කොතලාවල මෙය (සම-අධීක්ෂක) **විද්‍යාවේදී ශිෂ්‍ය: එම්. ෆාෂා මෙනවිය, විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය**	අරමුදල්: ආචාර්ය රුවන්දි රණසිංහගේ පර්යේෂණ අරමුදල්
3T3-L1 මූෂික ෆයිබ්‍රොබ්ලාස්ට් (3T3L1) සෛල ඇඩිපොසයිට් බවට විභේදනයේදී (ඇඩිපොනෙක්ටින් ප්‍රකාශනයේ වෙනස්වීම් අනුකලනය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය බී.පී.ගල්හේන ආචාර්ය සමීර ආර් සමරකෝන් ආචාර්ය සුපුන් විජයසිංහ **විද්‍යාපති ශිෂ්‍ය : පියුමි දිසානායක මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
B සෛල ලිම්පෝමා ලෙස ප්‍රතිශක්තිකරණ රසායන විද්‍යාව මගින් කලින් තහවුරු කළ වසා ගැටිති ජෛවේක්ෂා වල BCL2 විකෘතිතා 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය බී.පී.ගල්හේන ආචාර්ය කනිෂ්ක සේනාතිලක නිර්මානී කළුආරච්චි මිය **විද්‍යාපති ශිෂ්‍ය : සමුදු කරුණාතිලක මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
පිළිකා ප්‍රාථමික සෛලවල ග්ලූකෝස් වල පරිවෘත්තිය හා සම්බන්ධ තෝරාගත් ජානවල ප්‍රකාශනයට ග්‍රැෆින් ඔක්සයිඩ් බලපෑම 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සමීර ආර් සමරකෝන් ආචාර්ය මෙරාන් එදිරිවීර මංජු ගුණවර්ධන මහතා **විද්‍යාපති ශිෂ්‍ය : නවෝද්‍ය සිල්වා මහතා**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)

මානව DNA විවල්‍යතා සහ පැරණි DNA අධ්‍යයන		
ශ්‍රී ලංකාවේ අතීතයේ විසූ මානවයන් පිළිබඳ අණුක පුරාවිද්‍යාත්මක අධ්‍යයනය: උඩුපියන්ගල්ගේ සහ අළුගල්ගේ ලෙන් තුළින් ලබාගත් අස්ථි කොටස් ආශ්‍රයෙන් කරනු ලබන මයිටෝකොන්ඩියල් අණුක ප්‍රවේණි ද්‍රව්‍ය සහ අණුක ලිංග නිර්ණ අධ්‍යනය. දර්ශනසූරී උපාධියක් 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක), මහාචාර්යකමනි එච්. තෙන්නකෝන් සම අධීක්ෂක), මහාචාර්ය රාජ් සෝමදේව (සම අධීක්ෂක, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැළණිය වි.වි.), ආචාර්ය නිරාජ් රායි (සම අධීක්ෂක, BSIP, ලක්නව්, ඉන්දියාව) **දර්ශනපති/දර්ශනසූරී ශිෂ්‍ය : ඒ. එස්. ප්‍රනාන්දු මිය**	NRC ප්‍රදානය ආචාර්ය රුවන්දි රණසිංහට (NRC- 17-042)
ශ්‍රී ලංකාවේ සිංහල, ශ්‍රී ලාංකික දෙමළ හා වැදි ජනගහණයන්හි පූර්ණ මයිටොකොන්ඩ්‍රියල් ජෙනෝමය පිළිබඳ සවිස්තර විශ්ලේෂණය දර්ශනපති වැඩ සටහන 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක), මහාචාර්යකමනි එච්. තෙන්නකෝන්(සම අධීක්ෂක) ජෙ. මහාචාර්යගාමිණී අධිකාරී (සම අධීක්ෂක) **දර්ශනපති/දර්ශනසූරී ශිෂ්‍ය : අංජනා හර්ෂණී ජයසිංහ වැලිකල මිය**	පර්යේෂණයේ මුල් කොටස අධීක්ෂකවරුන්ගේ පර්යේෂණ අරමුදල්වලින් කරගෙන යමින් පවතී. තවදුරටත් අරමුදල් යොදවනු ඇත.
නියැන්ඩර්තාල් ප්‍රවේණික Covid-19 ජානමය වෙනස්කම්: පොලිමරේස් දාම ප්‍රතික්‍රියා තත්ත්වයන් සහ සංඛ්‍යාත විශ්ලේෂණය තක්සේරු කිරීම 2023 මැයි මස ව්‍යාපෘතිය සම්පූර්ණ කර නිබන්ධනය බාර දෙන ලදී .	ආචාර්ය රුවන්දි රණසිංහ (ප්‍රධාන අධීක්ෂක), මහාචාර්යකමනි එච්. තෙන්නකෝන්(සම අධීක්ෂක), අමාලි ප්‍රනාන්දු මිය (සම අධීක්ෂක) **විද්‍යාපති ශිෂ්‍ය : සම්මානි හිමාෂා ගලගමආරච්චි මිය**	IBMBB විද්‍යාපති අධ්‍යයන
ජාන විකෘතිතා පිළිබඳ අණුකවිද්‍යාත්මක අධ්‍යයන		
බහිෂ්කේතනික තයිරොයිඩ් ග්‍රන්ථීය සහිත ශ්‍රී ලාංකික රෝගීන් සමූහයක NKX2-5 විකෘති විශ්ලේෂණය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුදේශිනි හේවගේ, ආචාර්ය සුමාධි ද සිල්වා, ආචාර්ය නවෝදා අතපත්තු **විද්‍යාපති ශිෂ්‍ය : නිර්මානි ෆොන්සේකා මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ස්ථිර සංජානනීය මන්ද තයිරොයිඩ්වාදය සහිත ශ්‍රී ලාංකික රෝගීන් සමූහයක DUOX2 විකෘතිය පිළිබඳ විශ්ලේෂණය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුදේශිනි හේවගේ, ආචාර්ය සුමාධි ද සිල්වා, ආචාර්ය නවෝදා අතපත්තු **විද්‍යාපති ශිෂ්‍ය : පිරසන්තිනි තයාපරන් මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ශ්‍රී ලංකාවේ 46 XY DSD දරුවන් මුළනුවක මිනිස් ලිංග නිර්ණය කිරීමේ ජානවල ලෝපන/අනුපිටපත් හඳුනාගැනීම 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුදේශිනි හේවගේ ආචාර්ය සුමාධි ද සිල්වා ආචාර්ය නවෝදා අතපත්තු **විද්‍යාපති ශිෂ්‍ය : ඩැනියෙල් සංජීව ෆර්ඩිනැන්ඩස් මහතා**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
NAFLD ව්‍යාධිජනකයට සම්බන්ධ රක්තපාත යකඩ සාන්ද්‍රණය තුළ අන්තර්ගත වූ ජාන බහුරූපතා 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය සුමාධි ද සිල්වා ආචාර්ය සුදේශිනි හේවගේ මහාචාර්යකමනි එච්. තෙන්නකෝන් **විද්‍යාපති ශිෂ්‍ය : කාවින්දි සඳමාලි සායක්කාර මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)

ශාක අණුක ජෛවවේදය		
රතු තේ ආබද්ධයන්හි ඇන්තොසයනින් (Anthocyanins) පැනිකඩ	ආචාර්ය එම්. ඒ. බී. රණතුංග සහ J. ඩී. කෝට්ටව ආරච්චි (තේ පර්. ආයතනය), මහාචාර්ය නිමල් පුණ්‍යසිරි	තේ පර්යේෂණ ආයතනය
ජෛව සංස්ලේෂක එන්සයිම සහ ෆ්ලේවනොයිඩ් වල ජෛව සංස්ලේෂණය ප්‍රකාශ කිරීම කෙරෙහි තේ වගාවෙහි (*Camellia sinensis*) බුබුලු අංගමාර ආසාදනයෙහි (*Exobasidium vexans* infection) බලපෑම අවසාන නිබන්ධනය 2023 දී ඉදිරිපත් කරන ලදී.	විමර්ශකයන්: මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන, මහාචාර්ය නිමල් පුණ්‍යසිරි, ආචාර්ය එල්.එන්.ආර්. ගුණරත්න **විද්‍යාපති ශිෂ්‍ය : කේ. ඒ. එම්. ජේ. එදිරිසිංහ මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
තේ දළු වල බුබුළු අංගමාරය රෝගයේ විනිවිද පෙනෙන අවධියේදී ෆ්ලේවනොයිඩ් නිෂ්පාදනය සහ ෆ්ලේවනොයිඩ් ජෛව සංස්ලේෂණ එන්සයිම ප්‍රකාශනය මත Exobasidium vexans ආසාදනයේ බලපෑම අවසාන නිබන්ධනය 2023 දී ඉදිරිපත් කරන ලදී.	මහාචාර්ය නිමල් පුණ්‍යසිරි මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන ආචාර්ය නිලූපා ගුණරත්න **විද්‍යාපති ශිෂ්‍ය : විඩාරා අනුෂොරෝ මහතා**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
'බිම් කෙසෙල්' දේශීය කෙසෙල් ප්‍රභේදයේ ව්‍යාජ කඳේ උසට වගකිව යුතු ජාන හඳුනා ගැනීම 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන **විද්‍යාපති ශිෂ්‍ය : සචා අබු සහීඩ් මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ශ්‍රී ලංකාවේ තෝරා ගැනුනු සමහර Liparis(Orchidacea) විශේෂයන් පිළිබඳ අණුක වංශ ප්‍රවේණික අධ්‍යයනයක් 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර මහාචාර්ය ඇලෙසියෝ පැපිනි (Uni Firenze, ඉතාලිය) මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන **විද්‍යාපති ශිෂ්‍ය : උපමිතා සප්තකී ගුණවර්ධන මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
ශ්‍රී ලංකාවේ *Tragia spp.*(වල් කහඹිලියා) හි තිරු කේතකරණය 2023 දී ව්‍යාපෘතිය නිමවූ අතර දැනට විභාගයට ගැනෙමින් පවතී.	මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන ආචාර්ය ටී එම් එස් ජී තෙන්නකෝන් ආචාර්ය එල් එන් ආර් ගුණරත්න **විද්‍යාපති ශිෂ්‍ය : චර්ෂිනී ජේ පෙරේරා මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)
At354 සහ Bg352 සහල් වර්ගවල තෝරාගත් ලවණ ප්‍රතිචාරක ජානවල ඇලලික් සහ ප්‍රකාශන වෙනස්කම් පිළිබඳ අධ්‍යයනයක්. අවසාන නිබන්ධනය 2023 දී ඉදිරිපත් කරන ලදී.	මහාචාර්ය එන්.එස්. කෝට්ටෙආරච්චි, මහාචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන සහ ආචාර්ය එන්. ගුණරත්න **විද්‍යාපති ශිෂ්‍ය : ඩී.පී.රුවිනි ප්‍රභා පීරිස් මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)

පරිවෘත්තීයවේදය		
සහල් වල ඇමයිනෝ අම්ල විශ්ලේෂණය අවසාන නිබන්ධනය 2023 දී ඉදිරිපත් කරන ලදී.	විමර්ශී ලියනාරච්චි (ITI), මහාචාර්ය කේ.ආර්. මහානාම (කොළඹ විශ්වවිද්‍යාලය), ආචාර්ය එච්.පී.පී.එස්. සෝමසිරි (ITI), මහාචාර්ය නිමල් පුණ්‍යසිරි (IBMBB)	කාර්මික තාක්ෂණ ආයතනය
ඖෂධ පරිවෘත්තීය	ආචාර්ය තුසිත වික්‍රමසිංහ සහ ඔහුගේ කණ්ඩායම, සායනික ජෛවරසායන අ.අංශය, වෛද්‍ය පීඨය, කැළණිය විශ්වවිද්‍යාලය සහ මහාචාර්යනිමල් පුණ්‍යසිරි IBMBB	කැළණිය විශ්වවිද්‍යාලය
ජීව විද්‍යාත්මකව ක්‍රියාකාරී නව ද්විතියික පරිවෘත්තිකයන්ගේ පැවැත්ම පැවැත්ම පිළිබඳව භූඔසෙහි ව්‍යුත්පන්න දිලීර විමර්ශනය කිරීම	**මහාචාර්ය නිමල් පුණ්‍යසිරි** ආචාර්ය නදීෂා ලෙව්කේ බණ්ඩාර මහාචාර්ය දිලිප් ද සිල්වා **විද්‍යාපති ශිෂ්‍ය : සිමිතියා සිවඥානසුන්දරම්** **රෙක්සන් මිය**	IBMBB විද්‍යාපති අධ්‍යයන
අණුක ප්‍රතිශක්තිවේදය, ප්‍රතිශක්ති සංඥානන විධි විද්‍යාව සහ ස්වයං ප්‍රතිශක්තිකරණ රෝග		
ප්‍රතිශක්ති ඌනතා ජාන විද්‍යාව		
නිර්ගැමාග්ලොබියුලින් රක්තයෙහි සායනික ලක්ෂණ පිළිබඳව සංසන්දනාත්මක විශ්ලේෂණයක් සහ ශ්‍රී ලංකාවේ X- සම්බන්ධක නිර්ගැමාග්ලොබියුලින් රක්තය රෝග නිර්ණය සඳහා PCR පාදක නිශ්චයනයක් ප්‍රශස්තකරණය අවසාන නිබන්ධනයක් 2023 දී ඉදිරිපත් කරන ලදී.	ආචාර්ය රජීව ද සිල්වා (MRI), ආචාර්ය ධනුෂ්කා දසනායක(MRI), ආචාර්ය කණිෂ්කා සෙනරත්, ජේම්ස් තම්බිරාජා මහතා **විද්‍යාපති ශිෂ්‍ය : නේරංජා සඳමිණී මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
ප්‍රතිශක්ති සංඥානන විධි විද්‍යාව		
ශ්‍රී ලංකාවේ තෝරාගන්නා ලද වඩාත් ප්‍රචලිත මස්තුදර්ශ /මස්තුදර්ශ කාණ්ඩවල ලෙප්ටොස්පයිරා ප්‍රතිදේහ රෝග විනිශ්චය සඳහා නුමුහුන් ක්ලෝනික ප්‍රතිදේහ නිෂ්පාදනය	මහාචාර්යශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය සේනක රාජපක්ෂ (කොළඹ විශ්වවිද්‍යාලය), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (කොළඹ විශ්වවිද්‍යාලය), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB). සහකාරක: ආචාර්ය ලිලානි කරුණානායක (වෛද්‍ය පර්යේෂණ ආයතනය). **දර්ශනසූරී ශිෂ්‍ය: දක්ෂිකා ගංගානි මිය**	ඉතාලි ජාන ඉංජිනේරු විද්‍යාව සහ ජෛව තාක්ෂණවේදය සඳහා වන ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්තිට, IBMBB (ICGEB-CRP LKA-17- 1)
නාල දාහක පරීක්ෂණ සඳහා ආදර්ශයක් ලෙස HL-60 promyeloblast සෛල පෙලෙන් වෙනස් වූ මහා භක්ෂාණු වල ප්‍රයෝජනය තක්සේරු කිරීම අධ්‍යයනය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය නර්මදා ප්‍රනාන්දු, මහාචාර්යසිසිර පතිරණ, දක්ෂිකා ගංගානි මිය **විද්‍යාපති ශිෂ්‍ය : ඉෂාරා ගයාත්‍රී මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
විවිධ බැක්ටීරියා වලින් වෙන් වූ ලිපොපොලිසැකරයිඩ (E. coli, Leptospira, Burkholderia) මගින් ප්‍රේරණය කරන ලද සනාල ප්‍රදාහක මට්ටම සංසන්දනය කිරීම අධ්‍යයනය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය නර්මදා ප්‍රනාන්දු , මහාචාර්යසුනිල් ප්‍රේමවංස මහාචාර්යඉනෝකා කොරයා, කෞශල්‍ය අනුරාධ මහතා **විද්‍යාපති ශිෂ්‍ය : ඉඳුවරි ගුණවර්ධන මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන

ciprofloxacin ප්‍රතිජීවකයට අසාත්මිකතා දක්වන රෝගීන්ගේ IgE නොවන මධ්‍යස්ථ බැසොෆිල් පරිහානිය සඳහා ප්‍රතිග්‍රාහකයක් වන Mrgprx2 ජානයේ අපගතාර්ථ පැවතීම සහ ක්‍රියාකාරීත්වයේ විකෘතිතා ඇතිවීම පිළිබඳ මූලික අධ්‍යයනය අධ්‍යයනය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්යශිරෝමා හඳුන්නෙත්ති, ආචාර්ය රජීව ද සිල්වා, ආචාර්ය ධනුෂ්ක දසනායක, ආචාර්ය කණිෂ්කා සෙනරත්, දක්ෂිකා ගංගානි මිය **විද්‍යාපති ශිෂ්‍ය : සුභාෂිනී රත්නායක මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
ස්වයං ප්‍රතිශක්තිකරණ රෝග		
Mtx ප්‍රතිකාරය යටතේ සුදුකබර රෝගය සහිත රෝගීන් සඳහා තෝරාගත් ප්‍රදාහක සහ ඔක්සිකාරක ආතති මැදිහත්කාරක පිළිබඳ තක්සේරුව විද්‍යාපති පර්යේෂණ කටයුතු 2023 දී ආරම්භ කරන ලදී.	ආචාර්ය නර්මදා ප්‍රනාන්දු, වෛද්‍ය ජනක අකරවිට, වෛද්‍ය වාලුක්‍ය ගුණසේකර, ෆාතිමා එස්. අබ්බාස්බෝයි මිය **විද්‍යාපති ශිෂ්‍ය : තිළිණි දිසානායක මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
ශ්‍රී ලංකාවේ සොරයිසිස් රෝගීන්ගේ Mtx ප්‍රතිකාර ප්‍රතිචාරය පුරෝකථනය කරන ජාන සලකුණු පිළිබඳ තක්සේරුව පිළිබඳ මූලික අධ්‍යයනය අධ්‍යයනය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය නර්මදා ප්‍රනාන්දු, ආචාර්ය ජනක අකරවිට, ආචාර්ය වාලුක්‍ය ගුණසේකර, ෆාතිමා එස්. අබ්බාස්බෝයි මිය **විද්‍යාපති ශිෂ්‍ය : ගයත්‍රී නයනජීවි මිය**	CMI වැඩ සටහන් ප්‍රතිපාදන

ඖෂධීය ශාක

ප්‍රති-ප්‍රදාහක, ප්‍රතිශක්තිකරණ, තුවාල සුවකාරක සහ ප්‍රති-ආසාත්මිකතා බලපෑම් සහිත ඖෂධීය ශාක පිළිබඳ පර්යේෂණ

අගිල් කොකා (*Erythroxylu monogynum*) සහ බට කිරිල්ල (*Erythroxylum zeylanicum*) ශාකවල ප්‍රතිශක්තිකරණ ක්‍රියාකාරිත්වය අධ්‍යනය කිරීම 2023 දී විද්‍යාපති උපාධිය පිරිනමන ලදී.	දිලානි රුක්ෂලා මිය (IBMBB), ජයනි කාරියවසම් මහත්මිය (IBMBB), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB) **විද්‍යාපති ශිෂ්‍ය : සජීවි ද සිල්වා මහතා**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
අධි රුධිර පීඩනය ඇති කරන ඇන්ජියොටෙන්සින් II මගින් සක්‍රිය කරන ලද THP-1 ව්‍යුත්පන්න මහා භක්ෂ මත නික (*Vitex negundo*) ශාකයෙහි ජලීය නිස්සාරකයෙහි නාලස්ථ ප්‍රතිශක්තිකරණ අනුකූලක බලපෑම් 2023 දී විද්‍යාපති උපාධිය පිරිනමන ලදී. .	මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), මහාචාර්ය සුනිල් ප්‍රේමවංස (UoC), ආචාර්ය රජීව ද සිල්වා (MRI), දිලානි රුක්ෂලා මිය (IBMBB) **විද්‍යාපති ශිෂ්‍ය : බොනිෆස් නියම්වෙයා මහතා (QECS ශිෂ්‍යත්වය 2020)**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
තුවාල සුව කිරීම සඳහා ලෝකපාලු (Mikania cordata) පත්‍ර නිස්සාරණයේ නාලස්ථ බලපෑම 2023 දී විද්‍යාපති උපාධිය පිරිනමන ලදී.	ආචාර්ය කණිෂ්කා සෙනරත් (IBMBB), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), අනුරාධ කෞෂල්‍ය මහතා (IBMBB) **විද්‍යාපති ශිෂ්‍ය : නයෝමි නවනීතා මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
පුපුල (*Vernonia zeylanica)* ශාකයෙහි Methanol Dichloromethane නිස්සාරකයෙහි *ප්‍රතිප්‍රදාහක ක්‍රියාකාරකම්වල ප්‍රතිශක්ති යාන්ත්‍රණය පිළිබඳ සනාල අධ්‍යයනය* 2023 දී විද්‍යාපති උපාධිය පිරිනමන ලදී.	ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), ආචාර්ය කණිෂ්කා සෙනරත් (IBMBB), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB) **විද්‍යාපති ශිෂ්‍ය : කපිල මහවත්ත මහතා**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
TrkA සහ p75 මානව ලියුකෝසයිට කෙරෙහි ලුණුවිල (*Bacopa monnieri*) පත්‍ර සහ කඳේ ජලීය නිස්සාරණයේ බලපෑම පිළිබඳ මූලික සනාල අධ්‍යයනය විද්‍යාපති අධ්‍යයනය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්යශිරෝමා හඳුන්නෙත්ති, ආචාර්ය ඩිල්ෂානි දිසානායක, ආචාර්ය දිලානි රුක්ෂලා, ජේමිස් තම්බිරාජා මහතා **විද්‍යාපති ශිෂ්‍ය : ඩෙබොරා හරිකිෂ්ණන් මිය**	MSc-CMI වැඩ සටහන් ප්‍රතිපාදන
තෝරාගත් ශ්‍රී ලංකාවට ආවේණික සහ ඖෂධීය ශාකයන්හි ප්‍රතිශක්තිකරණ, ප්‍රතිඔක්සිකාරක සහ ප්‍රතිබැක්ටීරීය ඵෙව ක්‍රියාකාරකම් දර්ශනපති / දර්ශනසූරී අධ්‍යයනය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය රාධිකා සමරසේකර (ITI), ආචාර්ය නර්මදා ප්‍රනාන්දු (IBMBB), ආචාර්ය ජී. ඩී. ලියනආරච්චි (ITI), මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (IBMBB) **දර්ශනපති/දර්ශනසූරී ශිෂ්‍ය : දුලිනි ජාගොඩ මිය**	ආචාර්ය රාධිකා සමරසේකර මහත්මියගෙන් අරමුදල් ලබා ගන්නා ලදී.

ඖෂධීය ශාකවල පිළිකා නාශක බලපෑම්		
අඹ (Mangifera indica -ඉන්දියාව) සහ ඇටඹ (*Mangifera zeylanica* - ශ්‍රී ලංකාව) විවිධ කොටස්වල ප්‍රතිපිළිකා සහ රේඩියෝ අභාජ්‍ය බලපෑම් සහ හරිත රජත නැනෝ සංයෝජිතවල බලපෑම පිළිබඳ නාලස්ථ සහ ජීවස්ථ අපිජනන විමර්ශනයන් දර්ශනපති අධ්‍යයනයක් 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්, ආචාර්ය සමීර සමරකෝන්, ආචාර්ය මෙරාන් එදිරිවීර (IBMBB), ආචාර්ය එන්. දේවිප්‍රියා හා ආචාර්ය වී. වඩිවේල් (ඉන්දියාව) **දර්ශනපති ශිෂ්‍ය/IBMBB: ඒ.ඒ.ඩී.එන්. පෙරේරා මහතා**	ඉන්දු -ශ්‍රී ලංකා ද්විපාර්ශවීය එකඟත්වය යටතේ විද්‍යා අමාත්‍යාංශයේ තාක්ෂණ හා පර්යේෂණ ප්‍රදානය.
පිළිකා නාශක ඖෂධ නිෂ්පාදනය දර්ශනපති / දර්ශනසූරී අධ්‍යයන තුනක් 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්යකමනි තෙන්නකෝන් , ආචාර්ය සමීර සමරකෝන්, මහාචාර්යඅයිරා තාබා, මහාචාර්ය ඊ. දිලිප් ද සිල්වා, මහාචාර්ය නීඩ්‍රා කරුණාරත්න (පේරාදෙනිය වි.වි.), ආචාර්ය ඒ. අධිකාරී (නේපාලය), මහාචාර්ය ඉක්බාල් වෙද්දී (පකිස්තානය), ආචාර්ය පූර්ණා පියතිලක (වයඹ විශ්වවිද්‍යාලය) ආචාර්ය ගෝමික උඩුගමසූරිය, ඇමෙරිකා එක්සත් ජනපදය. **පර්යේෂණ විද්‍යාඥයන් : කණිෂ්කා සේනාතිලක, ආචාර්ය මෙරන් එදිරිවීර** **දර්ශනපති/ දර්ශනසූරී සිසුන්: නිමේෂා වික්‍රමසිංහ මිය, ජේ. තුෂාන්තන් මයා, කැළුම් රත්නායක මහතා** **ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වූවන් හා විද්‍යාපති සිසුන්**	ජාතික විද්‍යා පදනම් ප්‍රදානය - RPHS/2016-C07, PI - මහාචාර්ය කමනි තෙන්නකෝන් හා ආචාර්ය සමීර සමරකෝන් (සම වි.)
වියපත්වීම වලක්වන (anti -aging) නව ශාකසාර නිෂ්පාදනයක ආගණනීය අනාවැකිය සහ සනාල වලංගුතාවය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය කණිෂ්කා සේනාතිලක, මහාචාර්යසමීර සමරකෝන් මහාචාර්ය ප්‍රසන්න ගල්හේන **විද්‍යාපති ශිෂ්‍ය : නිපුනි හැන්නදිගේ මිය**	IBMBB විද්‍යාපති අධ්‍යයන
පිළිකා ප්‍රාථමික සෛල කෙරෙහි මස්මොර *(Adenanthera Bicolor)* ශාකයෙන් වෙන් කර ගන්නා ලද සංයෝගයක ප්‍රති-පිළිකාකාරක බලපෑම *2023* දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	**ආචාර්ය සමීර සමරකෝන්** ආචාර්ය උමාප්‍රියදර්ශනී රාජගෝපාලන් මහාචාර්ය ප්‍රසන්න ගල්හේන **විද්‍යාපති ශිෂ්‍ය : මනුකල්ප බණ්ඩාර මහතා**	IBMBB විද්‍යාපති අධ්‍යයන
මොනර මල් *(Caesalpinia pulcherrima)* වෙතින් වෙන් කරන ලද ඩිටර්පීන් වල පිළිකා නාශක ක්‍රියාකාරකම් සහ සනාල විෂ තක්සේරුව සඳහා පරීක්ෂා කිරීම 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය සමීර සමරකෝන් ආචාර්ය කණිෂ්කා සේනාතිලක මහාචාර්ය ප්‍රසන්න ගල්හේන **විද්‍යාපති ශිෂ්‍ය : පනාපිටිය කංකානමලාගේ ශලිනි කෞෂල්‍යා විජේරත්න මිය**	IBMBB විද්‍යාපති අධ්‍යයන
කාර්මික යෙදවුම්		
ශ්‍රී ලාංකික වෙළෙඳපොළේ ඇති ඖෂධීය ශාක වටිටෝරුවක ප්‍රතිශක්තිකරණ උත්තේජක ක්‍රියාකාරකම් සහ ඒ හා බැඳි ප්‍රතිශක්තිකරණ යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යයනය දර්ශනසූරී අධ්‍යයනය 2023 දී අවසන් විය.	මහාචාර්යශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය ඕ.වී.ඩී.එස්.ජේ. වීරසේන (IBMBB), මහාචාර්ය ඒ. අබේසේකර, ලින්ක් ලංකා නැවුරල් ප්‍රොඩක්ට්ස් ලිමිටඩ් **දර්ශනසූරී ශිෂ්‍ය : ලෝෂිණී රණවීර මිය**	මේ දර්ශනපති / දර්ශනසූරී අධ්‍යයනය සඳහා ලින්ක් නැවුරල් ප්‍රොඩක්ට්ස් සහ

		කොළඹ වි. විද්‍යාලයේ IBMBB අතර අවබෝධතා ගිවිසුම අනුව පර්යේෂණ සහයෝගිතා අධ්‍යයනය ආරම්භ කරන ලදී.
වාණිජමය වශයෙන් ශක්‍ය එන්සයිමයක් ක්ලෝන කිරීම, ප්‍රකාශනය සහ පවිත්‍රණය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	ආචාර්ය කනිෂ්ක සේනාතිලක මහාචාර්ය සමීර ආර් සමරකෝන් **විද්‍යාපති ශිෂ්‍ය : රත්නායක මුදියන්සේලාගේ නිශාදි තාරුකා රොෂාන්ති රත්නායක මිය**	IBMBB (විද්‍යාපති අධ්‍යයන)

ශාකසාර ඖෂධ කර්මාන්තයේදී අසෝක (*Saraca asoca*) පොත්ත දේවදාර (*Polyalthia*) සහ ඕවිල (*Longifolia*) වර්ගය සමග අපමිශ්‍රණය වීම හඳුනා ගැනීමට අණුක විද්‍යාත්මක ක්‍රමයක් / ක්‍රම සොයා ගැනීම අවසාන නිබන්ධනය 2023 දී ඉදිරිපත් කරන ලදී.	මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන ආචාර්ය ටී එම් එස් ජී තෙන්නකෝන් ආචාර්ය එල් එන් ආර් ගුණරත්න **විද්‍යාපති ශිෂ්‍ය : සිවාංජලී රවීන්ද්‍රකුමාර් මිය**	
ශ්‍රී ලංකාවේ සත්ත්ව විශේෂවල අණුක හඳුනාගැනීම		
නව සත්ත්ව විශේෂවල අණුක හඳුනාගැනීම අධ්‍යයනය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මෙන්ඩිස් වික්‍රමසිංහ මයා (ශ්‍රී ලංකා උරග විද්‍යා සංගමය), මහාචාර්ය කමනි තෙන්නකෝන් (IBMBB) සහ ආචාර්ය සමීර ආර්. සමරකෝන් (IBMBB) **දර්ශනසූරී ශිෂ්‍ය : නෙතු වික්‍රමසිංහ මිය. (ශ්‍රී ලංකා උරග විද්‍යා සංගමය)**	අරමුදල්: ශ්‍රී ලංකා උරග විද්‍යා සංගමය
භාවනා කරන්නන්ගේ ආතති ප්‍රතිචාරයේ ප්‍රතිශක්තිකරණ, හෝමෝන සහ ජෛව රසායනික පරාමිතීන් පිළිබඳ අධ්‍යයනය දර්ශනසූරී වැඩ සටහන 2023 දී අවසන් කරන ලද අතර නිබන්ධනය ලියමින් තිබිණි.	මහාචාර්යශිරෝමා හඳුන්නෙත්ති (IBMBB), ආචාර්ය . එච්. වරාවිටගේ, මහාචාර්ය දිල්ෂානි දිසානායක වෛද්‍ය පීඨය, කොළඹ). **දර්ශනසූරී ශිෂ්‍ය : ජේ.සී. තම්බිරාජා මහතා**	ලෝක බැංකුවෙන් අරමුදල් සපයන AHEAD ව්‍යාපෘතිය ප්‍රදාන 6026 – LK/ 8743 – මහාචාර්ය දිල්ෂානි දිසානායකට
කාර්මික වශයෙන් වැදගත් ක්ෂුද්‍ර ජීවීන්ගේ අණු හඳුනාගැනීම පිළිබඳ පර්යේෂණ වැඩසටහන්		
Rigidoporus microporus දිලීරයෙන් ලබාගත් ලැක්කේස් එන්සයිමය වෙන් කිරීම, පවිත්‍රණය සහ ක්‍රියාකාරකම් අධ්‍යයනය කිරීම. අවසාන නිබන්ධනය 2023 දී ඉදිරිපත් කරන ලදී.	මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන ආචාර්ය එන් ගුණරත්න **විද්‍යාපති ශිෂ්‍ය : කේ සඳලි ගීත්මා මිය**	IBMBB විද්‍යාපති අධ්‍යයන
ස්වාභාවික ක්ෂුද්‍රශාක (microflora) භාවිතයෙන් කාබනික ද්‍රව්‍ය කොම්පෝස්ට් බවට ස්වාභාවිකව වියෝජනය වේගවත් කිරීම සහ ජෛව පොහොර සැකසීම සංවර්ධනය කිරීම අධ්‍යයනය 2023 දී ක්‍රියාත්මක වෙමින් පැවතිණි.	මහාචාර්ය ඕ වී ඩී එස් ජේ වීරසේන ආචාර්ය එන් ගුණරත්න **දර්ශනපති ශිෂ්‍ය: මයුර ප්‍රභාකරන් මහතා**	ස්වයං අරමුදල්

පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණ

මහාචාර්ය නිමල් පුණ්‍යසිරි මහතා බුබුළු අංගමාරය රෝගයට (Exobasidumvexans) එරෙහිව තේ දළු (*Camellia sinensis*) තුළ ඇති රෝග ප්‍රතිරෝධී ජෛව සලකුණු හඳුනාගැනීම පිළිබඳ පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂණ ව්‍යාපෘතියක නිරත විය. මෙම පර්යේෂණය 2023 ඔක්තෝබර් 1 සිට දෙසැම්බර් 14 දක්වා ජර්මනියේ බ්‍රවින්ෂ්විග් හි ආහාර රසායන විද්‍යා ආයතනයේ බ්‍රවින්ෂ්විග් තාක්ෂණික විශ්වවිද්‍යාලය විසින් සිදු කරන ලදී.

මෙම පර්යේෂණය ස්වයං අරමුදල් මත සිදු කරන ලදී.

ඉහත ව්‍යාපෘතිය සාර්ථකව නිම කර ඇති අතර එහි ප්‍රතිඵලය සම-සමාලෝචනය කරන ලද ප්‍රකාශන හෝ ජෛව දිලීර නාශක සංවර්ධනය සඳහා පේටන්ට් බලපත්‍රයක් වනු ඇත.

පර්යේෂණ ප්‍රකාශන

IBMBB හා සම්බන්ධ සියලු කතුවරුන්ගේ නම් තද කලු (***bold***) අකුරින් දැක්වෙයි.

දුංගල් ජේ,මරසිනි බීපී, මනන්දර් ඊ, **රත්නායක ආර්කේ, සමරකෝන් එස්ආර්,** ශෝලා එස්. එල්. ගහලවලින් (*Stephania glandulifera Miers*) වෙන් කරන ලද ඇල්කලෝයිඩ්වල සයිටොටොක්සික් ක්‍රියාකාරිත්වය, Journal of Biologically Active Products from Nature, 13:2, 118-128. 2023. DOI: 10.1080/22311866.2023.2224283

ගංගානි ඩී, දිසානායක ඩබ්, ද සිල්වා ආර්, **අනුරාධ කේ**, කරුණානායක එල්, **ප්‍රනාන්දු එන්**, රාජපක්ෂ එස්, ප්‍රේමවංශ එස්, **හඳුන්නෙත්ති, එස්.** සාර්ද්‍ර ප්‍රතිශක්තිකරණ ප්‍රතිචාරය සහ serovar patoc යන serovar pyrogenes යන Leptospira මස්තූ දෙකට එරෙහිව ප්‍රතිශක්තිකරණය කරන ලද මීයන්ගේ peritoneal සෛල ගහනයේ වෙනස්වීම්; BMC Immunol 24, 39 (2023)

ගුණසේකර ඩබ්එම්කේවීද අල්විස්, ප්‍රේමරත්න ආර්.ජී.**හඳුන්නෙත්ති එස්එම්, වීරසේන, ඕවීඩීඑස්ජේ,** ප්‍රේමවංශ එස්, ප්‍රනාන්දු එස්ඩී. ශ්‍රී ලංකාවේ POR අවධියේදී *Plasmodium falciparum* ප්‍රතිසක්‍රීයණය ප්‍රත්‍යාසාදන වලින් වෙන්කර හඳුනා ගැනීමේදී WHO/MMV ප්‍රවේණිදර්ශයෙහි කාර්යභාරය. Malaria Journal. 2023, PREPRINT (Version 1) available at Research Square [https://doi.org/10.21203/rs.3.rs- 3233790/v1]

ඉද්දගොඩ ජේ, ගුණසේකර පී,හඳුන්නෙත්ති, එස්, ජීවන්දර සී, කරුණාතිලක සී, මලවිගේ ජීඑන්, ද සිල්වා ආර්, දසනායක ඩී. කොස් (*Artocarpus heterophyllus*), මුරුංගා *(Moringa oleifera*), හීන් සාරණ (*Trianthema portulacastrum*) සහ පිණි ජම්බු (*Syzygium samarangense*) වල අසාත්මිකතා හඳුනා ගැනීම. Clinical and Molecular Allergy Journal, 2023; 21 (1), 1-10.

ජයසේකර එල්පී, රණසිංහ ආර්,සේනාතිලක, කේඑස්, කොතලාවල ජේටී, ද සිල්වා කේ, අබේගුණසේකර පීඑච්, ගුණසිංහ ආර්,**තෙන්නකෝන් කේඑච්** (2023) විරල පියයුරු පිළිකා වල මයිටොකොන්ඩ්‍රියල් ජෙනෝමය: ශ්‍රී ලංකාවේ සිංහල ගහනයක පාලිත සිද්ධි අධ්‍යයනයක් සහ ප්‍රෝටෝමික් විශ්ලේෂණයක්.PLoS ONE 18(2): e0281620. https://doi.org/10.1371/journal.pone.0281620. Published on February 9, 2023. ISSN 1932-6203

කළුතන්තිරි ඩී,**රාජගෝපාලන් යූ, සමරකෝන් එස්,** වීරසිංහ, එල්**,** පෙරේරා, අයි. සී සහ පෙරේරා, ටී. ප්‍රතිපිළිකා ඖෂධ නිෂ්පාදනය සඳහා නව ඛයිඑතිලෙනෙට්‍රියමයින් පාදක සල්ෆොනාමයිඩ් ලිගන්ඩ් සංශ්ලේෂණය සහලක්ෂණකරණය හා ඒවායේ බයිඩෙන්ටේට් ප්ලැටිනම් (II) සංකීර්ණ .Current Scientia 26 No. 02 (2023) 78-98.

මුන්සෙරෝ පීසී, හඳුන්නෙත්ති එස්, ප්‍රනාන්දු එන්, රණවීර එල්, හපුආරච්චි එස්ඩී, **නයම්වේයා බීඑම්,** දස්‍යායිසේංග ජේ, (2023) ඩෙංගු වයිරසයෙන් ආසාදනය වූ අන්තරාසර්ග සෛලවල ක්‍රියාකාරී වෙනස්වීම් කෙරෙහි බිංකොහොඹ (*Munronia pinnata (Wall)* Theob. (Meliaceae) වල ජලීය සාරයෙහි බලපෑම පිළිබඳ මූලික අධ්‍යයනය. Scientific African, Volume 21, e01861,ISSN 2468-2276, https://doi.org/10.1016/j.sciaf.2023.e01861.

මියුසෙනිව් ටී, පෙරේරා ටී, සිරිවර්ධන එස්, බාස් ඩී, බයිරම් එෆ්, ඕරුක් එම්, බෙකර්-සියාජා බී**,** පෙරේරා අයි**, වීරසේන ඕවීඩීඑස්ජේ, හඳුන්නෙත්ති එස්.** ෂ්වාස් එෆ්, ප්‍රේමවංශ ජී, ප්‍රේමවංශ එස්, යාපා ඩබ්, නිට්ෂේ ඒ, කෝල් සී. ශ්‍රී ලංකාවේ වවුල් ගල්ගේ ගුහාවේ වාසය කරන *Miniopterus phillipsi* වවුලන්ගේ කේවල ඡවිපතනය පිළිබඳ සංසන්දනාත්මක වෛරස් විශ්ලේෂණය.
Scientific Reports, 2023 13, 12859. https://doi.org/10.1038/s41598-023-39534-3

නිරෝෂන් ජේ, ලියු වයි, මාර්ටිනස් ජේ,ක්වි පී, වෙයි සී, වීරක්කොඩි එස්, පනාගොඩ ජී, **වීරසේන, ඕවීඩීඑස්ජේ,** අමරසිංහ ටීඒඒ, සෙක්ලි, ටී, බොන්ඩිස් ඒඑල්එස්, සෙනෙවිරත්න එස්එස්. Charadrius seebohmi වර්ගය අතරින් රූපානුදර්ශී සහ ජාන විශ්ලේෂණ මත පදනම්ව කුඩා කෙන්ට් ඔලෙයියාට හිමි ස්ථානය ක්‍රමානුකූලව සංශෝධනය කිරීම.International Journal of Avian Science, Version of Record online: 07 May 2023

නයම්වෙයා බී, රුක්ෂලා ඩී, ප්‍රනාන්දු එන්, ද සිල්වා ආර්, ප්‍රේමවංශ එස්. **හඳුන්නෙත්ති එස්**. නිකවල (*Vitex negundo*) හෘද ආරක්ෂණ බලපෑම්: ජෛව ක්‍රියාකාරී නිස්සාරණ සහ සංයෝග පිළිබඳ සමාලෝචනයක්. J Evid Based Integr Med. 2023 Jan-Dec;28:2515690X231176622. doi: 10.1177/2515690X231176622. PMID: 37279951; PMCID: PMC10259128.

පෙරේරා ඩීඑන්, පල්ලියගුරුගේ සීඑල්, ඇපාසිංහ ඩීඩී, ලියනගේ ඩීඑම්, සෙනෙවිරත්න ආර්ඒසීඑච්, දෙමිනි එස්එම්ඩී, ජයසිංහ ජේඒඑස්එම්, **ෆයිසාන් එම්, රාජගෝපාලන් යූ, ගල්හේන බීපී,** හේස් එච්, **සේනාතිලක කේ, තෙන්නකෝන් කේඑච්, සමරකෝන් එස්ආර්**. යකඩ අවශෝෂණයට බලපාන සාධක සහ යකඩ මට්ටම ඉහළ නැංවීමේදී බලකරණය සතු කාර්යභාරය,Nutrition Bulletin, 48(4), pp. 442–457. 2023. doi:10.1111/nbu.12643.

පෙරේරා එච්ඩීඑස්එම්, සමරසේකර ජේකේආර්ආර්, **හඳුන්නෙත්ති එස්එම්, වීරසේන ඕවීඩීඑස්ජේ,** ලියනආරච්චි ජීඩී, ජබීන් ඒ, වෙෘද්රි එම්අයි, ස්ථානික ආලේපනය සඳහා කරපිංචා (*Murraya koenigii*) වල ජෛව ක්‍රියාකාරී සාරය අඩංගු හයිඩ්‍රොජෙල් සැකසීම සහ ඇගයීම. Journal of Herbal Medicine 2023, 42: 100753. එදිරිවීර එම්. කේ.

පෙරේරා එන්, එදිරිවීර එම්කේ, සමරකෝන් එස්ආර්, සෙල්වකුමාර් අයි, නාගරාජන් ඩී, වෙල්ලිංගිරි වී,**තෙන්නකෝන් කේඑච්**, වල් අඹ (Mangifera zeylanica) සහ අඹ (Mangifera indica) පත්‍ර සාරය හිස්ටෝන් ඩීසීටයිලේස් නිෂේධනය කිරීමෙන් පිළිකා නාශක බලපෑම් ඇති කරයි. Journal of Herbs, Spices & Medicinal Plants, 29:1, 98-113. 2023. DOI: 10.1080/10496475.2022.2110348

ප්‍රජ්වාල් ප්‍රතාප් සිං,සචින් කුමාර්, නාගර්ජුන පසුපති, **පී.ආර්.වීරසූරිය, කමනි එච් තෙන්නකෝන්**, නිරාජ් රායි, ඥානේෂ්වර් වෞබේ, **ආර්.රණසිංහ**. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජනවාර්ගික කණ්ඩායම වන සිංහලයන්ගේ ජනගහන ඉතිහාසය ප්‍රතිනිර්මාණය කිරීම. iScience. Published: August 31, 2023. https://doi.org/10.1016/j.isci.2023.107797 ISSN 2589-0042 (Online)

සමරසිංහ එස්ඒඑස්එම්, හේවගේ ඒඑස්, සිරිවර්ධන ආර්සී, තෙන්නකෝන් කේඑච්, නිරිඇල්ල එම්ඒ, **ද සිල්වා එස්.** මද්‍යසාර නොවන මේද අක්මා රෝගයේ (NAFLD) ව්‍යාධිජනකත්වයේ ජානමය සහ පරිවෘත්තීය අංශ. Egypt J Med Hum Genet. 2023; 24, 53. Doi: https://doi.org/10.1186/s43042-023-00433-x

ශෝලා, එස්එල්, ෂා ටී, රත්නායක ආර්කේ, **සමරකෝන් එස්ආර්,** මනන්දර් ඊයූජේඑම්, සහ මනන්දර්, එම්ඩී (2023). *Usnea aciculifera* වලින් වෙනින් වෙන් කරගනු ලැබූ සංයෝගවල සෛටධූලකතාවය Journal of Nepal Chemical Society, 43(2), 125–129. https://doi.org/10.3126/jncs.v43i2.53357

තම්බිරාජා ජේසී, ප්‍රනාන්දු එන්, රත්නායක වී**, හඳුන්නෙත්ති එස්,** ජයමහ ජේ, (2023) ශ්‍රී ලංකාවේ ganciclovir ප්‍රතිරෝධය ඇතැයි සැක කෙරෙන රෝගීන්ගෙන් වෙන් කරගත් cytomegalovirus හි UL97 ජානය පිළිබඳ මූලික අධ්‍යයනයක්, Sri Lankan Journal of Infectious Diseases 13 (1), 1-6

තම්බිරාජා ජේසී, හේවා වරාවිටගේ ඩී, **හඳුන්නෙත්ති එස්එම්,** දිසානායක ඩබ්ඩීඑන්. දිගුකාලීන නිපුණ භාවනායෝගීන් තුළ මස්තු මෙලටොනින් සහ සෙරොටොනින් මට්ටම්. EXPLORE, 19(5): September–October 2023; 695-701.

තුෂාන්තන් ජේ, වික්‍රමරත්න එන්එස්, සේනාතිලක කේඑස්, රාජගෝපාලන් යූ, තෙන්නකෝන් කේඑච්, තාබෘ අයි, සහ සමරකෝන්, එස්ආර්. (2023). ශ්‍රී ලංකාවේ තෝරාගත් ආවේණික හෝ ඖෂධීය ශාකවල මානව යාකෘත් සෛලීය පිළිකා (HepG2) සෛල වලට එරෙහි ප්‍රති-ඔක්සිකාරක ක්‍රියාකාරකම් සහ සෛටධූලකතාවය.Advances in Pharmacological and Pharmaceu cal Sciences, 2023, 1–9. h ps://doi.org/10.1155/2023/6407688

වෙදගේ ඩබ්එම්එම්, හරිශ්චන්ද්‍ර අයිඑන්, **වීරසේන ඕ.වී.ඩී.එස්.ජේ,** ද සිල්වා බීජීඩීඑන්කේ (2023) COI සහ ND4 මයිටොකොන්ඩ්‍රියල් ජාන අනුපිළිවෙල භාවිතා කරමින් වැලි මැස්සන් (Phlebotomus argentipes) ගේ ජාන විවිධත්වය සහ වංශ ප්‍රවේණික භූ විද්‍යාව (Diptera: Psychodidae, Phlebotominae) PLOS ONE 18(12): e0296286. https://doi.org/10.1371/journal.pone.0296286

වැලිකල ඒඑච්ජේ, රණසිංහ ආර්,තෙන්නකෝන් කේඑච්, කොතලාවල ජේටී, වීරසූරිය පීආර්. ශ්‍රී ලංකාවේ සිංහල සහ වැදි ජනගහණයේ ඩයිනියුක්ලියෝටයිඩ පුනරාවර්තන වෙනස්කම් වල මයිටොකොන්ඩ්‍රියල් **DNA (CA).** populatons in ශ්‍රී ලංකාව. Genetica (2023). https://doi.org/10.1007/s10709-022-00150-0

වික්‍රමසිංහ එන්. වික්‍රමසිංහ එල්ජේඑම්. විදානපතිරණ ඩීආර්**, තෙන්නකෝන් කේඑච්, සමරකෝන් එස්ආර්** සහ ගවර් ඩීජේ. (2023). දුමුටු කණුඋල්ලා (Indotyphlops braminus) ගේ අනිෂික්ත ජනන වර්ගීකරණය පිළිබඳ අණුක-ජාන විද්‍යා දෘෂ්ටිකෝණයකින්. (Daudin, 1803) (Squamata: Serpentes:

සමුළුවල ප්‍රකාශයට පත් කරන ලද පත්‍රිකා - 2023

පර්යේෂණ සංනිවේදන – 2023 (සමුළුවල ප්‍රකාශයට පත් කරන ලද පත්‍රිකා)

ශ්‍රී ලංකාවේ ශාක පරාසයක ක්‍රියාකාරී ප්‍රෝටීන විරෝධී ග්ලයිකේෂන්, ARS 2023 - තාක්ෂණ පීඨය, කොට.වි.වි.

ද සිල්වා වයි, වීරසේන ජේ, ප්‍රනාන්දු එන්, සත්කුමාර එච්, චන්ද්‍රපද්ම එන්, රාජපක්ෂ එස්, ප්‍රේමවංශ එස්, **හඳුන්නෙත්ති, එස්**. ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ සායනික වශයෙන් සංලක්ෂිත ලෙප්ටොස්පයිරෝසිස් රෝගීන්ගේ Leptospira පිළිබඳ ජාන විශ්ලේෂණය. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

ප්‍රනාන්දු ඒඑස්, බන්ධෝපාධ්‍යාය ඊ, ඩි ලා ෆුන්ටේ කැස්ට්‍රෝ සී, වින්ටන්ස්කි ඩී, කරුණානායක ඊඑච්, සෝමදේව ආර්, රායි එන්, **තෙන්නකෝන් කේඑච්, රාඝවන් එම්, රණසිංහ ආර්.** රතුගල ප්‍රදේශයක වෙසෙන ආදිවාසී කණ්ඩායමක ඒක මාපිය උරුමය සංසන්දනය කිරීම. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

ෆාෂා එම්ඒ, කොතලාවල ජේටී, රණසිංහ ආර්. විරල ගණයෙහි පියයුරු පිළිකා රෝගීන් සඳහා මයිටොකොන්ඩ්‍රියල් ප්‍රතිලේඛන සාධක A (TFAM) හි තෝරාගත් එක්සෝන පොලිමරේස් දාම ප්‍රතික්‍රියා (PCR) ප්‍රශස්තකරණය සහ විස්තාරණය කිරීම. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

ෆොන්සේකා ඩබ්එන්ටී, හේවගේ එස්, ද සිල්වා එස්, අතපත්තු එන්. එක්ටොපික් තයිරොයිඩ් සහිත ශ්‍රී ලාංකික රෝගීන් සමූහයක NKX2-5 විකෘති විශ්ලේෂණය. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

ගලගමආරච්චි එස්එච්, ප්‍රනාන්දු ඒඑස්, තෙන්නකෝන් කේඑච්, රණසිංහ ආර්. නියැන්ඩර්තාල්ට උරුම වූ COVID-19 ජානමය වෙනස්කම්: පොලිමරේස් දාම ප්‍රතික්‍රියා තත්ත්වයන් සහ දත්ත සමුදාය මත පදනම් වූ ඇලිලේ සංඛ්‍යාත විශ්ලේෂණය තක්සේරු කිරීම. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

හැන්නදිගේ එන්ඩී, සේනානිලක එන්එච්කේඑස්, සමරකෝන් එස්ආර්, ගල්හේන බීපී. නව වයෝ හායන ස්වභාවික සංයෝගවල සිලිකෝ පුරෝකථනය සහ සනාල වලංගුකරණය. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

කාරියවසම් සීඑම්, කොතලාවල ජේටී, තෙන්නකෝන් කේඑච්, රණසිංහ ආර්. . PLOG1 ජානයේ exon 3 හි ජන්මානුපථ ප්‍රභේද: පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව ප්‍රශස්ත කිරීම සහ තෝරාගත් සිංහල පුද්ගලයන් කිහිප දෙනෙකුගේ සහ පියයුරු පිළිකා රෝගීන්ගේ මූලික විශ්ලේෂණය. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

කෙහෙල්ගමුව ආර්පී, ද සිල්වා එස්., **හේවගේ එස්, ද සිල්වා කේ.** ශ්‍රී ලංකාවේ මහා බඩවැලේ පිළිකා ඇති රෝගීන් සමූහයක මහා බඩවැලේ පිළිකා ආශ්‍රිත ට්‍රාන්ස්ක්‍රිප්ට් 2 RNA ජානයේ රෝග ආශ්‍රිත ප්‍රභේදය (n.662G>T) හඳුනා ගැනීම. 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරයෙහි වාර්තා සටහන්, IBMBB: 2023. පි 52 (පි.11)

මනෝහරන් වී , ද සිල්වා එස්. **, කරුණානායක ඊඑච් , තෙන්නකෝන් කේඑච්,** ද සිල්වා කේ, අභුණවෙල පී, ලූනෙක් ජේ. ශ්‍රී ලාංකික රෝගීන් සමූහයක් තුළ තෝරාගත් පිළිකාවල tp53 ජානයේ කායික විකෘති විශ්ලේෂණය සහ ප්‍රෝටීන් ප්‍රකාශනය". ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ සභාව-ලෝක විද්‍යා සතිය 2023: පර්යේෂණ සැසි සමුළුව, 2023 නොවැම්බර් 13 සහ 14

මිෂාල් එම්එෆ්එම්, සේනානිලක, කේඑස්, සමරකෝන් එස්ආර්. තථ්‍ය තිර ගැන්වීම සහ අණුකමය ගතිකයන් මත පදනම් වූ වයස්ගත වීම වැළැක්වීමේ සංයෝගයක් ලෙස Bismahanine හඳුනා ගැනීම. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

නිරෝෂන් ජේජේ, ලියු වයි, මාර්ටිනස් ජේ, ක්වි පී, වෙයි සී, වීරක්කොඩි එස්, පනාගොඩ ජී, **වීරසේන, ඕවීඩීඑස්ජේ**, අමරසිංහ ටී.ඒ.ඒ, සෙක්ලි, ටී, බොන්ඩස් ඒඑල්එස්, සෙනෙවිරත්න එස්එස්. (2023) Charadrius seebohmi වර්ගය අතරින් රූපානුදර්ශී සහ ජාන විශ්ලේෂණ මත පදනම්ව කුඩා කෙන්ට් ඔලෙයියාට හිමි ස්ථානය ක්‍රමානුකූලව සංශෝධනය කිරීම. International Journal of Avian Science, Version of Record online: 07 May 2023

නයම්වේ බී, රුක්ෂලා ඩී, ප්‍රනාන්දු එන්, ද සිල්වා ආර්, ප්‍රේමවංශ එස්. **හඳුන්නෙත්ති, එස්**. නිකවල (*Vitex negundo*) ජලීය පත්‍ර සාරය අධි රුධිර පීඩනයේ සනාල ආකෘතියක් තුළ ප්‍රතිශක්තිකරණ බලපෑම් ඇති කරයි. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

පතිරණ එස්එල්, දීපචන්දි බී, ගුණසේකර පී, ප්‍රේමවංශ ජී, නාමලී ඩී, ප්‍රනාන්දු එන්, පෙරේරා අයිසී, නානායක්කාර එස්, කුමාරසිංහ ඩී, ගංගානි පීඩී, තම්බිරාජා ජේ, පෙරේරා ටී, සිරිවර්ධන එස්, මානිල්ගම එස්, සුමතිපාල එස්, මුතුගල ආර්, රාජපක්ෂ එස් , දසනායක ඩී, ද සිල්වා ආර්, ප්‍රේමවංශ එස්, නිටිඝේ ඒ, හඳුන්නෙත්ති එස්. ශ්‍රී ලංකාව තුළ COVID-19 රෝගීන් සහ විවිධ COVID-19 එන්නත් ලබා

ගන්නා ප්‍රතිග්‍රාහකයන් තුළ Anti-SARS-CoV-2 ස්පයික් ප්‍රෝටීන් ප්‍රතිදේහ හඳුනා ගැනීම(OP24). IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

පෙරේරා ඒඒඩීඑන්, සමරකෝන් එස්ආර්, එදිරිවීර එම්කේ, තෙන්නකෝන් කේඑච්, අඹ (*Mangifera zeylanica*) කොළ වලින් විහව පිළිකා නාශක සංයෝගයක් වෙන් කිරීම සහ එහි බලපෑම් විමර්ශනය කිරීම. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

පෙරේරා කේ ඩීසී, **ෆයිසාන් එම්, සේනාතිලක එන්එච්කේ එස්, සමරකෝන් එස්ආර්.** පිළිකා ප්‍රාථමික සෛල මත අශ්වගන්ධ (*Withania somnifera*) හි පිළිකා නාශක ගුණ පිළිබඳ ආගණනීය විමර්ශනයක්. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

රෙක්සන් එස්එස්, පුණ්‍යාසිරි එන්, ලෙවිකේ බණ්ඩාර එන්**, රාජගෝපාලන් යූ.,** ද සිල්වා ඊඩී. ජීව විද්‍යාත්මකව ක්‍රියාකාරී ද්විතියික පරිවෘත්තීය පැවතීම සඳහා තුඔසක වායුත්පන්න දිලීරයක් පිළිබඳ විමර්ශනය. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

සයිලු පීටී, සෙනෙවිරත්න එන්එන්, ෆයිසාන් එම්, රාජගෝපාලන් යූ., අධිකාරී, ඒ, **සේනාතිලක කේඑස්, ගල්හේන පීබී, තෙන්නකෝන් කේඑච්, සමරකෝන් එස්ආර්.** alpha-hederin පිළිකා සෛල තුළ ස්වයං-විනාශකාරී යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීමෙන් පියයුරු පිළිකා ප්‍රාථමික සෛල විනාශ කිරීමට උපකාරී වේ.IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

සමරසිංහ එස්ඒඑස්එම්, හේවගේ ඒඑස්, සිරිවර්ධන ආර්සී**,තෙන්නකෝන් කේඑච්,** නිරිඇල්ල එම්ඒ, ද සිල්වා එස්. ශ්‍රී ලංකාවේ මධ්‍යසාර නොවන ස්ටීටෝහෙපටයිටිස් (NASH) ආශ්‍රිත හෙපටෝසෙලියුලර් පිළිකා (HCC) රෝගීන්ගේ කණ්ඩායමක් සමඟ PNPLA3 ජාන ප්‍රභේද සංගමය. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

සායක්කාර කේඑස්, ද සිල්වා එස්**, හේවගේ එස්, තෙන්නකෝන් කේඑච්,** සිරිවර්ධන ආර්සී, නිරිඇල්ල එම්ඒ, සමරසිංහ එස්. ශ්‍රී ලංකාවේ NAFLD ව්‍යාධිජනකයට සම්බන්ධ යකඩ සමුච්චනයට ඇතුළත් HFE ජානයේ තෝරාගත් ජාන ප්‍රභේද. තරුණ විද්‍යාඥයින්ගේ සමුළුවේ වාර්තා සටහන්: බහුශික්ෂණ පර්යේෂණ (YSCMR)-2023, Young Scientists' Association, National Institute of Fundamental Studies, ශ්‍රී ලංකාව. 2023.pp 34 (CMT-128)

ෂෆියු එෆ්ජේ, ද සිල්වා එස්**,** හේවගේ එස්**,** ද සිල්වා කේ. ශ්‍රී ලංකාවේ පියයුරු පිළිකා ඇති රෝගීන් සමූහයක HOX ට්‍රාන්ස්ක්‍රිප්ටිකාන්ටිසෙන්ස් RNA (HOTAIR) ජානයේ තෝරාගත් SNP හඳුනාගැනීම.IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

තයාපරන්**, පී,** හේවගේ එස්**,** ද සිල්වා එස්**,** අතපත්තු එන්. ස්ථිර සංජානනීය හයිපෝතයිරොයිඩ්වාදය සහිත ශ්‍රී ලාංකික රෝගීන් සමූහයක DUOX2 විකෘති විශ්ලේෂණය. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

තුෂාන්තන් ජේ, වික්‍රමරත්න එන්එස්, රාජගෝපාලන් යූ, සේනාතිලක කේඑස්, සමරකෝන් එස්ආර්, තෙන්නකෝන් කේඑච්, සහ තාබෘ එම්.අයි. (2023). මානව යාකෘත්සෛලීය පිළිකා රෝග (*hepatocellular carcinoma*) (HepG2) සෛල රේඛාව භාවිතයෙන් මහ කඩොල් (Rhizophora mucronata) වල අන්තශ්ශාකීය දිලීර වික්‍රියා වල සෛටධූලකතාවය. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

විජිත්සිං එන්එන්, **අනුරාධ කේ,හඳුන්නෙත්ති, එස්, ප්‍රනාන්දු එන්, සෙනරත් කේ.** තුවාල සුව කිරීම සඳහා ලෝකපාලු (*Mikania cordata*) ජලීය පත්‍ර නිස්සාරණයේ සනාල බලපෑම. IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

වැලිකල ඒඑච්ජේ, ප්‍රනාන්දු ඒ, කොතලාවල ජේටී, තෙන්නකෝන් කේඑච්, රණසිංහ ආර්. ශ්‍රී ලංකාවේ ශ්‍රී ලාංකික දෙමළ හා වැදි ජනගහණයන්හි මයිටොකොන්ඩ්‍රියල් ඩීඑන්ඒ අධි විචල්‍ය කලාපයේ සී-ස්ට්‍රෙච් හි දීර්ඝ විෂම ජ්ලාස්මි විශ්ලේෂණය IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

වික්‍රමරත්න එන්එස්, තුෂාන්තන් ජේ, අධිකාරී ඒ.**රාජගෝපාලන් යූ, තෙන්නකෝන් කේඑච්,** කරුණාරත්න ඩීඑන්. **සමරකෝන් එස්ආර්.,** ලැක්ටෝන් වළල්ල ගලිස් (Gardenia crameri) වලින් වෙන් වූ ව්‍යුහාත්මකව සම්බන්ධ සංයෝග තුනක පියයුරු පිළිකා මර්දන ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කරයි.IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

වික්‍රමසිංහ එන්, වික්‍රමසිංහ එල්ජේඑම්,**තෙන්නකෝන් කේඑච්, සමරකෝන් එස්ආර්,** විදානපතිරණ ඩීආර්, ගවර් ඩීජේ, මයිටොකොන්ඩ්‍රිය DNA අනුක්‍රමයෙහි අණුක වංශ ප්‍රවේණිය විශ්ලේෂණය මඟින් අන්ධ සර්පයන්ගේ විශේෂ සීමා නිර්ණය කිරීම, IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

විජේරත්න පීකේඑස්කේ, සාලියු ටීපී, රත්නායක ආර්කේ, රාජගෝපාලන් යූ, සේනාතිලක එන්එච්කේඑස්, සමරකෝන් එස්ආර්. මොණර මල් (*Caesalpinia pulcherrima*) වලින් වෙන් කරගන්නා ලද diterpene වල පිළිකා ප්‍රාථමික සෛල ඉලක්ක කරගත් පිළිකා මර්දන ක්‍රියාකාරකම් සහ උග්‍ර ජීවස්ථ ධූලක අධ්‍යයනය**,** IBMBB 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව, 2023 මැයි 31

ජාත්‍යන්තර - පෝස්ටර්

ප්‍රනාන්දු ඒ, ජයසේකර එල්,රණසිංහ ආර්. තෙන්නකෝන් කේ, කරුණානායක ඊඑච්, සෝමදේව ආර්, රායි එන්. නැඟෙනහිර සහ බටහිර ජනගහනය සම්බන්ධයෙන් සිංහල සහ දෙමළ ජනයාගේ මාතෘ ප්‍රවේණි සම්බන්ධය පිළිබඳ දළ විශ්ලේෂණයක්. European Journal of Human Genetics (2023, June) 31:312 [මානව ජාන විද්‍යාව පිළිබඳ යුරෝපීය සංගමයේ 55 වැනි සම්මේලනයෙහි (ESHG) සාරාංශ: පෝස්ටර්].

ජාගොඩ ඩී, ලියනආරච්චි ජීඩී, වීරතුංග එච්ඩී, **හඳුන්නෙත්ති එස්එම්, ප්‍රනාන්දු එන්,** සමරසේකර ජේකේආර්ආර්, ඇඹුල් දොඩම්වල (*Citrus aurantium Linn*) කොළ සාරයෙහි රසායනික පැතිකඩ සහ නාලස්ථ ප්‍රතිශක්ති අනුකලන ක්‍රියාකාරකම්. 6වන ITI ද්විවාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය නොවැම්බර් 2023, පි. 26


ජයසේකර එල්, රණසිංහ ආර්, කොතලාවල ජේ, ද සිල්වා කේ, අබේගුණසේකර පී, ගුණසිංහ ආර්, **තෙන්නකෝන් කේඑච්.** විරල පියයුරු පිළිකා වල මයිටොකොන්ඩ්‍රියල් ජෙනෝමය: සිංහල වාර්ගික ශ්‍රී ලාංකික කාන්තාවන් පිළිබඳ පාලිත සිද්ධි අධ්‍යයනයක්. European Journal of Human Genetics (2023, June) 31:263 [මානව ජාන විද්‍යාව පිළිබඳ යුරෝපීය සංගමයේ 55 වැනි සම්මේලනයෙහි (ESHG) සාරාංශ: පෝස්ටර්

වැලිකල ඒ, ප්‍රනාන්දු ඒ, ෆයිසාන් එම්, රායි එන්, තංගරාජ් කේ, **තෙන්නකෝන් කේඑච්, රණසිංහ ආර්.** "ශ්‍රී ලංකාවේ ආදිවාසි (වැදි) ජනගහනයේ මාතෘ ප්‍රවේණි සම්බන්ධතා අවබෝධ කර ගැනීම: සම්පූර්ණ මයිටොකොන්ඩ්‍රිය DNA ගවේෂණය කිරීම". (Control No. 2714). මානව ජාන විද්‍යාව පිළිබඳ යුරෝපීය සංගමයේ (ESHG) සම්මේලනය, ග්ලාස්ගෝ, එක්සත් රාජධානිය ජුනි 10-13, 2023

විශේෂඥතාව සහිත ක්ෂේත්‍රයන්හි ප්‍රකාශිත ග්‍රන්ථ / පාඨ ග්‍රන්ථ සංඛ්‍යාව

ද සිල්වා එස්., සමරසිංහ එන්, මහලියනගේ ඩී, ජාසිංහ ඊ, ඩිලන්ති එච් ඩබ්, පුණ්‍යසිරි එන්. ශ්‍රී ලංකාවේ Homocystinuria සහිත ළමුන් සමූහයක CBS සහ MTHFR ජානවල තෝරාගත් ජානමය ප්‍රභේදවල බලපෑම. Novel Research Aspects in Medicine and Medical Science, 2023. Vol. 1, 129–152. Doi:https://doi.org/10.9734/bpi/nramms/v1/5998B. Publisher: BP International, Print ISBN: 978-81-19491-92-6, eBook ISBN: 978-81-19491-93-3.

2023 ජනවාරි 27 පැවති තරුණ විද්‍යාඥ සංසදයේ 11 වැනි YSF සම්මන්ත්‍රණ ලේඛන. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව. 2023 ජනවාරි 27 වැනි දින ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ තරුණ විද්‍යා සංසදය විසින් සංවිධානය කරන ලදී. ප්‍රධාන කර්තෘ ආචාර්ය සී.සී. කඩිගමුව කර්තෘ මණ්ඩලය මහාචාර්ය එස්.ආර්.සමරකෝන්, මහාචාර්ය කේ.ඩබ්. සමරකෝන්, ආචාර්ය ඒ. කනගසුන්දරම්, ආචාර්ය ආර්. රණසිංහ ආචාර්ය ඒ.යූ රාජපක්ෂ ආචාර්ය යූ. ලියනආරච්චි, කේ.අයි.එස්. තමාලි මිය. Page 3 © ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව. මෙම ප්‍රකාශනයේ ඇතුළත් ලිපි ලේඛනවල අන්තර්ගතයේ වගකීම ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව විසින් නොව අදාළ කතුවරුන් විසින් දරනු ලැබේ. ISBN 978-955-8630-26-6 Published by: National Science and Technology Commission, 6th Floor, Wing D, Sethsiripaya Stage II, Battaramulla




ජාත්‍යන්තර පර්යේෂණ අරමුදල්

මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති (PI) මහාචාර්ය සුනිල් ප්‍රේමවංශ (CO -I) මහාචාර්ය සේනක රාජපක්ෂ CO -II)	ලෙප්ටොස්පයිරෝසිස් සඳහා ප්‍රතිදේහජනක මත පදනම් වූ ප්‍රතිශක්තිකරණ පරීක්ෂණයක් සංවර්ධනය කිරීම	ජාන ඉංජිනේරුවේදය සහ ජෛව තාක්ෂණය සඳහා ජාත්‍යන්තර මධ්‍යස්ථානය	CRP/LKA17-01 – කොන්ත්‍රාත් අංක. CRP/18/008	263,727.00

ක්වීන් එළිසබෙත් පොදුරාජ්‍ය මණ්ඩලීය අධ්‍යයන වැඩ සටහන

ජෛව රසායනවේදය, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණවේද ආයතනය 2014 වසරේ සිට ක්වීන් එළිසබෙත් පොදුරාජ්‍ය මණ්ඩලීය සිසුන් වෙනුවෙන් අණුක ජීව විද්‍යාව සහ සෛලීය සහ අණුක ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති වැඩසටහන් සඳහා සාර්ථකව සත්කාරකත්වය ලබා දී ඇත. 2014 සිට 2023 දක්වා ආයතනය පොදුරාජ්‍ය මණ්ඩලීය සිසුන් 10 දෙනෙකුට සත්කාරකත්වය ලබා දී ඇත.



සේවා – IBMBB

IBMBB විසින් පහත දැක්වෙන සේවා ලබා දේ.

DNA අනුක්‍රමණ සේවා

සෛල රෝපණය*

පිළිකා, වර්ධන ආබාධ හා ප්‍රතිශක්තිකරණ ඌනතා ආබාධ වැනි මානව රෝග කිහිපයක් සඳහා ජාන විශ්ලේෂණය
රාජ්‍ය හා පෞද්ගලික අංශ සඳහා HPLC පහසුකම
[* non ATCC Cell lines සඳහා ලබාගත හැකිය]

පර්යේෂණ සහ උසස් අධ්‍යාපනය පිළිබඳ වෘත්තීය උපදේශනය ලබා දීම

ආරාධිත දේශන, මාර්ග සංදර්ශන සහ වෙනත් විවිධ වැඩසටහන් පැවැත්වීම තුළින් ග්‍රාමීය හා නාගරික නොවන පාසල්වල උසස් පෙළ සිසුන් අතර අණුක ජීව විද්‍යාව සහ ජෛව රසායන විද්‍යාව පිළිබඳ දැනුම ව්‍යාප්ත කිරීමට පහසුකම් සැලසීමේ ව්‍යාපෘති සංවර්ධනය කිරීම.

උපදේශන සේවා

මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති

ශ්‍රී ලංකා අසාත්මිකතා සහ ප්‍රතිශක්තිවේද සමාජයේ පාලක සභා සාමාජික
ජාතික පර්යේෂණ සභාවේ පර්යේෂණ ව්‍යාපෘති වාර්තා ඇගයුම්කරු
වෛද්‍ය කීට විද්‍යාව සහ ව්‍යවහාරික පරපෝෂිතවේදය පිළිබඳ විද්‍යාපති පාඨමාලා විභාගවල ප්‍රමිතිකාරක
ජාතික විද්‍යා පදනමේ වාර සඟරාවට ඉදිරිපත් කෙරෙන අත් පිටපත් සමාලෝචක
ජාතික විද්‍යා පදනමේ ජෛවතාක්ෂණවේද කමිටුවේ සාමාජික
කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ භාවනා පර්යේෂණ මධ්‍යස්ථානයේ උපදේශක කමිටුවේ සාමාජික

මහාචාර්ය නිමල් පුණ්‍යසිරි
සබරගමුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ පීඨ මණ්ඩල සාමාජික
කොළඹ විශ්වවිද්‍යාලයේ ස්ත්‍රීපුරුෂ සමාජභාව සමානත්වය සඳහා වූ මධ්‍යස්ථානයේ මෙහෙයවීම් කමිටුවේ සාමාජික
කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන මාර්ගෝපදේශක උපදේශක කමිටුවේ සාමාජික
ආයුර්වේද, ශාකසාර නිෂ්පාදන සහ රූපාලංකරණ අංශයේ උපදේශක කමිටුවේ සාමාජික
1540 වන එක්සත් ජාතීන්ගේ සංගම් යෝජනාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ මෙහෙයවීම් කමිටුවේ සාමාජික

ආචාර්ය නර්මදා ප්‍රනාන්දු
නියෝජ්‍ය අධ්‍යක්ෂක, CQA
තත්ත්ව සහතිකකරණය පිලිබඳ සනාතන සභා ස්තාවර කමිටු සාමාජික
ශ්‍රී ලංකා අසාත්මිකතා සහ ප්‍රතිශක්තිවේද සමාජයේ ලේකම් සහ පාලක සභා සාමාජික

අධ්‍යාපන ක්‍රියාකාරකම්

මහාචාර්ය නිමල් පුණ්‍යසිරි

PGIS, පේරාදෙනිය විශ්වවිද්‍යාලය
තාක්ෂණ පීඨය, සබරගමුව විශ්වවිද්‍යාලය
විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
රසායන විද්‍යා ආයතනය, ශ්‍රී ලංකාව
සිනෙක් කැම්පස්, මාලඹේ
තාක්ෂණ පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
විද්‍යා පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මහාචාර්ය සමීර සමරකෝන්
PGIM, කොළඹ විශ්වවිද්‍යාලය
තාක්ෂණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය සුමාධි ද සිල්වා
PGIM, කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය නර්මදා ප්‍රනාන්දු

විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

ආචාර්ය කනිෂ්ක සේනාතිලක
PGIM, කොළඹ විශ්වවිද්‍යාලය
තාක්ෂණ පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

අවබෝධතා ගිවිසුම්

එක්සත් රාජධානියේ නිව්කාසල්හි නොතම්බ්‍රියා විශ්වවිද්‍යාලය සමග වූ අවබෝධතා ගිවිසුම

2023 ජූලි 26 වැනි දින මෙම ආයතන දෙක අතර අවබෝධතා ගිවිසුම අත්සන් කෙරුනු අතර එය නොතම්බ්‍රියා විශ්වවිද්‍යාලයේ උපකුලපති මහාචාර්ය ඇන්ඩි ලෝන්ග් සහ කොළඹ විශ්වවිද්‍යාලයීය උපකුලපති එච්.ඩී. කරුණාරත්න අතර කොළඹ අග්‍රාමාත්‍ය කාර්යාලයේදී සිදුවිය. මෙම අවස්ථාවට ගරු අග්‍රාමාත්‍යතුමා වැඩබලන බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්තුමා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙහි සභාපතිතුමා, , කොළඹ විශ්වවිද්‍යාලයේ සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරුන්, විගණකාධිපතිතුමා, ආණ්ඩුකාර ව්‍යාපාරික කළමනාකරණ පාසලේ අධිපතිතුමා, කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ පීඨාධිපතිතුමා, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අලෙවිකරණ පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂතුමා සහ IBMBB අධ්‍යක්ෂතුමා ඇතුලු අනෙකුත් සම්භාවනීය අමුත්තෝ සහභාගි වූහ.

මෙම ගිවිසුමේ විෂය පථය වන්නේ පුළුල් පරාසයක ආයතනික සබඳතා ඇති කර ගැනීම සහ දෙපාර්ශවයේ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ සඳහා එක්ව කටයුතු කිරීමයි. පශ්චාත් උපාධි සහ පර්යේෂණ අධ්‍යයන කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් අධ්‍යාපනික සහ පර්යේෂණ හවුල්කාරිත්වයන් වර්ධනය කිරීම, විද්වත් අදහස්/විශේෂඥතාව හුවමාරු කිරීම, නිශ්චිත ශික්ෂණ අන්තර්ක්‍රියා සඳහා සහාය වීම, වැඩසටහන් සංවර්ධනය ඇතුළු විවිධ ආකාරවලින් සහයෝගිතා ක්‍රියාකාරකම් දිරිමත් කිරීමට සහ සංවර්ධනය කිරීමට මෙහි පාර්ශවකරුවන් උත්සාහ කරනු ඇත. එමෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයීය IBMBB ආයතනයේ අදාළ සුදුසුකම් ලත් සිසුන්ට නොතම්බ්‍රියා විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් සඳහා උසස් ප්‍රවේශයට ඉඩකඩ සැපයෙනු ඇත.





මදුරාසියේ IIT ආයතනය සමග ඇති කරගත් අවබෝධතා ගිවිසුම

කොළඹ විශ්වවිද්‍යාලය සහ ඉන්දියානු මදුරාසි තාක්ෂණික ආයතනය (IIT Madras) විවිධ ක්ෂේත්‍ර ඔස්සේ ඉගැන්වීම්, ඉගෙනීම සහ පර්යේෂණ සඳහා ඒකාබද්ධ අවස්ථා ගවේෂණය කිරීමට ගිවිසුම්ගත වී ඇත. 2023 පෙබරවාරි 3 වන දින අත්සන් කරන ලද මෙම අවබෝධතා ගිවිසුම (MoU) ස්වභාවික විද්‍යාව, මානව ශාස්ත්‍ර සහ ජෛව රසායනය, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණය වැනි විශේෂිත ක්ෂේත්‍රවල සහයෝගිතාව සඳහා දොරටු විවර කරයි. ඉහත සඳහන් ක්ෂේත්‍රයන්හි විශේෂිත වූ ආයතනය ලෙස IBMBB හවුල්කාරිත්වයෙහි උප පරිපාලක/සම්බන්ධීකාරක ලෙස කටයුතු කරනු ඇත. මෙම හවුල්කාරිත්වය ආයතන දෙකෙහිම ඒකාබද්ධ ප්‍රවීණතාවයෙන් පෝෂණය වූ අධ්‍යාපනික අත්දැකීම් සහ පර්යේෂණ ප්‍රගතිය තහවුරු කරයි . කොළඹ විශ්ව විද්‍යාලයේ පැවති මෙම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීමේ උත්සවයට දෙපාර්ශවයේම සුප්‍රකට පුද්ගලයෝ සහභාගී වූහ. කොළඹ විශ්වවිද්‍යාලය නියෝජනය කරමින් උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්.ඩී. කරුණාරත්න, IBMBB අධ්‍යක්ෂ මහාචාර්ය ප්‍රසන්න ගල්හේන සහ අනෙකුත් ගෞරවනීය ආචාර්යවරු ද සහභාගි වූ අතර Global Engagement හි පීඨාධිපති මහාචාර්ය රසුනාදන් රෙන්ගස්වාමි සහ අනෙකුත් නිලධාරීන් විසින් IIT Madras නියෝජනය කරන ලදී.

Fadna Tea (Pvt) Ltd සමග ඇති කරගත් අවබෝධතා ගිවිසුම

ශාස්ත්‍රීය හා කර්මාන්ත ක්ෂේත්‍රයන් අතර පරතරය පියවා ගැනීම සඳහා IBMBB Fadna Tea Pvt . Ltd සමාගම සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කළේය. මෙම සහයෝගිතාවයෙහි අරමුණ IBMBB හි අණුක ජීව විද්‍යාව, ජෛව රසායන විද්‍යාව සහ ජෛව තාක්ෂණය පිළිබඳ විශේෂඥ දැනුම පෝෂණ ද්‍රව්‍ය වැනි ක්‍රියාකාරී නිෂ්පාදන සංවර්ධනය කිරීමට සහ ශ්‍රී ලාංකික නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමටයොදා ගැනීමයි. මෙම හවුල්කාරිත්වය නවෝත්පාදන සහ ආර්ථික සංවර්ධනය සඳහා වන නව පියවරක් සනිටුහන් කරයි.





Innovation Nexus: IBMBB සහ Fadna හි ඉදිරි දැක්ම

මෙම උත්සවය IBMBB සහ Fadna Life Science අතර ඇති සාර්ථක සහයෝගිතාවය සැමරූ අතර, එහි ප්‍රතිඵලයක් ලෙස Vernolac, Satiny, Ortho Shield සහ Bio Shape යන නව්‍ය නිෂ්පාදන හතරක් එළිදැක්විණ. මහාචාර්ය සමීර ආර් සමරකෝන් විසින් මෙහෙයවන ලද මෙම හවුල්කාරිත්වය නව නිෂ්පාදන නිර්මාණය කළා පමණක් නොව ශ්‍රී ලංකාවේ ආර්ථික අභියෝග හමුවේ ඔරොත්තු දීමේ හැකියාව පිලිබඳව නව්‍ය ප්‍රවණතාවක් ද ප්‍රදර්ශනය කළේය.

සිය හවුල්කාරිත්වයේ සාර්ථකත්වය සහ ශ්‍රී ලංකාවේ ආර්ථික පුනර්ජීවනය සඳහා වන දායකත්වය සනිටුහන් කරමින් Fadna වෙතින් IBMBB වෙත කර්තෘභාග මාරු කරන ලද අතර ශාස්ත්‍රාලය සහ කර්මාන්ත අතර සහයෝගිතාවයේ වැදගත්කම මෙම අවස්ථාවෙන් ඉස්මතු විය. බැරෑරුම් පර්යේෂණ වලින් උපත ලද මෙම නිෂ්පාදන, පිළිකා ප්‍රාථමික සෛල වලට එරෙහිව සටන් කිරීම සහ හිසකෙස් වර්ධනය කිරීම වැනි සැබෑ ජීවිතයේ අභියෝගවලට විසඳුම් සපයයි. මෙම සහයෝගිතාවය නිෂ්පාදන සංවර්ධනය ඉක්මවා යයි; එය දේශීය ව්‍යාපාර සවිබල ගන්වයි, පර්යේෂණ සංවර්ධනය ප්‍රවර්ධනය කරයි, එමෙන්ම නවෝත්පාදන හරහා ශ්‍රී ලංකාව උදෙසා දීප්තිමත් අනාගතයකට පණ පොවයි



මූල්‍ය ආදායම

IBMBB හි මූල්‍ය ආදායම මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන පුනරාවර්තන සහ ප්‍රාග්ධන වාරණ ප්‍රදානයන්, මාස්ටර්ස් වැඩසටහන් වෙතින් උපයාගත් ආදායම්, MSc වැඩසටහන් සහ ස්වයං මූල්‍ය ක්‍රියාකාරකම් (SFAs) සහ ආයෝජන වලින් ලැබෙන පොලී ආදායම්වලින් ද සමන්විත වේ.

සිසුන් සඳහා වන පහසුකම්

තොරතුරු තාක්ෂණ (IT) පහසුකම්

ඉගෙනුම් කළමනාකරණ පද්ධතිය (LMS) සහ සූම් සම්මන්ත්‍රණ පහසුකම්, දුරස්ථ ඉගෙනුම් හැකියාවන් සමඟ අතථ්‍ය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කරයි. සිසුන්ට IBMBB ස්වයං සේවා ද්වාරය (SSP) වෙත ප්‍රවේශය ලබා දී ඇති අතර එහිදී සිසුන්ට පාඨමාලා සඳහා ඉල්ලුම් කිරීමට, විභාග සහතික පිටපත් අයදුම් කිරීමට සහ IBMBB පුස්තකාලයේ ඇති පොත්පත් අන්තර්ජාලය හරහා තිබේදැයි පරීක්ෂා කිරීමට හැකියාව සපයයි.

SSP IBMBB වෙත සබැඳි ගෙවීම් සඳහා පහසුකම් සපයන මාර්ගගත ගෙවීම් ද්වාරය සමඟ ඒකාබද්ධ වේ. IBMBB හි සියලුම සිසුන්ට අසීමිත අන්තර්ජාල ප්‍රවේශය සහ IBMBB විසින් සපයනු ලබන අනෙකුත් මාර්ගගත සේවාවන් සඳහා රැහැන් රහිත අන්තර්ජාල ප්‍රවේශය ලබා ගත හැකිය. දේශීයව සපයනු ලබන සේවාවන්ට දේශීයව ස්ථාපිත Bioinformatics මෙවලම් සහ දත්ත සමුදායන්, හවුල් ගබඩා සහ මුද්‍රණ සේවා ඇතුළත් වේ.

IBMBB සතුව දැනට මාස්ටර් සිසුන් සඳහා ඉගැන්වීමේ පරිගණක විද්‍යාගාර දෙකක් සහ පර්යේෂණ සිසුන් සඳහා ඉගැන්වීමේ පරිගණක විද්‍යාගාර දෙකක් ඇත. සියලුම රසායනාගාරවලට අසීමිත අන්තර්ජාල ප්‍රවේශය සහ අවශ්‍ය මෘදුකාංග ස්ථාපනය කර ඇත.

පුස්තකාලය

IBMBB පුස්තකාලය අණුක ජීව විද්‍යාව, ප්‍රතිශක්ති විද්‍යාව, ජෛව තාක්ෂණය, ජෛව තොරතුරු විද්‍යාව සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල විශාල පොත් සහ සඟරා එකතුවකින් සමන්විත වේ. ඒවා මූලික වශයෙන් බැහැර දෙන පොත්, විමර්ශන පොත් සහ ස්ථිර විමර්ශන වශයෙන් වර්ගීකරණය කර ඇත.

බැහැර දීම

IBMBB හි සංසරණ ප්‍රතිපත්තියට අනුව මේවා බැහැර ගෙන යාමට ඉඩ දෙනු ලැබේ.

විමර්ශන

මෙම එකතුව දුර්ලභ වැදගත් පෙළපොත්වලින් සමන්විත වේ. මෙම එකතුවේ ඇති පොත් IBMBB හි සංසරණ ප්‍රතිපත්තියට අනුව බැහැර ගෙන යාමට ඉඩ දෙනු ලැබේ.

ස්ථිර විමර්ශන

මෙම එකතුවෙහි විශ්වකෝෂ, ශබ්දකෝෂ, අත්පොත්, අතීත ප්‍රශ්න පත්‍ර, නිබන්ධන ආදිය ඇත. මෙම පොත් ලබා ගත හැක්කේ විමර්ශනය සඳහා පමණකි.

පුස්තකාල සම්පත්

ග්‍රන්ථ වර්ගීකරණය Universal Decimal Classification (UDC) පද්ධතිය අනුව වර්ගීකරණය කර ඇත. .

ශිෂ්‍ය මාර්ගෝපදේශනය

IBMBB හි ලියාපදිංචි වූ සෑම සිසුවෙකු සඳහාම පෞද්ගලික ශිෂ්‍ය උපදේශකයෙකු පත් කරන ලදී.

මහාචාර්ය නිමල් පුණ්‍යසිරි මහතා 2018 වසරේ සිට කොළඹ විශ්වවිද්‍යාලයෙහි උපදේශක සංචිතයේ සාමාජිකයෙකු වන අතර මෙම සාමාජිකත්වය 2024 වසරේදී ද පැවතුණි.

2023 දී ලද සම්මාන

මීළඟ පරපුර සඳහා අණුක ජීව විද්‍යාව

2022 වසරේ විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති සම්මාන

මහාචාර්ය කමනි තෙන්නකෝන්
මහාචාර්ය ශිරෝමා හඳුන්නෙත්ති
මහාචාර්ය ජගත් වීරසේන
මහාචාර්ය සමීර සමරකෝන්
ආචාර්ය නර්මදා ප්‍රනාන්දු

2022 වසරේ පර්යේෂණ සඳහා සනාතන සම්මාන

මහා. ශිරෝමා හඳුන්නෙත්ති

2022 වසරේ පර්යේෂණ විශිෂ්ටතා සනාතන සම්මාන

මහාචාර්ය නිමල් පුණ්‍යසිරි
මහාචාර්ය සිසිර පතිරණ
ආචාර්ය නර්මදා ප්‍රනාන්දු

CSR ක්‍රියාකාරකම්

3 වන වසර පාරිසරික තාක්ෂණ සිසුන් IBMBB වෙත පැමිණීම

තාක්ෂණික පීඨයෙහි පාරිසරික තාක්ෂණ සිසුහු 2023 මැයි 24 වැනි දින IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය වෙත පැමිණියහ. මෙම ක්ෂේත්‍ර සංචාරය 3 වන වසර පාරිසරික තාක්ෂණය විශේෂ උපාධිය හදාරන සිසුන් 50 දෙනෙකු සඳහා සංවිධානය කරන ලදී. ඔවුන්ට අණුක ජීව විද්‍යාත්මක ශිල්පීය ක්‍රම (ඩීඑන්ඒ අනුක්‍රමණය, විද්‍යුතාගමනය සහ තත්‍ය කාලීන PCR, ජාන පරිවර්තන ශිල්පීය ක්‍රම, රේඩියෝ සමස්ථානික ක්‍රම ආදිය), HPLC, FPLC සහ සෛල රෝපණය සහ amp; ප්‍රතිශක්තිකරණ ශිල්පීය ක්‍රම හඳුන්වා දෙන ලදී. ඊට අමතරව IBMBB හි පවතින විද්‍යාගාර, පර්යේෂණ සහ උපකරණ පිළිබඳව අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආචාර්ය උපාධි අපේක්ෂකයන් විසින් සිසුන්ට හඳුන්වා දෙන ලදී. අනෙකුත් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සහාය ඇතිව සැසිය සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද්දේ ව්‍යාපාර සංවර්ධන ඒකකය විසිනි.



සත්ව පටක රෝපණ තාක්ෂණය අධ්‍යයනය සඳහා ජෛව පද්ධති තාක්ෂණ සිසුන් IBMBB වෙත පැමිණීම (2023 මැයි 26)

රුහුණු විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨයේ ජෛව පද්ධති තාක්ෂණ අධ්‍යයන අංශය 2023 මැයි 26 වන දින කොළඹ විශ්වවිද්‍යාලයේ IBMBB වෙත පැමිණියේය. ජෛව පද්ධති තාක්ෂණ විශේෂ උපාධිය හදාරන සිසුන් 47 දෙනෙකු සඳහා මෙම ක්ෂේත්‍ර සංචාරය සංවිධානය කරන ලදී. ආරක්ෂාව සහ වන්ධ්‍යාකරණ ශිල්පීය ක්‍රම, රෝපණ මාධ්‍ය සහ මාධ්‍ය සකස් කිරීම, සෛල රේඛාව සහ නඩත්තුව සහ සෛල පදනම් වූ විශ්ලේෂණයන් මගින් සෛල ශක්‍යතාව හඳුනාගැනීම සම්බන්ධව සජීවී නිරූපණයන් හරහා සිසුන්ව දැනුවත් කරන ලදී. ඊට අමතරව IBMBB හි පවතින විද්‍යාගාර, පර්යේෂණ සහ උපකරණ පිළිබඳව අධ්‍යයන කාර්ය මණ්ඩලය සහ ආචාර්ය උපාධි අපේක්ෂකයන් විසින් සිසුන්ට හඳුන්වා දෙන ලදී. මහාචාර්ය සමීර සමරකෝන් සහ ආචාර්ය උමා රාජගෝපාලන්ගේ සහය ඇතිව ව්‍යාපාර සංවර්ධන ඒකකයේ මිෂාල් මහතා විසින් සැසිය සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.



IBMBB හි IQAC විසින් සම්බන්ධීකරණය කරන ලද ක්‍රියාකාරකම් පිළිබඳ සාරාංශය - 2023

ආචාර්ය නර්මදා ප්‍රනාන්දු IBMBB හි IQAC සම්බන්ධීකාරක ලෙස 2023 ජූලි දක්වා සේවය කළාය. ඉන් අනතුරුව, ආචාර්ය සුමාධි ද සිල්වා අගෝස්තු 2023 සිට IBMBB හි IQAC සම්බන්ධීකාරක ලෙස සේවය කිරීම ඇරඹූ අතර ආචාර්ය දිලානි රුක්ෂලා IBMBB හි IQAC හි විද්‍යාත්මක සහකාර ලෙස දිගටම සේවය කළාය.
ආචාර්ය ප්‍රනාන්දු 2023 ආයතනික සමාලෝචනයේ (IR) ස්වයං ඇගයීම් වාර්තා ලිවීමේ කමිටුවකට දායක වූවාය. IQAC විසින් SLQF අනුකූලතාව, බාහිර සමාලෝචන ක්‍රියාවලීන් සහ ආයතනික සමාලෝචනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

සමාලෝචකයින් විසින් සිය වාර්තාවේදී IBMBB බහු නිර්ණායක යටතේ ඇගයීමට ලක් කර ඇත. ආයතනික සමාලෝචනය සම්පූර්ණ කරන ලද අතර කොළඹ විශ්වවිද්‍යාලය සඳහා සමස්ත “A” ශ්‍රේණියක් ලබා ගන්නා ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ උපාධි පැනිකඩ සමඟ සියලුම උපාධි වැඩසටහන් වල උපාධි පැනිකඩ සිතියම්ගත කිරීම අවසන් කරන ලදී. ගුරු කාර්ය සාධන, පශ්චාත් උපාධි වැඩසටහන් සහ ඉගෙනුම් පරිසරය පිළිබඳ ශිෂ්‍ය ප්‍රතිපෝෂණ පවත්වා අවසන් කර 2022 වර්ෂය සඳහා වාර්තා සැකසුම නිම කරනු ලැබීය.

IQAC විසින් සම සමාලෝචන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලද අතර CQA හි අධ්‍යක්ෂ මහාචාර්ය ගෝමින්ද පොන්නම්පෙරුම සම්පත් දායකයා ලෙස මීට දායක විය. IBMBB හි අධ්‍යයන කාර්ය මණ්ඩලයෙන් ලබාගත් අදහස් සහ සම සමාලෝචනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනේ නිර්දේශ මත පදනම්ව, සම සමාලෝචන නිරීක්ෂණ ආකෘතිය සංශෝධනය කර ඇති අතර එය 2024 සිට භාවිතයට ගැනෙනු ඇත.

වැඩසටහන් සමාලෝචනය සඳහා සූදානම් වීම

SLQF මට්ටම් 11 සහ 12 සඳහා පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය (PGPR) සඳහා සූදානම් වීම ආරම්භ කිරීම 2024 ජුනි මාසයෙන් පසුව සිදුකිරීමට තාවකාලිකව සැලසුම් කර ඇත. සෑම නිර්ණායකයක් සඳහාම සම්බන්ධීකාරකවරුන් පත් කරන ලද අතර ඉදිරි පශ්චාත් උපාධි වැඩසටහන් සමාලෝචනය සැලකිල්ලට ගනිමින් එක් එක් ප්‍රමිතිය සම්බන්ධව වගකිව යුතු කාර්ය මණ්ඩලය හඳුනා ගන්නා ලදී. තවද, PGPR සඳහා අදාළ සාක්ෂි හඳුනාගැනීමේ අරමුණින් විවිධ නිර්ණායක සාකච්ඡා කිරීමට මූලික රැස්වීම් හතක් පවත්වන ලදී.

අදාළ ප්‍රතිපත්තිවලට අනුකූලව නියාමන තත්ත්ව සහතික රාමු සම්මත කරන ලද අතර, ඒ සඳහා, SLQF 9 සහ 10 මට්ටමේ විද්‍යාපති උපාධි වැඩසටහන්වල මට්ටම් දර්ශක මගින් SLQF අනුකූලතාව ප්‍රදර්ශනය කරන්නේ කෙසේද යන්න පිළිබඳව වැඩසටහන් සම්බන්ධීකාරකවරුන් දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ සැසියක් 2023 මාර්තු මාසයේදී පවත්වන ලදී.

SLQF මට්ටම් 9 සහ 10 විද්‍යාපති උපාධි වැඩසටහන් හයේම මට්ටම් දර්ශකවල SLQF අනුකූලතාව පිළිබඳ ස්වයං ඇගයීම අවසන් කරන ලදී. IBMBB විසින් පිරිනමනු ලබන සියලුම පශ්චාත් උපාධි වැඩසටහන් (SLQF මට්ටම 9, 10, 11 සහ 12) SLQF කාණ්ඩවල ප්‍රතිඵල සමඟ සිතියම්ගත කර ඇත.

ඉහත උපාධි පාඨමාලා වල සුදුසුකම් විස්තරයන්හි SLQF අනුකූලතාව පිළිබඳ ස්වයං ඇගයීම සිදු වෙමින් පවතී.

2023 දෙසැම්බර් 31 වන දිනට ආයතනයෙහි සේවක වර්ගීකරණය

සේවක ප්‍රවර්ගය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව		පුරප්පාඩු	සටහන්
			ස්ථිර	තාවකාලික		
ප්‍රාථමික මට්ටම						
ප්‍රාථමික මට්ටම - නුපුහුණු	U- PL 1	01	00	01	01*	* පැවරුම් පදනම මත වැඩ සහකාර පත් කර ඇත.
ප්‍රාථමික මට්ටම - අර්ධ පුහුණු	U- PL 2	03	03			** රියදුරු විදේශගතව සිටියදී 2023.03.15 දින ඉල්ලා අස්වීම ඉදිරිපත් කර ඇත. IBMBB තවමත් ඉල්ලා අස්වීම පිළිගෙන නැත. කොන්ත්‍රාත් පදනම මත නව රියදුරෙකු පත් කර ඇත.
ප්‍රාථමික මට්ටම - පුහුණු	U- PL 3	01		01	01**	
ද්විතියික මට්ටම						
කළමනාකාර සහකාර– තාක්ෂණික නොවන	U- MN 1	11	10	01	01	ස්ථිර කළමනාකරණ සහකාර 2022.10.31 තනතුරෙන් ඉල්ලා අස්වී ඇති අතර පැවරුම් පදනම මත 2023.09.07 දින සිට එක් අභ්‍යාසලාභී කළමනාකරණ සහකාරවරයකු පත් කර ඇත.
කළමනාකාර සහකාර - තාක්ෂණික	U- MT 1	04	03			
ආශ්‍රිත නිලධාරී - 2 ඛණ්ඩය	U- MN 2		00			
ආශ්‍රිත නිලධාරී - 1 ඛණ්ඩය	U- MN 3		00			
මාණ්ඩලික සහකාර/ අධිශ්‍රේණි සහ ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික සහකාර	U- MN 4		01			
තෘතියික මට්ටම						*DMS විසින් ස්ථිර විද්‍යාත්මක සහකාර (SA) තනතුරු හතරක් (04) සහ තාවකාලික විද්‍යාත්මක සහකාර (කොන්ත්‍රාත්) තනතුරු දෙකක් අනුමත කර ඇත. කොන්ත්‍රාත් පදනමේ විද්‍යාත්මක සහකාරවරුන් ස්ථාවර වැටුප් සහිත වේ.
කනිෂ්ඨ විධායක / කළමනාකාර	U- EX 1	01	01			
අධ්‍යයන සහායක - 2 ඛණ්ඩය	U- AS 1	07*	01	07**	01	
අධ්‍යයන සහායක - 1 ඛණ්ඩය	U- AS 2		03*			**විද්‍යාත්මක සහකාරවරුන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මත පත් කර ඇති අතර විද්‍යා සහකාරවරුන් සිව් දෙනෙකු තාවකාලික පදනමින් පත් කර ඇත. ස්ථිර විද්‍යාත්මක සහකාර (BI) 2022.09.14 තනතුරෙන් ඉල්ලා අස්වී ඇති අතර කොන්ත්‍රාත් පදනම මත 2023.10.23 දින සිට විද්‍යාත්මක සහකාරවරයකු පත් කර ඇත.
ජ්‍යෙෂ්ඨ මට්ටම						
වෛද්‍ය නිලධාරී	U- MO 1	00	00			
ප්‍රධාන වෛද්‍ය නිලධාරී	U- MO 2	00	00			
මධ්‍යම මට්ටමේ විධායකයින්	U- EX 2	01	01			
මධ්‍යම මට්ටමේ විධායකයින් *	U- EX 2 (a)	01	01			
ජ්‍යෙෂ්ඨ විධායකයින්	U- EX 3	00	00			

කථිකාචාර්ය	U- AC	3	11	04*	00	02	2023 දෙසැම්බර් 01 දින * එක් ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු පත් කර ඇත.
	U- AC	4		00	00		
සහාය මහාචාර්ය							
මහාචාර්ය/ ජෙ. මහාචාර්ය	U- AC	5		05	00		
අධ්‍යක්ෂ	U-AC 5		01	01	00	00	
පශ්චාත් ආචාර්ය උපාධි අපේක්ෂක **	ස්ථාවර		03	00	01	02	**පශ්චාත් ආචාර්ය උපාධි පර්යේෂක සාමාජිකයින් 03 ක් සහ තාවකාලික සහකාර කථිකාචාර්ය තනතුරු 02 ක් DMS විසින් අනුමත කර ඇත. තනතුරු 5ම ස්ථාවර වැටුප් සහිතය (කොන්ත්‍රාත් පත්කිරීම්)
තාවකාලික සහකාර කථිකාචාර්ය **	ස්ථාවර		02	00	02		

කාර්ය මණ්ඩල සංවර්ධනය, පුහුණුව සහ සුබසාධනය -2023

IBMBB එහි සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සහතික කිරීම සහ පහසුකම් සැලසිය යුතු යයි දැඩි ලෙස විශ්වාස කරයි. පහත සඳහන් කාර්ය මණ්ඩල සාමාජිකයින් තම කුසලතා තවදුරටත් වර්ධනය කර ගැනීම සඳහා පුහුණුවීම්වල නියැලී සිටින අතර එමඟින් IBMBB විසින් විශිෂ්ටත්වය ලබා දීම සඳහා දායක වීමට ඔවුන්ට හැකි වේ. කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ නම් සහ සහභාගී වූ පුහුණු වැඩසටහන් පහත දැක්වේ.

නම	තනතුර	වැඩමුළුව / පුහුණු පාඨමාලාව	කාලසීමාව / දින
එස්.එම්. විතාන ආරච්චි මිය	නියෝජ්‍ය මූල්‍යාධිකාරී	රාජ්‍ය නිලධාරීන් සඳහා SLPSAS පිළිබඳ පුහුණු වැඩසටහන	2023 මාර්තු 02, 03,16, 17
ආර්.කේ.එච්.ඒ. ජයවීර මිය	සහකාර ලේඛකාධිකාරී	පරිපාලන හා මූල්‍ය නිලධාරීන් සඳහා බඳවා ගැනීමේ පුහුණු වැඩසටහන - 2023.	දින 10
ඒ.ඒ ජයසෝම මිය.	මාණ්ඩලික තාක්ෂණික නිලධාරී	“UWU Techno Camp-2023” නේවාසික වැඩමුළුව	February 2023 පෙබරවාරි 20 - 26

සෞඛ්‍ය රක්ෂණය

IBMBB හි සේවකයින් සඳහා 2023 දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිපත්තියක් මිලදී ගන්නා ලදී. ආයතනයේ කළමනාකාරීත්ව මණ්ඩලය විසින් ආයතනය විසින් දරනු ලබන මුළු රක්ෂණ මුදලින් 50% ක් සුබසාධන පදනමක් මත මිලදී ගැනීමට අනුමත කරන ලදී. IBMBB හි සේවකයින් 12 දෙනෙකු සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් 25 දෙනෙකු සෞඛ්‍ය රක්ෂණ ප්‍රතිපත්තියට ඇතුළත් කර ඇත. 2023 දී ආයතනයේ උත්පන්න අරමුදල්වලින් රු. 130,416.78 ක මුලු මුදලක් මේ සඳහා දරන ලදී.

වාර්ෂික පර්යේෂණ සැසි සම්මේලනය - 2023

IBMBB හි 12 වන වාර්ෂික විද්‍යාත්මක සැසිවාරය 2023 මැයි 31 වන දින IBMBB සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. IBMBB හි විද්‍යාපති සහ ආචාර්ය උපාධි පර්යේෂණයන්හි නිරත විද්‍යාර්ථීන් මෙන්ම වෙනත් බොහෝ දේශීය විශ්ව විද්‍යාලවල පර්යේෂකයන් විසින් වාචික සහ පෝස්ටර් ඉදිරිපත් කිරීම් ලෙස ඉදිරිපත් කරන ලද සාරාංශ 40 ක් මෙම වසරේ සැසිවාරයේදී වාර්තා වී ඇත. සම්ප්‍රදායට අනුව මෙදින සමාරම්භක උත්සවයේදී මහාචාර්ය ස්ටැන්ලි විජේසුන්දර අනුස්මරණ දේශනය පැවැත්විණි. අනුස්මරණ දේශනය කැලණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ආමාශ ආන්ත්‍ර විද්‍යාව සහ හෙපටෝබිලියරි සැත්කම් පිළිබඳ මහාචාර්ය රෝහණ සිරිවර්ධන මහතා විසින් පවත්වන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ උපකුලපති ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එච්. ඩී. කරුණාරත්න මහතා ද සමාරම්භක අවස්ථාවට සහභාගී විය.





විවෘත දිනය

මෙමගින් සහභාගිවූවන් 100 කට අධික පිරිසකට IBMBB හි ජෛව තාක්ෂණය සහ අණුක ජීව විද්‍යාව පිළිබඳ ලෝකය දැකීමට මංපෙත් පාදන ලදී. විවෘත දිනයට පහත සඳහන් අංග ඇතුළත් විය.

රසායනාගාර චාරිකා: සහභාගිවූවෝ අති නවීන රසායනාගාරවල සිදු කෙරෙන පෙරළිකාර පර්යේෂණ සියැසින් දුටුවහ
.
ආකර්ශනීය සංවාද: පර්යේෂකයන් සහ අධ්‍යාපනඥයින් විසින් ජෛව තාක්ෂණයේ සහ අණුක ජීව විද්‍යාවේ ගනික ක්ෂේත්‍ර පිළිබඳව සාකච්ඡා කරන ලදී.

අධ්‍යයන මාර්ග: අධ්‍යයන වැඩසටහන් සහ කෙටි පාඨමාලා පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලද අතර, මෙම ක්ෂේත්‍රවල වෘත්තීන් සඳහා විභව සහභාගිවන්නන්ට මග පෙන්වීම සිදු විය.

වෘත්තීය අවස්ථා: සහභාගිවූවෝ විවිධ වෘත්තීය අපේක්ෂාවන් ගවේෂණය කළ අතර ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සමඟ ජාලගත වූහ.කැපවූ කාර්ය මණ්ඩලය සහ ආකර්ශනීය හා තොරතුරු සහිත අත්දැකීමක් නිර්මාණය කිරීමට ඔවුන් දැරූ උත්සාහය මෙම උත්සවයේ සාර්ථකත්වය සඳහා හේතු විය. මීට අමතරව, ක්ෂණික ප්‍රශ්න විචාරාත්මක තරහයක් සහ ආහාර කුටියක් සහභාගිවූවන්ගේ සමස්ත අත්දැකීම වැඩි දියුණු කළේය. මෙම විවෘත දිනය ඉගෙනුම්, පර්යේෂණ සහ ප්‍රජා සහභාගීත්වයේ පරිසරයක් පෝෂණය කිරීම සඳහා IBMBB හි කැපවීම ප්‍රදර්ශනය කළේය.





මූල්‍යමය බාධා

2023 ක්‍රියාකාරී සැලැස්මේ සහ 2023-2026 ආයතනික/ උපායමාර්ගික සහ කළමනාකරණ සැලැස්මේ දක්වා ඇති ක්‍රියාකාරකම් ක්‍රියාවට නැංවීම සඳහා 2023 දී මූල්‍ය සම්පත් ප්‍රධාන බාධාවක් විය. ආයතනය විසින් රුපියල් මිලියන 36.85 ක ප්‍රාග්ධන වියදමක් ඇස්තමේන්තු කර තිබිණි. ප්‍රාග්ධන ප්‍රදානය සඳහා මහා භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබුණු නිසා, සිය උත්පන්න අරමුදල්වලින් රු. මිලියන 4.518 ක් ප්‍රාග්ධන ආයෝජන ලෙස වැය කිරීමට ආයතනයට සිදුවිය.

එබැවින් 2023 වර්ෂය තුළ ප්‍රාග්ධනය, පර්යේෂණ සහ සංවර්ධනය සම්බන්ධ සැලසුම් සහගත ක්‍රියාකාරකම් සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස අඩු වී ඇත.

2024 වසර සඳහා වන වැඩ සැලැස්ම

ඉගෙනුම

- බාහිර උපාධි අපේක්ෂක වැඩසටහන ආරම්භ කිරීම
- ඖෂධ ෛජව රසායනය පිළිබඳ නව පශ්චාත් උපාධි වැඩසටහනක් ආරම්භ කිරීම
- දැනට පවතින දර්ශනපති / දර්ශනසූරී වැඩසටහන් අඛණ්ඩව පවත්වා ගැනීම/ශක්තිමත් කිරීම
- නව කෙටි පාඨමාලා සැලසුම් කිරීම
- පවතින කෙටි පාඨමාලා ශක්තිමත් කිරීම
- ඉගැන්වීම, ඉගෙනීම සහ ඇගයීම් පිළිබඳ ද්විවාර්ෂික ශිෂ්‍ය ප්‍රතිපෝෂණය ශක්තිමත් කිරීම
- ශිෂ්‍ය උපදේශන වැඩසටහන ශක්තිමත් කිරීම
- පීඨයේ විස්තීර්ණ සම්පත් සංචිතයක් ස්ථාපිත කිරීම සහ නඩත්තු කිරීම
- ඉගැන්වීමේ ඉගෙනුම් ඇගයීම් ඉගෙනුම් ප්‍රතිඵල සමඟ පෙළගැස්වීම
- නවීන ඉගැන්වීම් / ඉගෙනුම් ක්‍රම ශක්තිමත් කිරීම
- නව ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගැන්වීම් ඉගෙනුම් ක්‍රියාකාරකම් හඳුන්වාදීම/ අඛණ්ඩව පවත්වා ගැනීම (උදා: Coursera, PBL, SDL)
- කර්මාන්ත සමඟ සහයෝගීතාවයෙන් ශිෂ්‍ය සීමාවාසික පුහුණුව/කාර්මික පුහුණුව හඳුන්වා දීම

පර්යේෂණ

- ජාතික වශයෙන් අදාළ ප්‍රධාන පර්යේෂණ තේමා තුනක් යටතේ පර්යේෂණ ශක්තිමත් කිරීම
- පර්යේෂණ ක්‍රියාකාරකම්වල කාලානුරූප ප්‍රගතිය සමාලෝචනය කිරීමට සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම
- කර්මාන්තය සමඟ පවතින සහයෝගීතා පැවරුම් නව ස්ථාපිත කිරීම සහ ශක්තිමත් කිරීම
- පර්යේෂණ ආයතන/පෞද්ගලික අංශයේ ආයතන සමඟ අවබෝධතා ගිවිසුම් ඇතිකර ගැනීම
- සම්පූර්ණ පේටන්ට් අයදුම්පත් සහ හෙළිදරව් නොකිරීමේ ගිවිසුම්
- පර්යේෂණ සොයාගැනීම් වාණිජකරණය කිරීම
- සෞඛ්‍ය අංශය සමඟ සහයෝගීතා පර්යේෂණ වැඩසටහන් ශක්තිමත් කිරීම
- ආචාර්ය උපාධි වැඩසටහන් වල විෂය පථය පුළුල් කිරීම
- දර්ශනපති / දර්ශනසූරී වැඩසටහන් සඳහා නව ඇතුළත් කිරීම්, අණුක ජීව විද්‍යාවන්හි යෙදීම් පිළිබඳ වෘත්තිකයන්/තාක්ෂණ ශිල්පීන් පුහුණු කිරීම
- පර්යේෂණ වැඩසටහන් හරහා නව දැනුම උත්පාදනය කිරීම
- ආචාර්ය මණ්ඩල සාමාජිකයින්/ සහකාරකයින් ජාතික/ජාත්‍යන්තර තරහකාරී පර්යේෂණ ප්‍රදාන ලබා ගැනීමට දිරිමත් කිරීම සහ ඊට සහාය වීම
- අනෙකුත් පීඨ/විශ්වවිද්‍යාල සහ පෞද්ගලික අංශයේ අධ්‍යාපන ආයතන සමඟ සහයෝගීතාව ශක්තිමත් කිරීම
- දැනුම / පර්යේෂණ සොයාගැනීම් බෙදා හැරීම

සේවා

- කර්මාන්ත/පෞද්ගලික අංශය සමඟ සහයෝගීතාව වර්ධනය කිරීම
- අදාළ සමාජ කොටස් ඉලක්ක කර ගනිමින් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
- ජීව විද්‍යාව/තාක්ෂණ විෂය ධාරාවෙන් පසුවන උසස් පෙළ සිසුන් ඉලක්ක කරගනිමින් ඉගැන්වීම් සහ ඉගෙනුම් ක්‍රියාකාරකම් පොහොසත් කිරීම
- වාර්ෂික ලේ දන්දීමේ කඳවුරක් සංවිධානය කිරීම
- අපේක්ෂා රෝහලේ සිදුකරන වාර්ෂික උත්සවය
- සම්පත් සීමිත උසස් පෙළ සිසුන් ඉලක්ක කර ගනිමින් වාර්ෂික පාසල් වැඩසටහන පැවැත්වීම
- ජීව විද්‍යාත්මක දත්ත සමුදායේ දර්පණ නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම
- ජෛවතොරතුරුවේදය පදනම් වූ ඉගෙනීම/පර්යේෂණ සඳහා මාර්ගගත මෙවලම් සැපයීම
- අණුක ජීව විද්‍යා ක්ෂේත්‍රයේ ගමන් මග පිළිබඳ ලේඛනාගාර ගබඩාවක් පිහිටුවීම
- පිළිකා, වෙනත් රෝග සහ වැවිලි අංශය සඳහා රෝග විනිශ්චය සේවා
- උපදේශන
- ගාස්තු අයකරන පශ්චාත් උපාධි සහ අනෙකුත් පුහුණු වැඩසටහන්
- අණුක ජීව විද්‍යාව, ප්‍රතිශක්ති විද්‍යාව, ජෛව තොරතුරු විද්‍යාව සහ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල යෙදීම් සම්බන්ධයෙන් වෘත්තිකයන් සහ තාක්ෂණවේදීන් පුහුණු කිරීම

ජාත්‍යන්තර ප්‍රමිතීන් පවත්වාගෙන යාම

- විදේශයන්හි විශ්ව විද්‍යාල සහ පර්යේෂණ ආයතන සමඟ පවත්නා/ නව සහයෝගිතා වැඩිදියුණු කිරීම
- ජාතික හා කලාපීය වශයෙන් අණුක ජීව විද්‍යාව, ප්‍රතිශක්ති විද්‍යාව, ජෛව තොරතුරු හා අනුබද්ධ ක්ෂේත්‍ර පිළිබඳ පුහුණුව ලබා දීම.
- වර්තමාන සහ අනාගත ඉල්ලීම්වලට විසඳුම් ලබා දෙමින් නව රසායනාගාර ස්ථාපිත ප්‍රතිපත්තියක් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
- තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අත්පත් කර ගැනීම සහ වැඩිදියුණු කිරීම
- ජෛව තොරතුරු විද්‍යාවේ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය ගුරුවරුන් සහ විද්‍යුත් සම්පත් සඳහා ජාත්‍යන්තර විශිෂ්ටතා මධ්‍යස්ථාන සමඟ සම්බන්ධතා ඇති කිරීම
- බාහිර සමාලෝචන පද්ධතියක් ස්ථාපිත කිරීම
- විද්‍යාත්මක සහ ජෛව වෛද්‍ය පර්යේෂණවල සදාචාරාත්මක භාවිතයන්
- ජාන පර්යේෂණ සහ ජානමය තොරතුරු වල සදාචාරාත්මක, සමාජීය සහ නීතිමය ඇඟවුම්
- ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණයක් පැවැත්වීම
- IBMBB හි සිදු කරන ලද පර්යේෂණ ඉදිරිපත් කිරීම සඳහා ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට සහභාගී වීමට ආචාර්යවරුන් හා සිසුන් දිරිමත් කිරීම / සහාය වීම

පාලනය

- පුහුණු ප්‍රතිපත්තියක් සහ මාර්ගෝපදේශ සකස් කිරීම
- කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා ආචාර ධර්ම පද්ධතිය
- ගිණුම්කරණ සහ විගණන ප්‍රමිතීන්හි පිළිගත් සම්මතයන්ට අනුකූල වීම
- කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා නීතිපතා පුහුණුව ලබා දීම
- යහපාලනය සඳහා වූ පරිවයන් ආරක්ෂා කිරීම සඳහා ඵලදායී කළමනාකරණ ව්‍යුහයක් ශක්තිමත් කිරීම සහ පවත්වාගෙන යාම.

තිරසාර සංවර්ධනය මත පදනම්ව පරිසරය සුරැකීමට සහ පරිසරයට සිදුවන අහිතකර බලපෑම් අවම කිරීමට ක්‍රියාකාරකම් පිළිබඳ අනාගත ප්‍රක්ෂේපන වාර්තාව

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද සහ ජෛවතාක්ෂණ ආයතනය (IBMBB) යනු ජෛවරසායන විද්‍යාව, අණුක ජෛවවේදය, ජෛව තාක්ෂණය, ප්‍රතිශක්තිවේදය, ජෛවතොරතුරුවේදය සහ වෙනත් සම්බන්ධිත විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ පුහුණුව, පර්යේෂණ හා සංවර්ධනය සහ උපදේශනය සැපයීමේ අදහසින් පිහිටුවන ලද ආයතනයකි. ජෛවරසායන, අණුක ජෛවවේද සහ ජෛවතාක්ෂණ ආයතනය එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධනයේ ඉලක්කයන් අතරින් සිව්වන ඉලක්කය වන ගුණාත්මක අධ්‍යාපනයට සෘජුවම දායක වන අතර පරිසර සුරක්ෂිතතාවය සහ අහිතකර පාරිසරික බලපෑම් අවම කිරීම සඳහාද ආයතනය සැලකිල්ල යොමු කර ඇත.

කඩදාසි භාවිතය අවම කිරීම

IBMBB කඩදාසි භාවිතය අවම කිරීම සඳහා කඩදාසිවල ලේඛනගත කරනු ලැබ ඇති දෑ ඩිජිටල්කරණය කිරීමේ ක්‍රියාවලියක යෙදී සිටී. දැනට**,** අන්තර්- අංශ වැඩ ප්‍රවාහය **MS Teams** මගින් සිදු කරනු ලබන අතර**,** ඉන් ප්‍රතිඵල වැඩි දියුණු කිරීම සහ කඩදාසි භාවිතය අඩු කිරීම සිදු කෙරේ. ස්වයං සේවා ද්වාරය **(SSP)** 2023 දී ක්‍රියාත්මක කරන ලද්දේ මාර්ගගත යෙදුම් පද්ධතිය සහ මාර්ගගත ගෙවීම් ද්වාරය කාර්ය මණ්ඩලයක්/ශිෂ්‍ය පිවිසුම් පද්ධතියක් සමඟ ඒකාබද්ධ කිරීමෙනි. පාඨමාලා අයදුම්පත් සහ ගෙවීම් මාර්ගගතව එස්එස්පී හරහා කරගෙන යාමට කටයුතු සැලසීම මගින් කඩදාසි භාවිතය අවම කිරීම සහ එදිනෙදා වැඩවල කාර්යක්ෂමතාව වැඩි කිරීම සිදු කෙරේ. **IBMBB** සඳහා ලේඛන කළමනාකරණ පද්ධතිය 2023 දී හඳුන්වා දීමට සැලසුම් කර ඇත. තවද**,** ආයතනය තුළ කඩදාසි සහ ටෝනර් භාවිතය අවම කිරීම සඳහා අභ්‍යන්තර හා බාහිර සන්නිවේදනවලදී විද්‍යුත් තැපෑල භාවිතා කරනු ලැබේ.

පොලිතින් මුක්ත කලාපය

ජෛවරසායන, අණුක ජෛවවේද සහ ජෛවතාක්ෂණ ආයතනය පොලිතීන් වලින් නිදහස් වූ කලාපයක පිහිටුවා ඇති අතර ඉදිරියටත් ආයතනය එය එසේ පවත්වාගැනීමට කටයුතු කර ඇත.

අපද්‍රව්‍ය කළමනාකරණ පද්ධතිය

කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛවරසායන, අණුක ජෛවවේද සහ ජෛවතාක්ෂණ ආයතනය තුළ පශ්චාත් උපාධි ඉගැන්වීමේ සහ පුහුණු කටයුතු සඳහා පිහිටුවනු ලැබූ නවීන විද්‍යාගාර ඇති අතර එම විද්‍යාගාර තුල මිනිස් ලේ සාම්පලයන් සහ සෛල භාවිතයෙන් සිදුකරන පර්යේෂණ වලදී අවශ්‍ය නිසි ආරක්ෂක ක්‍රමවේදයන් අනුගමනය කරනු ලැබේ. හානිදායක ජෛව අපද්‍රව්‍යයන් ඉවත දැමීම සහ පරිහරණය කිරීම සම්මත ආරක්ෂක ක්‍රමවේදයන්ට අනුකූලව සිදුකරගෙන යනු ලබයි. අනතුරුදායක රසායනික ද්‍රව්‍ය හා ප්‍රතික්‍රියාකාරක භාවිතයේදී හා බැහැර කිරීමේදී පාරිසරික අවදානම අවම කිරීමට අවශ්‍ය සියලු පියවර ගෙන ඇති අතර ඒවා ඉදිරි වර්ෂයේදීත් එම ආකාරයෙන්ම නිසි පරිදි ක්‍රියාත්මක කරනු ඇත.

හරිත කාර්යාල සැලසුම

IBMBB ගොඩනැගිල්ල සැලසුම් කිරීමේදී හරිත ගොඩනැඟිලි මූලධර්ම අනුගමනය කරන ලදී. ඒ අනුව කෘත්‍රිම ආලෝකකරණ අවශ්‍යතාවය අවම කරමින් ස්වභාවික ආලෝකය සහ වාතාශ්‍රය උපරිම වන පරිදි කාර්යාල අවකාශය නිර්මාණය කර ඇත.

බලශක්ති කාර්යක්ෂමතාව

පාරිසරික බලපෑම අවම කිරීම සඳහා බලශක්ති කාර්යක්ෂමතාව වැඩි ඉහල නැංවීම ඉතා වැදගත් වේ. IBMBB කවුළු අසල වැඩ මේස ස්ථානගත කිරීමෙන් සහ ගොඩනැගිල්ල ඇතුළත ලා පැහැති තීන්ත භාවිතයෙන් හැකි සෑම තැනකම ස්වභාවික ආලෝකය භාවිතා කරයි. කාර්යක්ෂම ආලෝක පද්ධතියකට සංක්‍රමණය වීමේ පියවරක් ලෙස බලශක්ති කාර්යක්ෂම LED බල්බවලින් අකාර්යක්ෂම තාපදීප්ත බල්බ ප්‍රතිස්ථාපනය කිරීමට අදහස් කෙරේ.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } HED/B/~~PGIM~~IBMBB/2023/FA/05 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2024 මැයි 16 දින

TO: DB

FNM 03/06/2024

I.B.M.B.B. UNIVERSITY OF COLOMBO - DIRECTOR'S OFFICE 03 JUN 2024

අධ්‍යක්ෂ,

ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

සහතික කරන ලද ගිණුම් සහ යටෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.පී.ඒ.ෆොන්සේකා
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත් :-
1. ලේකම් - අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම් - මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. HED/B/IBMBB/2023/FA/05

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 මැයි 16 දින

අධ්‍යක්ෂ,

ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය හා 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 1 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු**

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට

කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම් මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද් ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීති රීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ)	2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛයේ 4.2 වගන්තිය	ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන දර්ශන විශාරද උපාධිය/දර්ශන විශාරද දර්ශනපති උපාධිය (MPhil/PHD) සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොතිබුණි.
(ආ)	2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 03 (viii) වගන්තිය	ආයතනය විසින් සේවක සුභසාධන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කර තිබූ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන 2022 හා 2023 වර්ෂ තුළදී පිළිවෙළින් රු.128,840 ක් හා රු.127,922 ක් උත්පාදිත අරමුදලින් දරා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස. කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර හාවිතා කර නොමැති බව.

2.3 අනෙකුත් කරුණු

(අ) සංවර්ධන අරමුදල ඇතුළු වැය ශීර්ෂ 04 ක් සඳහා පාඨමාලා ආදායමෙන් මුදල් ප්‍රේෂණය කිරීමේදී සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ පුහුණු පාඨමාලා 08 ක සත්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස අරමුදල් ප්‍රේෂණය කිරීම වෙනුවට අයවැයගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රේෂණය කර තිබීම හේතුවෙන් රු. 894,616 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි.

(ආ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව තාවකාලික විද්‍යාත්මක සහකාර (කොන්ත්‍රාත් පදනම් මත) තනතුරු 2 ක් පමණක් අනුමත වී තිබියදී එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම් මත අතිරික්ත නිලධාරීන් 04 දෙනෙක් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.3,628,644 ක් උත්පාදිත අරමුදලින් වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) 2023 පෙබරවාරි මාසයේදී ආයතනයෙන් ඉවත් වී තිබූ රියදුරෙකුගෙන් අය විය යුතු රු.212,497 ක් වූ ආපදා ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි.

ඩබ්ලිව්.පී.සි. වික්‍රමරත්න,
විගණකාධිපති.

විගණකාධිපති වාර්තාවට පිළිතුරු

ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනය, කොළඹ විශ්වවිද්‍යාලය
உயிர் இரசாயனவியல் மூலக்கூற்று உயிரியல் மற்றும் உயிர்த் தொழில்நுட்பவியல் நிறுவகம், கொழும்பு பல்கலைக்கழகம்
Institute of Biochemistry, Molecular Biology and Biotechnology, University of Colombo

90, කුමාරතුංග මුනිදාස මාවත,
කොළඹ 03, ශ්‍රී ලංකාව.
90, குமாரதுங்க முனிதாச மாவத்தை,
கொழும்பு 03, இலங்கை.
90, Cumaratunga Munidasa Mawatha,
Colombo 03, Sri Lanka.

www.ibmbb.cmb.ac.lk

2024.07.25

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72, පොල්දූව පාර,
බත්තරමුල්ල

මහත්මයාණෙනි,

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

උක්ත හිසින් ඔබ විසින් එවන ලද 2024 මැයි 16 දිනැති අංක එවරිඩි/ඛී/අයිබීඑම්බීබී/2023/එෆ්ඒ/05 හා සම්බන්ධවයි. එම යටෝක්ත වාර්තාවේ සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් අදාල තොරතුරු මේ සමඟ අමුණා එවමි.

ස්තුතියි

මහාචාර්ය ප්‍රසන්න ගල්හේන
අධ්‍යක්ෂ,
ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

පිටපත් :

1. ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය
3. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය

දූරකථනය
தொலைபேசி
Telephone
011 2552528
E-mail : info@ibmbb.cmb.ac.lk

Director :
Tel. : 011 2552534
Fax : 011 2552529
E-mail : director@ibmbb.cmb.ac.lk

Senior Assistant Registrar :
Tel. : 011 2553672
Fax : 011 2553683
E-mail : sar@ibmbb.cmb.ac.lk

Deputy Bursar :
Tel./Fax : 011 2553683
E-mail : db@ibmbb.cmb.ac.lk

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය හා 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2003 අංක 1 දරන ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු

කරන්නේ නම් හැර අබණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අබණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම් මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල විෂයය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම
(අ) ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන දර්ශන විශාරද උපාධිය/දර්ශන විශාරද දර්ශනපති උපාධිය (MPhil/PHD) සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොතිබුණි.	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පාඨමාලා සඳහා විධිමත් අනුමැතිය ලබා දීමේ ක්‍රියාපටිපාටිය ආරම්භ කිරීමට පෙර එනම් 2016 වර්ෂයට ප්‍රථම ආරම්භ කරන ලද පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ආවරණ අනුමැතියක් (Blanket approval) ලබා දීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කර ඇත. ඒ අනුව IBMBB ආයතනය විසින් පවත්වනු ලබන දර්ශනපති සහ දර්ශනසූරී පාඨමාලා සඳහා එම ආවරණ අනුමැතිය ලබා ගැනීම සඳහා අවශ්‍ය තොරතුරු හා ලේඛන මෙම ආයතනයේ අභ්‍යන්තර තත්ව සහතික ඒකකය විසින් 2023 නොවැම්බර් 11 දිනැතිව කොළඹ විශ්වවිද්‍යාලයේ තත්ව සහතික ඒකකය වෙත යොමු කරන ලද අතර කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර තත්ව සහතික ඒකකය විසින් එම තොරතුරු හා ලේඛන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කර ඇත.

(ආ) ආයතනය විසින් සේවක සුභසාධන ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක කර තිබූ සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන 2022 හා 2023 වර්ෂ තුළදී පිළිවෙළින් රු.128,840 ක් හා රු.127,922 ක් උත්පාදිත අරමුදලින් දරා තිබුණි.	1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ වගන්ති අංක 8 (d) අනුව, විශ්වවිද්‍යාල කොමිෂන් සභාවට සේවක දායකත්වය සහිතව සුභ සාධන යෝජනා ක්‍රමයන් ක්‍රියාත්මක කොට එහි වරප්‍රසාද සේවකයන්ට ලබාදීමේ හැකියාව ඇත. එම වගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1997.10.10 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 718 මඟින් කොමිෂන් සභාව යටතේ පවතින ආයතන වෙත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමටත්, 718 1 (b) වගන්තිය මඟින් එසේ ස්ථාපිත කරන රක්ෂණ ක්‍රමයේ වාරිකයෙන් 50% සේවකයාගෙන් අයකර ගැනීමටත් ඉතිරි 50% අදාළ ආයතනයේ උපයාගත් අරමුදලින් දැරීමටත් උපදෙස් ලබා දී ඇත. තව ද භාණ්ඩාගාර ලේකම් විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති වෙත යොමු කරන ලද 2004.04.30 දිනැති ලිපියේ (ඇමුණුම 02) තෙවන වගන්තිය අනුව විශ්ව විද්‍යාල විසින් උපයාගත් අරමුදල් සාමාන්‍ය නීතිරීති වලට අනුගත වෙමින් තම අභිමතය පරිදි විශ්ව විද්‍යාලවල මූල්‍ය කළමනාකරණය සඳහා යොදවා ගැනීමට අවසරය ලබා දී ඇත. ඉහත කී චක්‍ර ලේඛය සහ ලිපිය අනුව, 2018.12.13 දින පැවති 49 වැනි මූල්‍ය හා කළමණාකරණ කමිටුවේ නිර්දේශය මත 169 වැනි කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියෙන් අප ආයතනයේ සේවකයන් සඳහා සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කොට මේ දක්වා පවත්වාගෙන යනු ලැබේ.

2.2.3	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
2.2.4	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 අනෙකුත් කරුණු

නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම
(අ) සංවර්ධන අරමුදල ඇතුළු වැය ශීර්ෂ 04 ක් සඳහා පාඨමාලා ආදායමෙන් මුදල් ප්‍රේෂණය කිරීමේදී සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කර තිබූ පුහුණු පාඨමාලා 08 ක සත්‍ය ආදායමේ ප්‍රතිශතයක් ලෙස අරමුදල් ප්‍රේෂණය කිරීම වෙනුවට අයවැයගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස ප්‍රේෂණය කර තිබීම හේතුවෙන් රු. 894,616 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි.	පුහුණු පාඨමාලා ක්‍රියාත්මක කිරීමේදී ප්‍රථමයෙන්ම ඇස්තමේන්තුගත අයවැය ලේඛනයක් සකස් කොට මූල්‍ය හා කළමනාකරණ කමිටුවෙන් අනුමැතිය ලබාගනී. ඉන්පසු පුහුණු පාඨමාලාව අවසානයේ, කොමිෂන් සභා චක්‍රලේඛ 04/2016 ප්‍රකාරව ස්වයං මූල්‍යන ක්‍රියාකාරකම සම්පූර්ණ කිරීමෙන් පසු පිළියෙළ කරන සත්‍ය ආදායම් වියදම් සහිත මූල්‍ය ප්‍රකාශනය නැවතත් මූල්‍ය හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කොට අනුමැතිය ලබාගනී. එසේ අනුමත කරන ලද මූල්‍ය ප්‍රකාශ පදනම් කොටගෙන ආයතන සංවර්ධන, වැඩසටහන් සංවර්ධන, අධ්‍යක්ෂ වැය හා උපකරණ වැය යන වැය විෂයන් හතරට අදාළ ප්‍රේෂණය කිරීම් සිදු කොට ඇත.

(ආ) ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය අනුව තාවකාලික විද්‍යාත්මක සහකාර (කොන්ත්‍රාත් පදනම මත) තනතුරු 2 ක් පමණක් අනුමත වී තිබියදී එම තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත අතිරික්ත නිලධාරීන් 04 දෙනෙක් බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා වශයෙන් රු.3,628,644 ක් උත්පාදිත අරමුදලින් වැඩිපුර ගෙවා තිබුණි	ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලයට අනුව ස්ථිර විද්‍යාත්මක සහකාර තනතුරු 04ක් ද තාවකාලික විද්‍යාත්මක සහකාර (කොන්ත්‍රාත් පදනම මත) (on contract basis) තනතුරු 02ක් ද අනුමත අතර ඔවුන්ට භාණ්ඩාගාර අරමුදලින් ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. පැවරුම් පදනම මත තාවකාලික විද්‍යාත්මක සහකාර (Scientific Assistant – on assignment basis) 04 ක් බඳවා ගෙන ඇති අතර ඔවුන්ට උපාය ගත් ආදායමෙන් ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. මෙයින් ස්ථිර විද්‍යාත්මක සහකාර (ජෛවතොරතුරුවේදය- Bioinformatics) ලෙස සේවයේ නියුක්තව සිටි එක් කාර්යාල මණ්ඩල සාමාජිකයෙකු 2022.09.14 දින සිට සේවයෙන් ඉල්ලා අස්විය. අප ආයතනය ජෛව තොරතුරුවේද යන විෂය පථය තුළ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිදු කරන බැවින් ආයතනයේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු ඵලදායිව, නිසි වේලාවට පවත්වාගෙන යාම සඳහා තාවකාලික විද්‍යාත්මක සහකාර (කොන්ත්‍රාත් පදනම මත) එක් සේවකයෙකු බඳවා ගත් අතර ඔහුට භාණ්ඩාගාර අරමුදලින් ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. එලෙසම ආයතනය තුල අනුමත ස්ථිර අධ්‍යන කාර්ය මණ්ඩල සංඛ්‍යාව 11 කි.ඉන් ආචාර්යවරුන් ඉල්ලා අස්වීම සහ විශ්‍රාම ගැනීම නිසා 2023 වර්ෂයට අදාලව ආයතනය තුල සිටි ස්ථිර අධ්‍යන කාර්ය මණ්ඩල සංඛ්‍යාව 08 කි. ජෛවරසායන, අණුක ජෛවවේද හා ජෛවතාක්ෂණ ආයතනයෙහි පශ්චාත් උපාධි සහ දර්ශන විශාරද උපාධි පිරිනමන ආයතනයක් වන අතර අණුක ජෛවවිද්‍යා, සෛල හා අණුක ප්‍රතිශක්තිවේද හා ජෛව තොරතුරුවේද යන විෂය පථ තුන ඔස්සේ අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සිදු කරයි.

	මෙම අධ්‍යයන හා පර්යේෂණ කටයුතු ඵලදායිව, නිසි වේලාවට පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය කරුණකි. ආයතනය තුළ මෙම අධ්‍යයන අංශ තුනෙහි පවතින අධ්‍යයන හා පර්යේෂණ කටයුතු ධාරිතාව මත පදනම්ව උපාය ගත් ආදායමෙන් ගෙවීම් කටයුතු නිරීම සඳහා අනුමත තාවකාලික විද්‍යාත්මක සහකාර තනතුරු 02ට (කොන්ත්‍රාත් පදනම මත) අමතරව පැවරුම් පදනම මත තාවකාලික විද්‍යාත්මක සහකරුවන් (Scientific Assistant – on assignment basis) 04ක් බඳවා ගෙන ඇත.
(ඇ) 2023 පෙබරවාරි මාසයේදී ආයතනයෙන් ඉවත් වී තිබූ රියදුරෙකුගෙන් අය විය යුතු රු.212,497 ක් වූ ආපදා ණය ශේෂය සම්බන්ධව විමර්ශන අවසාන වන විටත් අයකරගෙන නොතිබුණි	L.C.S ලියනගේ මහතා 17.02.2023 දින සිට IBMBB ආයතනයේ රියදුරු ලෙස සේවය කල අතර 17.02.2023 දින අධ්‍යාපන අමාත්‍යාංශය මාසයක කාලයක් සඳහා අනුමත කරන ලද විදේශ නිවාඩු ලබාගෙන මාසයක පමණ කාලයක් විදේශ ගත විය.ඔහු එහි සිට ඉල්ලා අස්වීමේ ලිපිය යොමු කළ අතර ඔහුගේ විදේශ නිවාඩු නිමාවී නැවත සේවයට නොපැමිණීම පිළිබඳව විමර්ශනයක් කිරීම සඳහා විධිමත් විනය පරීක්ෂණයක් සිදු කිරීමට පාලක සභාව තීරණය කර ඇත.එබැවින් L.C.S ලියනගේ මහතාගේ ඉල්ලා අස්වීම පිළිබඳ අවසන් තීරණයක් තවමත් ලැබී නොමැති හෙයින් අපදා ණය අය කර ගැනීමක් සිදු නොවුණි. එකී අවසන් තීරණය ලද වහාම ලියනගේ මහතාගේ අපදා ණය ශේෂය අය කර ගැනීමට කටයුතු කරන බව දන්වමි.

මහාචාර්ය පුෂ්පා ගල්හේන
අධ්‍යක්ෂ,
ජෛවරසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ සමාලෝචනය

හැඳින්වීම

විගණන කමිටුව ශ්‍රී ලංකා කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායනවේදය, අණුක ජීව විද්‍යාව සහ ජෛව තාක්ෂණ ආයතනයේ ප්‍රධාන කාරක සභාවකි. මෙම ත්‍රිපුද්ගල කමිටුව සෑම වසරකම කාර්තුමය වශයෙන් රැස්වන අතර විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද විගණන වාර්තා, විගණන විමසුම් සහ ආයතනයේ මූල්‍ය, පරිපාලන, මානව වත්කම් සහ අධ්‍යයන කටයුතු ගැන සාකච්ඡා කරයි. එහි සාමාජිකත්වය, නිල කාලය, වගකීම්, බලතල සහ නිලවරණ ක්‍රියා පටිපාටි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ කළමනාකරණ මණ්ඩලය හරහා ශ්‍රී ලංකා භාණ්ඩාගාරය මගින් පාලනය වේ.

විගණන කමිටුවේ සංයුතිය – 2023 වර්ෂය

සාමාජිකයන් / නිරීක්ෂකයන්	තනතුර
සාමාජිකයින්	
මහාචාර්ය රමණි විජේසේකර	සභාපති
චන්න ද සිල්වා මහතා	සාමාජික
මහාචාර්ය සම්පත් පුංචිහේවා	සාමාජික
කේ.පිරතීපන් මහතා	භාණ්ඩාගාර නියෝජිත
කැඳවුම්කරු	
කේ.ඊ.ඩබ්ලිව්. ජයසිරි	ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණක /UOC
නිරීක්ෂකයින්	
එස්.එම්.සී. ඉන්දිකා මිය	විගණන අධිකාරී / රාජ්‍ය ගිණුම් අංශය- UOC
ආරාධනා ලත්	
මහාචාර්ය බී.පී.ගල්හේන	අධ්‍යක්ෂ / IBMBB
එස් එම් විතාන ආරච්චි මිය	නි. මූල්‍යාධිකාරී /IBMBB
කේ ජී අයි උදයංගනී මිය	ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී /IBMBB

රැස්වීම්

රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක PED/31 අනුව, කමිටුව වසරකට අවම වශයෙන් **සිව්** වතාවක් රැස්විය යුතුය. සමාලෝචිත වර්ෂය තුළ කාරක සභාව සිව් වතාවක් රැස්වී ඇත.

අභ්‍යන්තර විගණනය

ජෛව රසායනවේදය, අණුක ජෛවවේදය සහ ජෛව තාක්ෂණවේද ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් සිදු කර ඇත. 2023 විගණන සැලැස්මට ඇතුළත් කර ඇති පරිදි අභ්‍යන්තර විගණකවරුන් විසින් පශ්චාත්, පූර්ව සහ අනෙකුත් විගණන කටයුතු සිදු කර ඇත.

වර්ෂයේ අභ්‍යන්තර විගණන කාර්යය පිළිබඳ සභාපති/ විගණන කමිටුවේ සමාලෝචනය – 2023

කමිටු සාමාජිකයින්ගේ සක්‍රීය සහභාගීත්වය සහ ආයතනයේ යහපාලනය සඳහා ඔවුන්ගේ කැපවීම පිළිබඳව විගණන කමිටුව සෑහීමකට පත් විය. අභ්‍යන්තර විගණන අංශයේ අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳව කමිටුව සෑහීමකට පත් විය. කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ සම්බන්ධයෙන් ගෙන ඇති පසු විපරම් ක්‍රියාමාර්ග සහ ලබා ඇති ප්‍රගතිය පිළිබඳව කමිටුව සෑහීමකට පත්වන අතරම, යහපාලනය, විනිවිදභාවය, නිසි මූල්‍ය, පරිපාලන සහ අධ්‍යයන කාර්ය සාධනය ක්‍රියාත්මක කිරීම පිළිබඳව දිගින් දිගටම අවධාරණය කරයි.

මහාචාර්ය රමණි විජේසේකර
සභාපති / විගණන කමිටුව, IBMBB

STATEMENT OF FINANCIAL POSITION AS AT 31ST DECEMBER 2023

(Figures adjusted to the Nearest Rupee)

	Note	2023 Rs.	2022 Restated Rs.	% Change
ASSETS				
CURRENT ASSETS				
Cash & Cash Equivalents	Note - 01	18,717,782	16,411,439	14
Other Receivables	Note - 02	4,195,795	5,505,426	(24)
Advances	Note - 03	203,948	3,197,599	(94)
Staff Loans - Within one year	Note - 04	716,372	727,511	(2)
Investments - Mature within one year	Note - 05	41,491,391	22,315,941	86
Chemicals & Glassware		796,988	869,060	(8)
		66,122,276	**49,026,977**	**35**
NON-CURRENT ASSETS				
Property, Plant & Equipment	Note - 06			
Building		17,545,696	23,388,928	(25)
Motor Vehicles		4,960,679	1,546,499	-
Library Books & Periodicals		1,224,193	175,216	599
Lab & Teaching Equipment		17,257,714	9,636,041	79
Computers		5,969,835	4,395,381	36
Office Furniture & Equipment		12,967,634	10,950,813	18
Intangible Assets - Computer Software	Note - 06.1	600,000	-	-
Staff Loans - More than one year	Note - 04	1,963,082	2,606,978	(25)
Investments - Mature after one year	Note - 05	49,940,988	66,716,482	(25)
		112,429,820	**119,416,338**	**(6)**
TOTAL ASSETS		**178,552,096**	**168,443,315**	**6**
EQUITY & LIABILITIES				
CURRENT LIABILITIES				
Refundable Tender Deposit		41,602	41,602	-
Refundable Laboratory Deposits		8,588,635	7,272,635	18
Accrued Expenses & Other Payables	Note - 07	5,518,660	4,319,893	28
		14,148,897	**11,634,130**	**22**
NON CURRENT LIABILITIES				
Provision for Gratuity	Note - 08	30,950,473	28,317,795	9
Provision for Audit Fees		475,700	1,578,517	(70)
Research Grants	Note - 09	3,542,726	5,599,976	(37)
Deferred Income	Note - 10	5,219,328	4,568,682	14
		40,188,227	**40,064,969**	**-**
TOTAL LIABILITIES		**54,337,124**	**51,699,100**	**5**
NET ASSETS/EQUITY		**124,214,972**	**116,744,214**	**6**

STATEMENT OF FINANCIAL POSITION AS AT 31ST DECEMBER 2023 (Contd..)

(Figures adjusted to the Nearest Rupee)

	Note	2023 Rs.	2022 Restated Rs.	% Change
ACCUMULATED FUNDS & RESERVES				
Accumulated Funds - Capital	Note - 19	30,213,727	38,932,716	(22)
Accumulated Funds - Recurrent		14,418,490	30,146,098	(52)
Revaluation Surplus/(Deficit)		29,539,809	10,665,445	177
		74,172,026	**79,744,258**	**(7)**
DESIGNATED FUNDS	Note - 20			
Institute Development Fund		20,965,241	14,631,203	43
Director's Vote		2,806,200	1,786,724	57
Equipment & Technology Vote		2,373,089	1,321,113	80
Programme Development Vote		5,465,514	2,592,364	111
		31,610,044	**20,331,405**	**55**
RESTRICTED FUNDS				
Endowment Fund		5,737,662	4,003,310	43
Cancer Research Endowment Fund		30,000	-	-
Asset Replacement Funds		12,665,241	12,665,241	-
		18,432,903	**16,668,551**	**11**
		124,214,972	**116,744,214**	**6**

Prepared & Certified by
26.02.2024

Deputy Bursar

Senior Asst. Registrar

The Accounting policies on pages 6 to 15 and other notes on pages 16 to 22 form an integral part of these Financial Statements. The Board of Management is responsible for the preparation and presentation of these Financial Statements.

The Financial Statements have been prepared and presented in compliance with the Sri Lanka Public Sector Accounting Standards (SLPSAS) issued by the Institute of Charted Accountants of Sri Lanka.

Board Member

Director /Board Member

STATEMENT OF FINANCIAL PERFORMANCE
FOR THE YEAR ENDED 31ST DECEMBER 2023

	Note	2023	2022 Restated	% Change
REVENUE		**Rs.**	**Rs.**	
Revenue from Non- Exchange Transactions - Current				
Govt. Grant for Recurrent- Expenditure		73,000,000	115,830,000	(37)
Grant for Research	Note - 11	2,178,600	1,302,333	67
Total Revenue from Non Exchange Transaction - Current		**75,178,600**	**117,132,333**	**(36)**
Revenue from Exchange Transaction - Current				
Generated Income	Note - 12	44,002,198	36,455,916	21
Interest Income		19,075,713	12,593,302	51
Other Income	Note - 13	372,269	525,049	(29)
Exchange Gain		-	897,615	(100)
Total Revenue from Exchange Transaction - Current		**63,450,181**	**50,471,882**	**26**
Total Revenue Current		**138,628,781**	**167,604,215**	**(17)**
Revenue from Non- Exchange Transactions - Capital				
Govt Grant for Capital Expenditure		-	4,443,000	(100)
Capital Transfer - Generated Income		4,517,609	-	-
Gifts, Donations, Goods In-kind		1,043,884	-	-
Total Revenue from Non Exchange Transaction - Capital		**5,561,493**	**4,443,000**	**25**
Revenue from Exchange Transaction - Capital		-	-	-
Total Revenue from Exchange Transaction - Capital		-	-	-
Total Revenue Capital		**5,561,493**	**4,443,000**	**25**
